الدروس اليومية ـ سنهالي

# දෛනික විෂයයන්




جمعية الدعوة بالزلفي

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ ـ فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

94

# දෛනික විෂයයන්

## الدروس اليومية – اللغة السنهالية

جمعية الدعوة والإرشاد وتوعية الجاليات في الزلفي
Tel: 966 164234466 - Fax: 966 164234477

# الدروس اليومية

**أعده وترجمه للغة السنهالية:**

**جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي**

**الطبعة الثانية: ٩/١٤٤٢ هـ.**

**ⓗ شعبة توعية الجاليات بالزلفي، ١٤٢٤هـ**

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

الدروس اليومية – الزلفي ، ١٤٢٤ هـ

١٦٤ ص؛ ١٢ × ١٧ سم

ردمك : ٠-١٧-٨٦٤-٩٩٦٠

(النص باللغة السنهالية )

١– الإسلام – مبادئ عامة أ. العنوان

ديوي ٢١١ ١٤٢٤/٣٨٨

رقم الإيداع : ١٤٢٤/٣٨٨

ردمك : ٠-١٧-٨٦٤-٩٩٦٠

# දෛනික විෂයයන්

## الدروس اليومية

## 1-කාලය ගැන සුපරීක්ෂාකාරී වීම

▶▶'භාග්‍යයන් දෙකක් ගැන අධික මිනිසුන් නොසැළකිලි මත්ව සිටිති. ඒවා නීරෝගීභාවය හා විවේකයවේ' යනු වෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'අල්ලාහ්ගේ දූත මුහම්මදු (සල්) තුමා රමදාන් මාසයේ අවසන් දින දහය පැමිණවිට රාත්‍රි කාලයෙහි අවදිව සිට උනන්දුවෙන් හා නිර්භීතභාවයෙන් (නැමදුමෙහි යෙද මින්) එම රාත්‍රින් යහකම් මගින් ප්‍රාණවත් කරන්නේය. එසේම තම පවුල් ඥාතීන්ද අවදි කරන්නේය' යනුවෙන් ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'විනිශ්ච දිනයෙහි මිනිසාගෙන් තම ජීවිතය කෙසේ ගත කළේද ?, තම තරුණ විය කෙසේ ගත කළේද ?, තම සම්පත් කෙසේ උපයා ගත්තේද ?, එය කෙසේ වියදම් කළේද ?, තම දැනුම් ඥානයෙන් කුමන ක්‍රියාවන් ඉටු කළේද ? යන කරුණු පහක් ගැන ප්‍රශ්න කරන තෙක් ඔහුගේ පාද තමාගේ ස්වාමියාගෙන් සිට ඉවත් නොවන් නේය' යැයි නබි නායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මදි)**

▶▶'කවරෙක් (මංකොල්ල කරුවන් කෙරෙහි) බියට පත්වන් නේද, ඔහු පෙර යාමෙහි ගමන ආරම්භ කරත්වා. කව රෙක් පෙර යාමෙහි ගමන ආරම්භ කරන්නේද, ඔහු සිය ඉලක්කය දකී. දැනගන්න. සැබැවින්ම අල්ලාහ්ගේ සම් පත වටිනාකම් සහිතකි. දැනගන්න. අල්ලාහ්ගේ සම්පත ස්වර්ගයෙකි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරයි. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-පලදායක මාර්ගයෙහි කාලය රැකගැනීම අනිවාර්යවේ.
2-මිනිසා තම කාලය ගැන පිළිතුරු දිය යුතුව ඇත.
3-අධික පිරිස් කාලය නිකරුනේ ගත කරති. ඒ පිළිබඳව ඔවුහු නොසැළකිල්ලෙන් සිටිති.

# 2-දාදු කැට පැළඳීම

▶▶'(මි : නබි, ඔවුන්ගෙන්) ඔබ විමසන්න. අල්ලාහ් හැර ඔබලා (ප්‍රාර්ථනාකර) අඬගසන දෙවිවරුන් ගැන ඔබලා කුමක් සිතන්නෙහුද ? අල්ලාහ් මට කිසියම් අයහපතක් කිරීමට අදහස් කළේනම් අල්ලාහ් හැර ඔබලා (ප්‍රාර්ථනා කර) අඬගසන අන් දෙවිවරුට එම අයහපත (මගෙන්) ඉවත් කළ හැකිද ? නොඑසේ නම්, අල්ලාහ් මට භාග්‍ය යක් පිරිනැමීමට අදහස් කළේ නම්, ඔහුගේ එම භාග්‍ය වළක්වාලීමට එම දෙවිවරුන්ට හැකිද ? (ඔවුන්ට) ඔබ පවසන්න. මට අල්ලාහ්ම ප්‍රමාණවත්වේ. ස්ථිර විශ්වාසීන් ඔහු කෙරෙහිම විශ්වාසය තබති' යැයි අල්ලාහ් පවසයි.

**(අල්කුර්ආන්-39:38)**

▶▶'කවරෙක් දාදුකැට පළඳින්නේද, ඔහුට අල්ලාහ් පරිපූර්ණ භාවය ලබා නොදෙයි' යනුවෙන්ද, වෙනත් වදනෙකහි 'කවරෙක් දාදුකැට පළඳින්නේද ඔහු (අල්ලාහ්ට) ආදේශ කළේය' යනුවෙන්ද නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව උක්බා බින් ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

▶▶'කවරෙක් කිසියම් දෙයක් එල්ලාගෙන සිටින්නේද, ඔහු (අල්ලාහ්ගේ උපකාරයෙන් තොරව) එයගේ මඟට වගකී මෙන් හරිනු ලැබේ' යැයි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් හකීම් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶'මැතිරීම, දාදුකැට පැළඳීම සහ (අඹු සැමි අතර ප්‍රේමය වැඩි කිරීමේ චේතනාවෙන් කරන) කොට්ට මන්ත්‍රය කිරීම යනාදීන් ෂිර්ක් (අල්ලාහ්ට ආදේශ) කිරීමකි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

## ප්‍රයෝජන

1- පුද්ගලයෙක් දාදු කැටයකට පල හා විපාක ඇති කිරීමේ ශක්තිය තිබේ යන චේතනාවෙන් එය පළඳින්නේ නම්, ඔහු මහා ෂිර්කයක් කළ අයෙකු සේ සැළකේ. මන්ද යත්, ඔහු අල්ලාහ් හැර අන් දෙයට මෙවන් ශක්ති ඇති බව විශ්වාස කළේය. නමුත්, ඔහු එය පල විපාක ලබා දීමට හේතුවක් වශයෙන් පමණක් පවතින බව විශ්වාස කළේනම්, ඔහු සුළු ෂිර්කයක් කළ අයෙකු සේ සළකනු ලැබේ.

2-දාදු කැටය තුල අන්තර්ගතව පවතින දේ අල්කුර්ආනය වුවද, එය නොපැළඳිය යුතුයි. මන්ද යත්, නබිතුමාගේ යහළුවන් මෙසේ නොකළහ. එසේම මෙය අල්කුර්ආනය නොමැති දෙය මගින්ද දාදු කැටය පැළඳීමට හේතුවක් වශයෙන් පැවැතීමට ඉඩ සැලසේ.

3-ඇස්වහ සඳහා වාහනයෙහි රෙදි කැබැල්ලක් හෝ මෙවන් දේ ඇල්ලීම හා අල්කුර්ආනය වාහනයතුල තබා ගැනීමද මෙයට සමානවේ.

# 3-ජ්‍යොතිෂ, ශාස්ත්‍රඥයන් හා දෛවඥයින් කරා යාම

▶▶'අල්ලාහ් හැර අහස් හා පොළෝ තලයෙහි සිටින කිසි වක් සැඟවුන දේ ගැන නොදන්නා බව (නබි) ඔබ පව සන්න' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-27:65)**

▶▶'කවරෙක් හෝ ජ්‍යොතිෂ වරයෙකු වෙත ගොස් කුමන කරුණක් හෝ ගැන විමසා සිටියේනම්, ඔහුගේ දින හත ලිහක සලාතයන් (නැමදුම්) පිළිගනු නොලැබේ' යනු වෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව සෆියියා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'කවරෙක් නිමිති බලන්නා හමුවට ගොස් ඔහු පවසන දේ සත්‍ය කළේ නම්, හෝ ඔසප්වී සිටින සිය බිරිඳ සමග සංසර්ගයේ යෙදුනේ නම්, හෝ සිය බිරිඳගේ ගුද මාර්ග යෙහි සංසර්ගයේ යෙදුනේනම් ඔහු

නබිනායක මුහම්මදු (සල්) තුමාට පහළවූ මාර්ගයෙන් පිටමන්වේ' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶ශාස්ත්‍රඥවරු ගැන මිනිසුන් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් විමසූවිට එතුමා 'එය කිසිවක් නොවේ' යනු වෙන් පැවැසීය. එවිට මිනිසුන් 'ඔවුහු කියන දේ සමහර අවස්ථාවල සත්‍ය වනවානේ ? යනුවෙන් විමසූ විට එතුමා 'ඒවාහි සත්‍යතාවය කුමක් නම්, ජින්වරුන් (අහසෙන්) හොරෙන් ඇහුම්කන් දී ඒවා තම සගයන්ගේ කන්වලට යොමු කරති. ඔවුහු ඒවා සමග තවත් සාවද්‍ය කරුණු සීයයක් පමණ එක්කර (ශාස්ත්‍රඥ වරුන්ගේ හමුවට) තබති' යැයි පැවැසූ බව ආයිෂා (රලි) වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ජ්‍යොතිෂ හා ර්තල විද නිමිති බලන්නන් හමුවට යාම තහනම් වේ. ඔවුන් තමන්හට සැඟවුන කරුණු පිළිබඳ දැනුම් ඥානයක් තිබෙන බව තර්ක කරති.
2-ඔවුන් එක සත්‍ය කරුණක් දැනගෙන ඒ සමග සාවද්‍ය කරුණු සීයයක් එක් කරති.
3-අත් රේඛා බැලීම, පිඟන්වල ලියා දියකර පානය කිරීම හා ලග්නය බැලීම යනාදීන් සියල්ල නිමිති හා තාරකා ශාස්ත්‍රයට ඇතුලත්වේ.

# 4-හූනියම් කිරීම

▶▶'ඔවුහු සුලෙයිමාන් (නබිතුමානන්)ගේ පාලන සමයෙහි (එතුමාට විරුද්ධව ෂෛතාන්වරුන් පාරායනා

කළ දේම අනුගමනය කළහ. එනමුත්, සුලෙයිමාන් කිසිසේත්ම ප්‍රතික්ෂේප කරන්නෙකු නොවීය. ප්‍රතික්ෂේප කරන්නන් ෂෙයිතාන් වරුන්ය. මිනිසුන් හට හූනියම් ඉගැන්වූයේ ඔවුන්මය.

එසේම, බාබිලෝනියාවෙහි විසූ හාරූත් හා මාරූත් යන මලක්වරුන් දෙදෙනාට පහළකල දේද (ව්‍යාජ මාර්ග යෙන් ප්‍රායෝගික කිරීමට ඉගැන්වූහ) එනමුත්, ඔවුන් (මලක්වරුන්) දෙදෙනා 'නියතව, අපි සෝදිසි කරුවන් ලෙස සිටිමු. (මෙය ඉගෙන ගෙන) ඔබලා ප්‍රතික්ෂේප කරන කාෆිර් ලෙස පත් නොවන්න' යැයි පවසා අවවාද කරන තෙක් කවරෙකුට හෝ මෙම හූනියම ඉගැන්වූයේ නැත. එසේ වුවද, ඔවුන් අඹු සැමියන් වෙන්කිරීමේ කාර්ය ඔවුන්ගෙන් ඉගෙන ගත්හ. නමුදු, අල්ලාහ්ගේ අනුමැතියෙන් තොරව ඔවුන් කවරෙකුට හෝ කුමන අයහපතක් හෝ මෙමගින් සිදු කළ නොහැක.

තමන්ට අයහපත් ගෙනදෙන හා කිසිඳු පලක් නොදෙන දේ (පමණක්) ඔවුන් ඉගෙන ගත්හ. (හූනියම) මිළදී ගත් තැනැත්තන්ට අවසාන දිනයෙහි කිසිඳු භාග්‍යයක් නොලැබෙන බව ඔවුහූ පැහැදිළිව දැන සිටිති. ඔවුහූ සිය ආත්මාව විකුණා ලබාගත් දේ නපුරකි. මෙය ඔවුහූ දැනගත නොයුතුද ?' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-2:102)**

▶▶'හූනියම් කරන්නා කුමන තැනක ගියද, ඔහු කිසිසේත් ජයග්‍රහනය නොලබයි' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-20:69)**

▶▶'විනාශය ගෙනදෙන කරුණු හතකින් වැළකී සිටින්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ විට එතුමාගේ සහාබාවරුන් 'අල්ලාහ්ගේ දූතයාණෙනී, ඒවා කුමක්ද?' යනුවෙන් විමසූහ. එවිට එතුමා 'ඒවා අල්ලාහ්ට ආදේශ කිරීම, හූනියම් කිරීම, අල්ලාහ් ගරුකර ඇති ජීවිතයක් අයුක්ති සහගතව ඝාතනය කිරීම, පොළිය අනුභව කිරීම, අනාථයන්ගේ සම්පත් (සූරා) කෑම, යුද පිටියෙන් පලා යාම, හා විශ්වාසනීය පතිවුත් අහිංසක කාන්තාවන් නින්දා කිරීම යනාදීන්ය' යනුවෙන් පැවසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-හූනියම් කිරීම තහනම්ය. එය විනාශය කරා ගෙනයන පාපයකි.
2- එය ඉස්ලාමයෙන් පිටමන් කරන කරුණුවලින් එකකි. මන්දයත්, අල්ලාහ් 'අපි නියතව සෝදිසියක් ලෙස සිටිමු. (මෙය ඉගෙනගෙන) ඔබලා ප්‍රතික්ෂේප කරන කාෆිර් ලෙසට පත් නොවන්න' යනුවෙන් පවසන්නේය. මෙය ෂෙයිතාන්ට කරන වන්දනාමානයකි.
3-හූනියම්කරු වෙත හමුවට හා ඔවුන් සමග කථා බහක යෙදීම තහනම්ය.

# 5-මැතිරීම

▶▶'අල්ලාහ් හැර අන් දේ මගින් මැතිරීම, දාදුකැට පැළඳීම, (අඹු සැමියන් අතර ප්‍රේමය වැඩි කිරීමේ චේතනාවෙන් කරන) කොට්ට මන්ත්‍රය මැතිරීම යනාදි

ෂිර්ක් හෙවත් අල්ලාහ්ට ආදේශ කිරීමකි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අහ්මද් හා අබූදාවූද්)**

▶▶'විෂ සතුන් දෂ්ට කළ තුවාලය කෙරෙහි (අල්කුර්ආන් වැකි කියවා) මැතිරීම සඳහා මුහම්මදු (සල්) තුමා අනු මත කළේය' යැයි ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා අවසන් අවස්ථාවෙහි රෝගාතුරුව සිටි කළ අල්මුඅව්විදාත් යනුවෙන් හඳුන්වන (සූරා අල් ඉඛ්ලාස්, සූරා අල් ෆලක් හා සූරා අන්නාස් යන) පරිච්ඡේදයන් පාරායනය කොට සිය ශරීරයට පිඹ ගත්තේය. එතුමාට රෝගය අධිකවූ විට ඒවා මම පාරා යනය කොට පිඹුවෙමි. එසේම, එතුමාගේ භාග්‍යමත් අතින් එතුමාව මා පිරිමැදුවෙමි' යනුවෙන් ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'නබිනායක තුමා තමාගේ සමහර බිරිඳන්හට (ආරක්ෂා පැතීමේ) ප්‍රාර්ථනා කර සිය අතින් පිරිමදින බවත්, එහි 'අල්ලාහුම්ම රබ්බන් නාස්, අද්හිබිල් බඃස්, ඉෂ්ෆිහ් ව අන්තෂ්ෂාෆී ලාෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක ෂිෆාඅන් ලායුගාදරු සකමා' යනුවෙන් ප්‍රාර්ථනා කරන බවත් ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : බුහාරි)**

[اَللَّهُمَّ رَبَّ النَّاسِ أَذْهَبِ الْبَأْسَ اِشْفِ أَنْتَ الشَّافِيْ لاَشِفَاءَ إِلاَّ شِفَاؤُكَ

شِفَاءً لاَ يُغَادِرُ سَقَمًا]

**අර්ථය :**

*ඕ අල්ලාහ්, මිනිසුන්ගේ ස්වාමිනි, පීඩාවෙන් මුදා ඔහුට සනීපය ලබා දෙනු මැනවි, සනීපය ලබා දෙන්නේ ඔබ මය. ඔබගේ සනීපය හැර කිසියම් සනීපයක් නොමැත. කිසිදු රෝගයක් හෝ අත නොහැර සනීපය ලබා දෙනු මැනවි.*

## ප්‍රයෝජන

1-අල්කුර්ආන්හි හා නබි වදන්හි සඳහන් ප්‍රාර්ථනා මගින් පාරායනා කිරීම අනුමතය.
2-අල්කුර්ආන්හි හා නබිවදන්හි සඳහන් නොවන ප්‍රාර්ථනා මගින් මැතිරීම තහනම්ය.
3-අල්ලාහ් හැර අන් අය කැඳවන ප්‍රාර්ථනා මගින් මැතිරීම මහා ෂිර්කය හෙවත් ආදේශ කිරීමකි.
4-පුද්ගලයෙකු (සූරා අල් ඉඛ්ලාස්, සූරා අල් ෆලක් හා සූරා අන්නාස් යන) අල් මුඅව්විදාත් පරිච්ඡේදයන් පාරායනය කොට සිය ශරීරයට ප්‍රාර්ථනාකර (පිඹා)ගැනීම ඉස්ලාමය අනුමත කරයි. එනමුත්, අන් අය මගින් එසේ නොකළ යුතුයි.

# 6-අල්ලාහ් හැර අන් දෙය කෙරෙහි දිවුරීම

▶▶'සැබැවින්ම, අල්ලාහ් ඔබලාගේ පියවරුන් මත දිවුරුම් කිරීම වළක්වයි. එනිසා කවරෙක් හෝ දිවුරීමට අදහස් කරන්නේනම්, ඔහු අල්ලාහ් කෙරෙහි

දිවුරුම් කරන්වා. නොඑසේ නම්, නිශ්ශබ්දව සිටින්වා' යැයි නබිනායක මුහම්මදු (සල්)තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුඛාරි හා මුස්ලිම්)**

▶▶'(ආරක්ෂාව සඳහා තැබූ) අභය සම්පත් කෙරෙහි දිවුරුම් කරන්නා අපගෙන් කෙනෙකු නොවන්නේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව බුරෛදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶කෙනෙකු 'කඃබාව කෙරෙහි දිවුරා කියමි එසේ නොවේ' යනුවෙන් කීම කෙරෙහි සවන්දුන් ඉබ්නු උමර් (රලි) තුමා 'අල්ලාහ් කෙරෙහි හැර අන් කිසිවෙකු කෙරෙහි හෝ දිවුරුම් නොකරන්න. මන්දයත්, කවරෙක් අල්ලාහ් හැර අන් දෙය කෙරෙහි දිවුරුම් කරන්නේද, ඔහු ප්‍රතික්ෂේප කළේය හෝ (අල්ලාහ්ට) ආදේශ කළේය' යැයි නබි (සල්) තුමා පැවැසූ බව ඔහු වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අල්ලාහ් හැර අන් දේ කෙරෙහි දිවුරුම් කිරීම තහනම්ය. එය සුළු ෂිර්කය වුවත් මහා පාප ක්‍රියාවන් අතර එකකි.

2-නබිතුමා, කඃබා, ගරුත්වය හා ජීවිතය යනාදි මැවීම් කෙරෙහි දිවුරුම් කිරීම තහනම්ය.

3-අල්ලාහ් මත හෝ ඔහුගේ අලංකාරමත් නාමයන් සහ ලක්ෂනයන් කෙරෙහි හෝ දිවුරුම් කිරීම අනුමතවේ.

# 7-නිමිති බැලීම

▶▶'බෝවන රෝගය, නිමිති බැලීම (ඉස්ලාමයේ) නොමැත. එනමුත්, මම සුභ නිමිති ප්‍රිය කරමි. ඒවා යහපත්ශීල වදන්ය' යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම් හා තිර්මිදි)**
▶▶'නිමිති බැලීම ෂිර්ක් (ආදේශ) කිරීමකි' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද් ග්‍රන්ථය)**

## ප්‍රයෝජන

1-නිමිති බැලීම තහනම්ය. එය පරවියන් හෝ වෙනත් දේ මගින් නිමිති බලා ඒ අනුව ක්‍රියාවන් අත්හිටුවීමකි.
2-මෙය ක්‍රියාවක් අත්හිටුවීමට හේතු සාදක වන්නේ නම්, එය ෂිර්කය වේ. මක්නිසාද යත්, මෙය යහපතක් හෝ අයහපතක් ලබාදීමේ හැකියාව අල්ලාහ් හැර වෙනත් දෙයටද ඇති බව විශ්වාස කිරීමකි.
3-සුභ නිමිති බැලීමෙහි අල්ලාහ් කෙරෙහි පිරිසිදු චේතනාව ඇති බැවින් එය සුතුටුදායක කරුණකි.

# 8-අල්ලාහ් කෙරෙහි කාර්ය පැවැරීම

▶▶'කවරෙක් අල්ලාහ් (විශ්වාසකර ඔහු) කෙරෙහි කාර්ය යන් පවරන්නේද, ඔහුට අල්ලාහ් ප්‍රමාණවත් වේ' යැයි අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-65:3)**

▶▶'විශ්වාස වන්තයින් අල්ලාහ් කෙරෙහි කාර්යයන් පව රත්වා' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-64:13)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මාහට සමහර සමාජ පෙන්නුම් කරනු ලැබින. එවිට මම නබිවරයෙකු දිටිමි. ඔහු සමග සුළු පිරිසික් සිටියහ. වෙනත් නබිවරයෙකු දිටිමි. ඔහු හා සමග දෙතුන් දෙනෙක් පමණක් සිටියහ. තවත් නබිවරයෙකු දිටිමි. ඔහු හා සමග කිසිවෙකු හෝ නොසිටියහ. එවිට මාහට විශාල පිරිසක් පෙන්නුම් කරනු ලැබින. ඔවුහු මාගේ සමාජයට අයත් වුවන් බව සිතා සිටි කළ ඔවුහු නබි මූසා (අලෛ) තුමා හා ඔහුගේ සමාජයට අයත් වුවන් බව මාහට දැනුම් දෙනු ලැබින.

පසුව තවත් විශාල පිරිසක් දිටිමි. ඔවුහු මාගේ සමාජ යට අයත් වුවන් ලෙස දැනුම් දෙනු ලැබින. ඔවුන් අතර කිසියම් ප්‍රශ්න කිරීමකින් හා දඬුවම් කිරීමකින් තොරව ස්වර්ගයෙහි පිවිසෙන 70000 දෙනෙක් සිටියහ' යනුවෙන් පවසා එතැනින් නැගිට සිය නිවසට ගියේය. පසුව එහි සිටි පිරිස් ඔවුන් කවුරුන්ද ? යන තර්කයෙහි නිරතවූහ. ඔවුන් ඉස්ලාම් ධර්මයෙහිම උපන් ලබා අල්ලාහ්ට කිසි යම් දෙයක් මගින් හෝ ආදේශ නොකළ අය බව සම හරුන් පැවැසූ අතර අන් අය විවිධ මත දැරූහ.

පසුව නබිනායක මුහම්මදු (සල්) තුමා එහි පැමිණිවිට එතුමාට මෙම කරුණ යොමු කෙරින. එයට එතුමා 'ඔවුහු මතුරා ගැනීම සඳහා අන් අය වෙත නොයන, (රෝගය සඳහා) නොපිළිස්සන, නිමිත්ත නොබලන හා අල්ලාහ් වෙතම පමණක් තමන්ගේ ක්‍රියාවන් පිළිබඳ වගකීම

පවරන්නන්ය' යනුවෙන් පැවසීය. මෙය ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අල්ලාහ් වෙත කාර්යයන් පැවරීමේ ස්වභාවය දැනගැනීම. එය වන්දනාමානයෙහි වැදගත් කමකි.
2-අල්ලාහ් වෙත කාර්යයන් පැවරීම තහවුරු කිරීම, ප්‍රශ්න කිරීමෙන් තොරව ස්වර්ගයෙහි පිවිසීමට හේතුවේ.

# 9-ප්‍රාර්ථනා පිළිගනු ලබන අවස්ථාවන්

▶▶'දාසයෙක් තම ස්වාමියා දෙසට ඉතා සමීපපව සිටින්නේ ඔහු සජ්දාවේ සිටින අවස්ථාවේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'(සලාතයට කැඳවන) අදානය හා (එහි ආරම්භය දැනුම් දෙන) ඉකාමතය අතර කරන ප්‍රාර්ථනාවන් ප්‍රතික්ෂේප කරනු නොලැබේ' යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶'ප්‍රාර්ථනාවන් දෙකක් ප්‍රතික්ෂේප නොකරේ. නොඑසේ නම්, ප්‍රතික්ෂේප කිරීම බොහෝ සුළුය. ඒවා අදාන් කැඳ වන අවස්ථාව සහ සමහරුන් තවත් සමහරුන් සමග සටන් කරන යුද පිටියෙහි කරන ප්‍රාර්ථනාවන්ය' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව සහ්ල් බින් සඃද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶ අප ස්වාමියා සෑම රාත්‍රියේම අවසන් (තුන්වන) කොටසේ පළමු අහස දෙසට බසින්නේය. එහිදි ඔහු 'කවරෙක් මාගෙන් ප්‍රාර්ථනා කරන්නේද ? ඔහුගේ ප්‍රාර්ථනාව මම පිළිගනිමි. කවරෙක් මාගෙන් (දෙයක්) අයදින්නේද ? ඔහුට එය ලබා දෙමි. කවරෙක් මාගෙන් පාපොච්චාරණය කරන්නේද ? ඔහුට මම සමාව ලබා දෙමි' යැයි පවසන බව නබිනායක මුහම්මදු (සල්) තමා පැවසූ වදනක් අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'සෑම රාත්‍රියේම එක අවස්ථාවක් තිබේ. මුස්ලිම්වරයෙකු මෙලෝ හා පරලෝ යහපතක් ගැන ප්‍රාර්ථනා කරමින් එම අවස්ථාවට එක්වූයේ නම් අල්ලාහ් එය ඔහුට ලබා නොදී නොසිටින්නේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තමා ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1- සාමාන්‍ය වේලාවන්ට වඩා ප්‍රාර්ථනා පිළිගනු ඇතැයි අධි කව අපේක්ෂා කරන යම් යම් වේලාවන් ඇත.

2- මෙවන් වේලාවන් රැකගෙන අධිකව ප්‍රාර්ථනා කළ යුතු බව උනන්දුකර ඇත.

3- සජ්දාව, අදානය හා ඉකාමතය අතර, රාත්‍රියෙහි අවසන් සමය සහ යුධ පිටියෙහි සතුරන්ව මූණ ගැසෙන සමය යනාදීන් මෙවන් ප්‍රාර්ථනා පිළිගනු ලබන අවස්ථාවන්ය.

# 10-ජමාඅත් සලාතය අනිවාර්ය වීම

▶▶'නියතව, මුනාෆික්වරු (අස්ථාවාදී)න්ට සලාතයන් අතර ඉතා දුෂ්කරතා ලෙස පවතින්නේ ඉෂා හා ෆජ්ර් සලාත යන්ය. මෙම සලාතයන් දෙකෙහි ශ්‍රේෂ්ඨ භාවය ඔවුහු දැනසිටීනම්, ඔවුන් බඩ ගාගෙන හෝ එම සලාතයන්ට පැමිණෙති. මම, සලාතය ඉටු කිරීම සඳහා (එය ඇරඹූ බව දැනුම් දෙන) ඉකාමත් අණකර, පසුව කෙනෙකුට මිනිසුන්ට (නායකත්වය දී) ඉමාම්වරයා ලෙස සලාතය ඉටු කරන මෙන් අණ කිරීමටත්, පසුව මා සමග සිටින මිනිසුන් එක්ක දර මිටි සහිතව ගොස් (සාමුහිකව ඉටු කරන) ජමාඅත් සලාතයට නොපැමිණ සිටන්නන් ඔවුන් ගේ නිවෙස් පිටින්ම ගිනි තැබීමටත් සිතන්නෙමි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමාගේ හමුවට අන්ධයෙක් පැමිණ අල්ලාහ්ගේ දූතයාණෙනි, මාව මස්ජිදයට කැඳවා ගෙන ඒමට කිසිවෙකු නොමැති බැවින් සිය නිවසෙහි සලාතය ඉටුකර ගැනීමට අවසරය පැතීය. එයට එතුමා ඔහුට අවසරය ලබාදී ඔහු හැරී යන කළ ඔහුව නැවත කැඳවා 'ඔබ අදානයට සවන් දෙන්නේද ? යනුවෙන් විමසීය. එවිට ඔහු ඔව් යනුවෙන් කී විගස එතුමා 'ඔබ එම කැඳවීමට (ජමාඅත් සලාතයට පැමිණීම මගින්) පිළි තුරු දෙන්න' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'කවරෙක් අවසාන දිනයේදී විශ්වාසවන්ත භාවයෙන් අල්ලාහ්ව බැහ දැකීමට අපේක්ෂා කරන්නේද, ඔහු මෙම සලාතයන් ඒවා සඳහා කැඳවන ස්ථාන (මස්ජිද)යෙහි නිසි පිරිදි ඉටු කරත්වා. මන්ද යත්, අල්ලාහ් ඔබලාගේ නබිවරයාට නිවැරදි මාර්ගයක් ධර්මයක් ලෙස ලබා දී ඇත. මස්ජිදය කරා ගොස් ඉටුකරන මෙම සලාතයන්ද නිවැරදි මාර්ගයන් අතර එකකි. ජමාඅත් සලාතයට සහ භාගි නොවී සිය නිවසෙහි සලාතය ඉටු කරන්නා සේ ඔබලාද ඔබලාගේ නිවෙස්වල සලාතයන් ඉටුකරන්නේ නම්, ඔබලා ඔබලාගේ වක්තෘ වරයාගේ මග අතහැර ගියෙකු ලෙසට පත්වන්නෙහුය. ඔබලා ඔබලාගේ වක්තෘ වරයාගේ මග අත හැරියේ නම්, ඔබලා මංමුලාවට පත් වන්නෙහුය.

කවරෙක් වුලූ හෙවත් දෝවනය නිසියාකාරව කර, මෙම මස්ජිදයන් අතර එක් මස්ජිදයක් කරා පැමිණෙන්නේද, අල්ලාහ් ඔහුට ඔහු තබන එක් එක් අඩිය වෙනුවෙන් කුසලක් සටහන් කොට, තරාතිරමක් උසස් කරයි. එසේම අකුසලක් ඔහුගෙන් ඉවත් කරයි.

ප්‍රසිද්ධ අවස්ථාවාදීන් හැර කිසියම් කෙනෙක් හෝ ජමා අත් සලාතයට නොපැමිණ සිටීම අප අතරෙහි මම දැක නොමැත. සැබැවින්ම, අසරණයෙක් පවා දෙන්නෙකුගේ සහායෙන් ගෙනවිත් සෆ් හෙවත් (සලාතයේ) පේළියෙහි නවත්වනු ලැබිත' යනුවෙන් අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-සාමුහිකව (ජමාඅතයෙන්) සලාතය ඉටු කිරීම පිරිමින්ට අනිවාර්යවේ.
2-ජමාඅත් සලාතයට නොපැමිණ සිටීම අවස්ථා වාදීන්ගේ සළකුණුවලින් එකකි.

# 11-ජමාඅත් සලාතයෙහි විශේෂත්වය

▶▶'පුද්ගලයෙක් ජමාඅත් ලෙස (සාමුහිකව) සලාතය ඉටු කිරීම, සිය නිවසෙහි හෝ වෙළඳසැළෙහි හෝ (තනිව) ඉටුකිරීමට වඩා විසිපස් ගුණයකින් ශ්‍රේෂ්ඨවේ. මන්ද යත්, කෙනෙක් නිසියාකාරව වුළූ හෙවත් දෝවනය කර සලාතය ඉටු කිරීමේ චේතනාවෙන් මස්ජිදය කරා ගමන් කරන්නේ නම්, ඔහු තබන සෑම අඩියක් සඳහාම ඔහුට තරාතිරමක් උසස්කර, ඔහුගේ අකුසලක් ඉවත් කෙරේ. ඔහු සලාතය අවසන් කොට එම ස්ථානයෙහි රැඳී සිටින කළ මලක් (සුරදූත)වරුන් 'ස්වාමිනී, ඔහුට කරු ණාව පහළ කරනු මැනවි' යැයි ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරමින් සිටිති.

ඔබලාගේ කෙනෙක් (කාලීන) සලාතයක් ඉටුකළ පසු ජමාඅත් සලාතය අපේක්ෂා කරමින් (එම ස්ථානයෙහි) රැඳී සිටින්නේ නම්, ඔහු (එම කාලයම) සලාතයෙහිම නිරතවී සිටින්නේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'කිසියම් ගම්මානයක හෝ කැලේ ප්‍රදේශයක හෝ තුන් දෙනෙකු සිට ඔවුන් අතර (ජමාඅතයක් ලෙස) සලාතය ඉටු නොවූයේ නම් ඔවුන් මත ෂෙතාන් සිය බලය පිහිටු වයි. එබැවින් (සලාතය) ජමාඅතය ලෙස ඉටුකිරීම අති වාර්ය වේ. මන්ද යත්, වෘකයා හපා අනුභව කරන්නේ තනිවම තණකෑම කන එළුවාමය වේ' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබුදර්දා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶'සමූහයෙන් ඉටුකරන සලාතය තනිවම ඉටුකරන සලාත යට වඩා තරාතිරම් විසි හතකින් ශ්‍රේෂ්ඨවේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-සාමුහික සලාතයෙහි අධික ශ්‍රේෂ්ඨ භාවය තිබේ.

2-පුද්ගලයෙක් සලාතය තනිව ඉටු කිරීමට වඩා සාමුහිකව ඉටු කිරීම උතුම්ය.

3-පුද්ගලයෙක් ජමාඅතය අතපසු කිරීම ෂෙතාන් ඔහු මත සිය බලය පිහිටුවීමට හේතුවේ.

# 12-මස්ජිදයට පැමිණීමේ විධිය

▶▶'ඔබලා (සලාතයෙහි ආරම්භය දැනුම්දෙන) ඉකාමතයට සවන් දුන් විගස සලාතය කරා යන්න. එවිට ඉවසීමෙන් හා කීකරුභාවයෙන් යායුතු අතර, සීඝ්‍රයෙන් නොයන්න. ඔබලාට ලැබූ රකඅතයන්

(ජමාඅත් ලෙස) ඉටුකරන්න. ඔබලාට අතපසුවූ රකඅතයන් සම්පූර්ණ කරන්න' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)**

▶▶'අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග සලාතය ඉටු කරමින් සිටින කල පිරිසක් සීඝ්‍රයෙන් පැමිණීමේ ශබ්දය එතුමා සවන් දුන්නේය. (සලාතය අවසන්වූ) විගස එතුමා 'ඔබලාට කුමක්ද සිදුවූයේ ? (ඇයි මෙලෙස වේගයෙන් පැමිණෙන්නේ ?) යනුවෙන් විමසීය. එයට ඔවුහු 'අපි සලාතය සඳහා වේගයෙන් පැමිණියෙමු' යනුවෙන් කීහ. එවිට එතුමා 'මෙසේ නොකරන්න. සලාතය සඳහා සාව දානව පැමිණෙන්න. ඔබලාට ලැබූ කොටස (සාමූහිකව) ඉටු කරන්න. අතපසුවූ කොටස සම්පූර්ණ කරන්න' යැයි පැවැසූ බව අබූකතාදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## <u>ප්‍රයෝජන</u>

1-සලාතය වෙනුවෙන් සාවදානව හා කීකරුභාවයෙන් පැමි ණෙන මෙන් අණකර ඇත.

2-රුකූඋවෙහි එක්වීම සඳහා හෝ සලාතය වෙනුවෙන් සීඝ්‍ර යෙන් යාම තහනම්කර ඇත.

# 13-සලාතයට පෙරාතුරුව ඒම හා රැඳී සිටීම

▶▶'පුද්ගලයෙක් ජමාඅත් වශයෙන් සලාතය ඉටුකිරීම, එය සිය නිවසෙහි හෝ වෙළඳසැලෙහි හෝ ඉටු කිරීමට

වඩා විසිපස් ගුණයකින් ශ්‍රේෂ්ඨ වේ. මන්ද යත්, පුද්ගලයෙකු නිසියාකාරව වුළූ හෙවත් දෝවනය කර සලාතය ඉටු කිරීමේ චේතනාවෙන් මස්ජිදය කරා ගමන් කරන්නේ නම් ඔහු තබන සෑම අඩියක් සඳහාද ඔහුට තරාතිරමක් උසස්කර, ඔහුගේ අකුසලක් ඉවත් කෙරේ. ඔහු සලාතය අවසන් කොට එම ස්ථානයෙහි රැඳී සිටින කළ මලක් වරුන් 'ස්වාමිනි, ඔහුට කරුණාව පහළ කරනු මැනවි' යැයි ප්‍රාර්ථනා කරමින් සිටිති. ඔබලාගෙන් කෙනෙක් (කාලීන) සලාතයක් ඉටු කිරීමෙන් පසු ජමාඅත් සලාතය අපේක්ෂා කරමින් (එම ස්ථානයේ රැඳී) සිටින්නේ නම්, ඔහු (එම කාලය) සලාතයෙහිම නිරතවී සිටින්නන් සේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබුහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'මිනිසුන් (සලාතය සඳහා කැඳවන) අදානයෙහි හා (සලා තයේ) ප්‍රථම පේළියෙහි වැදගත්කම දැන ගන්නේනම්, ඔවුහූ ඒ සඳහා තරඟ වැදී අභිබවා පැමිණෙති. පසුව එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අතර අංක ඇදීමට සිදු වුවද එයටද ඔවුහූ සැරසෙති. එසේම, මිනිසුන් සලාතය එහි ආරම්භ වේලාවේ ඉටු කිරීමෙහි ඇති විශේෂය ගැන දැන ගන්නේනම්, ඔවුහූ ඒ සඳහා එකිනෙකා අභිබවා පැමිණෙති. සුබහ් හා ඉෂා යන සලාතයන්හි විශේෂය ගැන ඔවුන් දැන ගන්නේනම්, ඔවුහූ බඩ ගාගෙන හෝ ඒ (ජමාඅතය) සඳහා පැමිණෙති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබුහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-සලාතය සඳහා පෙරාතුරුව යාමෙහි විශේෂත්වයක් ඇත.
2-සලාතයක් අපේක්ෂා කොට රැඳී සිටීම සඳහා ඉමහත් කුලි යක් ලැබේ.

# 14-තහිය්යතුල් මස්ජිද් සලාතය

▶▶'ඔබලාගෙන් කවරෙක් හෝ මස්ජිදයෙහි තුලට පිවිසියේ නම්, එහි හිඳ ගැනීමට පෙර රකඅත් දෙකකින් සමන් විත සලාතයක් (මස්ජිදයේ අභිවෘධිය පතා) ඉටු කරන්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ කතාදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

▶▶'සිකුරාදා දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමා ජුම්ආ දේශනාව පවත්වමින් සිටින කළ සුලෙයික් අල්ගත්ෆානී යන තැනැත්තා පැමිණ හිඳ ගත්තේය. වහාම නබිතුමා 'සුලෙයික්, නැගිට කෙටියෙන් රකඅත් දෙකක සලාත යක් ඉටු කරන්න' යනුවෙන් පවසා පසුව 'ජුම්ආ දින යෙහි ඉමාම් වරයා දේශනාව කරන කළ ඔබලාගෙන් කවරෙක් පැමිණියේද, ඔහු කෙටියෙන් රකඅත් දෙකක සලාතයක් ඉටු කරත්වා' යැයි එතුමා පැවසූ බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මස්ජිදයෙහි හිඳ ගැනීමට අදහස් කරන්නා එහි ඇතුළුවූ විගස රකඅත් දෙකක සලාතයක් ඉටුකිරීම නබි මගකි.

2-සිකුරාදා දිනයෙහි ඉමාම්වරයා දේශනා කරමින් සිටියද, එම සලාතය ඉටු කිරීම සුතුටු දායක කරණකි.

# 15-පළමු පේළියෙහි විශේෂත්වය

▶▶'මිනිසුන් (සලාතය වෙනුවෙන් කැඳවන) අදානයෙහි හා (සලාතයේ) පළමු සෆ් හෙවත් පේළියෙහි වැදගත්කම දැන ගන්නේනම්, ඔවුහූ ඒ සඳහා තරඟ වැදී එකිනෙකා අභිබවා පැමිණෙති. පසුව එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුනතර අංක ඇදීමට සිදුවුවද එයටද ඔවුහූ සැරසෙති. එසේම, සලාතය එහි ආරම්භ වේලාවේ ඉටු කිරීමෙහි ඇති විශේෂත්වය පිළිබඳව මිනිසුන් දැන ගන්නේනම්, ඔවුහූ ඒ සඳහා එකිනෙකා අභිබවා පැමිණෙති. සුබහ් හා ඉෂා යන සලාතයන්හි විශේෂත්වය ගැන ඔවුන් දැන ගන්නේ නම්, ඔවුහූ බඩ ගාගෙන හෝ ඒ (ජමාඅතය) සඳහා පැමිණෙති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'තමාගේ අනුගාමිකයන් (පළමු පේළියෙහි සිට ගැනීම කෙරෙහි) පසුපසට වීම දුටු නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඉදිරියට පැමිණෙන්න. මාව අනුගමනය කරන්න. ඔබලාට පසුපස සිටින්නන් ඔබලාව අනුගමනය කරනු ඇත. මිනිසුන් පසුපසට වන කළ අල්ලාහ් ඔවුන්(ගේ කාර්ය) පසුපසට ලක් කරයි' යනුවෙන් පැවැසූ බව අබූ සර්ද් අල්කුද්රි (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'පිරිමින්ගේ පේළියෙහි ශ්‍රේෂ්ඨතම පේළිය එහි පළමු පේළිය වන අතර, එහි නරකම පේළිය අවසාන පේළිය වේ. එසේම, ස්ත්‍රීන්ගේ පේළියෙහි ශ්‍රේෂ්ඨතම පේළිය අව සාන පේළියවන අතර, එහි නරකම පේළිය පළමු පේළි යවේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-පළමු පේළියටද එම පේළියට පැමිණීමටද ඉමහත් ශ්‍රේෂ් ඨත්වයක් තිබේ.
2-පිරිමින්ගේ පේළියෙහි පළමු පේළිය ශ්‍රේෂ්ඨ වන අතර, එහි අවසන් පේළිය නරකම පේළියවේ.
3-පළමු පේළියට (නොපැමිණ) නිතරම පසුපසට වීම ගැන අවවාද කර ඇත.

# 16-පේළි පිළියෙළ කිරීම

▶▶'නබි මුහම්මදු (සල්) තුමා 'මලක් වරුන් තම ස්වාමියා හමුවෙහි පේළියෙහි සිටින සේ ඔබලාට පේළියෙහි සිටිය නොහැකිද ?' යැයි අපගෙන් විමසුවිට අපි 'මලක්වරුන් තම ස්වාමියා හමුවෙහි කෙසේ සිටින්නේද ?' යනුවෙන් විමසුවෙමු. එකල එතුමා 'ඔවුන් ප්‍රථම පේළිය සම්පූර්ණ කරති. පේළියේ (හිස්තැන් නොමැතිව) හිරකර එකතුවී සිටිති' යනුවෙන් ප්‍රකාශ කළ බවට ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා සලාතය ඉටු කරන කළ අපගේ උරහිස අල්ලා 'කෙළින් සිටින්න. පිළිවළින් තොරව නොසිටින්න. එමගින් ඔබලාගේ සිත් පරිහානි යට ලක්විය හැක. මා පිටුපස බුද්ධිමතුන් සිටිය යුතුයි. ඔවුන්ට පසුව ඔවුන්ගෙන් පහළ අයද, පසුව ඔවුන්ගෙන් පහළ අයද සිටිය යුතුයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'ඔබලාගේ (සලාතයෙහි) පේළි හරිගස්වා ගන්න. නියත වශයෙන්ම, පේළිය හරිගස්වා ගැනීම සලාතයෙහි පරිපූර ණතාවයෙකි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා අපගේ (සලාතයෙහි) පේළි ඊතලය මගින් හරිගස්වා කළ හැකි තරමට හරි ගස්වා ගන්නේය. මෙලෙස සිටිය යුතු බවට අපිට මනා අවබෝධයක් ලැබී ඇති බව එතුමා පිළිගන්නා තෙක් මෙසේ කරන්නේය.

පසුව දිනක් නබිනායක තුමා සලාතය සඳහා පැමිණ තක්බීරය කීමට සැරසූ විට පුද්ගලයෙකු පේළියෙන් සිය පපුව ඉදිරියට තබා සිටීම දිටීය. වහාම එතුමා 'අල්ලාහ් ගේ දාසයිනී, ඔබලාගේ පේළි හරිගස්වා ගන්න. එසේ නොවන්නේනම්, අල්ලාහ් ඔබලා අතර වෙන්වීමක් ඇති කරයි' යනුවෙන් ප්‍රකාශ කළ බව නුඅ්මාන් බින් බෂීර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'ඔබලාගේ පේළි හරිගස්වා ගන්න. මම ඔබලාව මාගේ පිටු පසින් දිටින්නෙමි' යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බැවින් අප සැම දෙනෙකුම සිය උරහිස හා පාදය අනෙකාගේ උරහිස හා පාදය සමග ස්පර්ශ කරන් නට වූයෙමු යැයි අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-පේළි හරිගැස්වීම අනිවාර්යවේ. නබිනායක තුමා මේ බව අණකර ඇති අතර, පේළියෙහි අක්‍රමවත් ලෙස සිටීම පිළිබඳව අවවාද කර ඇත.

2-පේළි අක්‍රමවත් ලෙස පැවතීම සලාතය ඉටු කරන්නන්ගේ සිත් පරිහානියට ලක්වීමට හේතුවේ.

3-පේළි ක්‍රමවත් ලෙස හරිගැස්වීම, සලාතයෙහි පරිපූර්ණතා වයෙකි.

# 17-ෆජ්රය සාමූහිකව ඉටුකිරීම

▶▶'පුද්ගලයෙක් සාමූහිකව සලාතය ඉටු කිරීම ඔහු එය තනිව ඉටු කිරීමට වඩා විසිපස් ගුණයකින් ශ්‍රේෂ්ඨවේ. දහවල් කාලයට අයත් මලක්වරුන්ද රාත්‍රි කාලයට අයත් මලක්වරුන්ද ෆජ්ර් සලාතයෙහි ඔබලා සමග එක් රැස් වෙති' යැයි නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව වාර්තා කරන අබූහුරෛරා (රලි) තුමා 'ඔබලා කැමති වන්නේ නම්, "නියතව, ෆජ්ර් සලාතයේ වේලාවෙහි පාරායානය කරන අල්කුර්ආනය සාක්ෂි දරන්නෙකු සේ පවතී" යන වැකිය පාරායනා කරන්න යනුවෙන්ද පවසන්නේය. **(ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)**

▶▶'නිසැකයෙන්ම, මුනාෆික් හෙවත් අවස්ථාවාදීන්ට සලාත යන්හි ඉතා දුෂ්කර සලාතය ලෙස පවතින්නේ ඉෂා හා ෆජ්ර් සලාතයන්ය. මෙම සලාතයන් දෙකෙහි ශ්‍රේෂ්ඨ භාවය ඔවුහු දැන සිටියේනම්, ඔවුන් බඩ ගාගෙන හෝ එම සලාතයන්ට පැමිණෙති. මම, සලාතය ඉටු කිරීම සඳහා (එය ඇරඹූ බව දැනුම් දෙන) ඉකාමතය අණකර, පසුව කෙනෙකුට මිනිසුන්ට (නායකත්වයදී) ඉමාම්වරයා ලෙස සලාතය ඉටුකරන මෙන් අණ කිරීමටත්, පසුව මා සමග සිටින මිනිසුන් එක්ක දර මිටි සහිතව ගොස් (සාමූහිකව ඉටු කරන) ජමාඅත් සලාතයට නොපැමිණ සිටින්නන්ගේ නිවෙස් පිටින්ම ගිනි තැබීමටත් සිතන් නෙමි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'ඉෂා සලාතය සාමූහිකව ඉටු කරන්නා අඩ රාත්‍රියක් සිට ගෙන නැමදුම ඉටුකළ අයෙකු සේ සැළෙකේ. එසේම ෆජ්ර් සලාතය සාමූහිකව ඉටුකරන්නා මුළු රාත්‍රියම සිට ගෙන නැමදුම ඉටුකළ අයෙකු සේ සැළෙකේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව උස් මාන් (රලි) තුමා වාර්තා කාරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'කවරෙක් ෆජ්ර් සලාතය ඉටු කළේද, ඔහු අල්ලාහ්ගේ වගකීමෙන් සිටී. එබැවින් අල්ලාහ් තම වගකීමෙන් ඇති දේ ගැන ඔබලාගෙන් ප්‍රශ්න කිරීමට ඉඩ නොදෙන්න. ඔහු සිය වගකීමෙන් ඇති දේ ගැන කවරෙකුගෙන් හෝ ප්‍රශ්න කර, ඔහුගෙන් යම් අකුසලක් දුටුවෙ නම්, ඔහු ඔහුව යටිකුරුව ඇද

නරකාදියට තල්ලු කරයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ජුන් දුබ් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ෆජ්ර් සලාතයට විශේෂත්වයක් තිබේ. එසේම මෙම සලා තය සාක්ෂි දරන්නෙකි.
2-අවස්ථාවාදීන්හට (මුනාෆික්) මෙම සලාතය ඉතා දුෂ්කර කාර්යයකි.
3-ෆජ්ර් සලාතය සාමූහිකව ඉටු කරන්නා අල්ලාහ්ගේ වග කීමෙන් සිටී.

# 18-අස්ර් සලාතයෙහි විශේෂත්වය

▶▶'සියළු සලාතයන්ද, විශේෂයෙන් මැදි සලාතයද ආරක්ෂා කරගන්න. අල්ලාහ් හමුවේ යටහත් භාවයෙන් සිටින්න' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-2:238)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'රාත්‍රි කාලයට අයත් මලක්වරුන්ද දහවල් කාලයට අයත් මලක්වරුන්ද ඔබලා අතරේ පිළිවෙලට පැමිණෙමින් සිටිති. ඔවුන් දෙපිරිසම ෆජ්ර් සලාතයෙහි හා අස්ර් සලාතයෙහි රැස්වෙති. පසුව ඔබලා සමග රාත්‍රියෙහි ගතකල අය (අහස කරා) නැග යති. ඔවුන්ගෙන් අල්ලාහ් 'ඔබලා මාගේ දාසයින් කුමණ තත්වයෙහි අතහැර දමා පැමිණෙන්නෙහුද ?' යනුවෙන් මේ ගැන දැනගෙනම විමසයි. එයට එම මලක් වරුන් 'ඔවුහු සලාතය

ඉටුකරමින් සිටින තත්වයේ ඔවුන් අතරට ගියෙමු. ඔවුන් සලාතය ඉටු කරමින් සිටින තත්වයේම ඔවුන් අතහැර පැමිණෙන්නෙමු' යනුවෙන් පවසති. මෙසේ තමා නබිතුමාගෙන් සවන්දුන් බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶පසලොස්වක දිනක් අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග හිඳගෙන සිටියෙමු. එකළ එතුමා පුන් සඳ කරා බලමින් 'මෙම පුන් සඳ ඔබලා (පැහැදිලිව) දකින්නා සේ නියතව, ඔබලාගේ ස්වාමියාව ඔබලා දකින්නෙහුය. ඉර උදාවීමට පෙරත් ඉර බැසීමට පෙරත් ඉටු කරන (ෆජ්ර් සහ අස්ර් යන) සලාතයන් කෙරෙහි (නින්ද යාම වැනි හේතූන්) අධික නොවීමට හැකිවන්නේ නම්, ඒවා ඉටු කරන්න' යැයි පවසා 'ඉර උදාවීමට පෙරද, ඉර බැසීමට පෙරද ඔබලාගේ ස්වාමියාගේ කීර්තිය ප්‍රශංසා කරන්න (50 : 39)' යන අල්කුර්ආන් වැකිය පාරායනය කළ බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'කවරෙක් ශීතල්ගත් (ෆජ්රය හා අස්ර් යන) සලාතයන් දෙක ඉටු කරන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ' යැයි නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ මූසා අල් අෂ්අරී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'කවරෙක් අස්ර් සලාතය ඉටු නොකරන්නේද, ඔහුගේ ක්‍රියාවන් විනාශවේ' යැයි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව බුරෛදත් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අස්ර් සලාතයට විශේෂත්වයක් ඇත.
2-මෙම සලාතය ආරක්ෂා කරගැනීම ස්වර්ගයෙහි පිවිසීමට හේතුවේ.
3-මෙම සලාතය පැහැර හරින්නන්ට බලවත් අවවාද කිරීම් ඇත.

# 19-රාත්‍රි නැමදුම (1)

▶▶'ඔවුන්ගේ ඉළ ඇට නිදි යහනෙන් ඉවත්වේ. තම ස්වාමි යාට බියෙන්ද අපේක්ෂාවෙන්ද (ප්‍රාර්ථනාකර) අඬගසති' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-32:16)**

▶▶'රාත්‍රි කාලයෙහි ඉතා අල්පව නිදා ගන්නන් ලෙස ඔවුන් සිටියහ. තවද, ඔවුන් අළුයම් (වේලාවෙ)හි (නැගිට අල් ලාහ්ට නැමදුම් කර තම ස්වාමියාගෙන්) සමාව අයදිමින් සිටිති' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-51:17,18)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'රමදාන් මාසයෙන් පසු විශේෂ උපවාසය වශයෙන් හඳුන් වන්නේ අල්ලාහ්ගේ මාසයවූ මුහර්රම් මාසයේ උපවාසයවේ. අනිවාර්ය සලාත යෙන් පසු විශේෂ සලාතය වශයෙන් හඳුන්වන්නේ රාත්‍රි සලාතය වේ' යනුවෙන් ප්‍රකාශ කළ බවට අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'පුද්ගලයෙකු (රාත්‍රියේ අවදිව) තමාගේ බිරිඳද අවදිකර, ඔවුන් දෙදෙනා රකඅත් දෙකක සලාතයක් ඉටු කළේනම්, අල්ලාහ්ව අධිකව සිහි කරන ස්ත්‍රී පුරුෂයන් අතර දෙදෙනෙකු සේ (අවසාන දිනයේදී) නැගිට්ටවනු ලැබේ' යැයි ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රි (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කෙනෙක් නිදා ගන්නා කළ ෂෛතාන් ඔහුගේ පිටුපස බෙල්ලෙහි ගැට තුනක් දමයි. සෑම ගැටයක්ම ගසනවිට ඔහු 'ඔබට දීර්ග රාත්‍රියක් තිබෙන බැවින් නිදාගන්න' යැයි පවසයි. නමුත්, ඔහු අවදිවී අල්ලාහ්ව සිහි කළේනම්, එක ගැට යක් ලිහිල් වේ.

ඔහු වුලූ (දෝවනය) කළේ නම්, තවත් ගැටයක් ලිහිල් වේ. ඔහු සලාතය ඉටු කළේනම්, තවත් (සෑම) ගැටයක් (ම) ලිහිල්වේ. එනිසා ඔහු උදෑසැනම කඩිසරකමින් හා ප්‍රීති හදවතින් අවදි වේ. නොඑසේ නම්. ඔහු උදෑසැනම කම්මැලිකමින් සහ ශෝකනීය හදවතින් අවදිවේ' යනු වෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා තුමා වාර්තා කරන් නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ 'සෑම රාත්‍රියෙහිම එක් වේලාවක් තිබේ. ඒ අවස්ථාවෙහි මුස්ලිම් වරයෙක් මෙලොව හා පරලොව පිළිබඳ යහපත් කරුණක් ගැන අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළේද, ඔහුට එය අල්ලාහ් ලබා නොදී නොසිටින්නේය' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-රාත්‍රියෙහි නැගිට සලාතය ඉටු කිරීම ශ්‍රේෂ්ඨ කරුණකි.
2-රාත්‍රි සලාතය හදවතෙහි ප්‍රීතියටත් සිත්සතනෙහි සැනසුමටත් හේතුවේ.

# 20-රාත්‍රී නැමදුම (2)

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් කාලයෙහිද රමදාන් නොවන කාලයෙහිද රකඅත් එකලොහට වඩා (කාලීන) සලාතයන් ඉටු නොකළේය. එතුමා රකඅත් සතරක් ඉටු කරයි. එහි දීර්ගය හා ලක්ෂණය ගැන නොඅසන්න. පසුව රකඅත් සතරක් ඉටු කරයි. එහි දීර් ගය හා ලක්ෂණය පිළිබඳව නොඅසන්න. පසුව රකඅත් තුනක් ඉටුකරයි' යනුවෙන් ආයිෂා (රලි) තුමිය පවසා, (එතුමාගෙන්) අල්ලාහ්ගේ දූතයානෙනි, විත්ර් සලාතය ඉටු කිරීමට පෙර ඔබතුමා නිදා ගන්නේද ? යනුවෙන් විමසීමි. එයට එතුමා 'ආයිෂා, මාගේ දෑස් නිදා ගත්තද, මාගේ හදවත නිදා නොගනී' යනුවෙන් පැවැසූ බවද ඇය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'සලාතයන් අතර අල්ලාහ් වෙත ඉතා ප්‍රිය සලාතය නබි දාවූද් (අලෛ) තුමාගේ සලාතයවේ. එසේම සව්ම් හෙවත් උපවාසය අතර අල්ලාහ් වෙත ඉතා ප්‍රිය උපවාසය නබි දාවූද් (අලෛ) තුමාගේ උපවාසයවේ. එතුමා රාත්‍රියෙහි අඩක කාලයක් නිදා ගනී. පසුව තුනෙන් එකක කාල යක් සිටගෙන සලාතයන් ඉටු කරයි. පසුව හයෙන් එකක කාලයක් නිදා ගනී.

එසේම එතුමා දිනක් හැර දිනක් උපවාසයෙහි යෙදෙයි’ යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ පුද්ගලයක් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් රාත්‍රි සලාතය ගැන විමසීය. එවිට එතුමා ‘රාත්‍රි සලාතය රකඅත් දෙක බැගින් ඉටුකළ යුතු සලාතයකි. ඔබලාගෙන් කවරෙකු හෝ ෆජ්ර් සලාතය (අතපසුවීම) ගැන බියට පත්වන්නේ නම්, රකඅත් එකක් ඉටුකළ හැක. එය ඔහු (පෙර) ඉටු කළ සලාතයන් ඔත්තේ ලෙසට පත් කරයි’ යැයි පැවසූ බව ඉබ්නු උමර් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා රාත්‍රි සලාතය ඉටු කිරී මට සැරසුනේ නම්, රකඅත් දෙකකින් සමන්විත කෙටි සලාතයකින් ආරම්භ කරයි’ යනුවෙන් ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-රාත්‍රි සලාතය රකඅත් දෙක බැගින් ඉටු කළ යුතුයි.

2-රකඅත් එකලොහක් ඉටු කිරීම සුන්නත් හෙවත් නබි මගය.

3-රාත්‍රියෙහි තුනෙන් එකක කාලයක් සලාතය ඉටු කිරීම උතුම්ය.

4-රාත්‍රි සලාතය කෙටි රකඅත් දෙකකින් ආරම්භ කිරීම සතුටුදායක කරුණකි.

# 21-කාලීන සලාතයෙහි සමහර නීතිරීතීන්

## වාහනයෙහි නැමදීම

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා කුමන දිසාවක් කරා ගමන් කළත්, වාහනයෙහි අසුන් ගෙන විත්ර් සලාතය හා කාලීන සලාතයන් ඉටුකරයි. නමුදු අනිවාර්ය සලාත යන් එසේ ඉටු නොකරයි' යනුවෙන් අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා වාහනයෙහි හිඳගෙන සිටින කළ වාහනය කුමණ දිසාව කරා සිටියද, එතුමා තම හිසෙන් සංඥාකර කාලීන සලාතයන් ඉටු කිරීමද, අනිවාර්ය සලාතයන් මෙසේ ඉටු නොකිරීමද මම දිටිමි' යැයි ආමිර් බින් රබීආ (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## කාලීන සලාතයන් හිඳගෙන ඉටු කිරීම

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා ලුහර් සලාතයට පෙර මාගේ නිවසේදී (කාලීන සලාතය) රකඅත් සතරක් ඉටු කරයි. පසුව (මස්ජිදයට) ගොස් මිනිසුන් හට අනිවාර්ය සලාතය (නායකත්වය දී) ඉටුකරයි. පසුව නිවසට පැමිණ රකඅත් දෙකක් ඉටුකරයි. එසේම, (මස්ජිදයේ) මග්රිබ් සලාතය ඉමාම් ලෙසට මිනිසුන්ට ඉටු කළ පසු නිවසට පැමිණ රකඅත් දෙකක් ඉටු

කරයි. එසේම (මස්ජිදයේ) ඉෂා සලාතය මිනිසුන්හට ඉටු කළ පසු මාගේ නිවසට පැමිණ රකඅත් දෙකක් ඉටුකරයි. එතුමා රාත්‍රියේ විත්ර් සලාතය සහිතව රකඅත් නවයක් ඉටු කරයි. සමහර අවස්ථාවල රාත්‍රියෙහි දීර්ඝ වේලාවක් සිටගෙනද, සමහර අවස්ථාවල රාත්‍රියෙහි දීර්ඝ වේලාවක් හිඳගෙනද සලාතය ඉටු කරයි. සිටගෙන සලාතය ඉටු කරන කළ රුකූඋව හා සුජූදය නිසියාකාරව ඉටු කරයි. හිඳගෙන සලාතය ඉටු කරනවිට රුකූඋව හා සුජූදය හිඳගෙනම ඉටු කරයි. එසේම, ෆජ්රය (උදෑසැන) උදාවූ පසු රකඅත් දෙකක් ඉටු කරයි' යැයි ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'හිඳගෙන සලාතය ඉටු කරන පුද්ගලයාට එය සිටගෙන ඉටු කරන තැනැත්තාට ලැබෙන කුලියෙන් අඩක් (පම ණක්) ලැබේ' යනුවෙන් නබිකායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-වාහනය හා එවන් දේ කුමන දිසාව කෙරෙහි මුහුණලා ගමන් කලද, එහි හිඳගෙන සලාතය ඉටු කළ හැක.

2-කාලීන සලතයන් හිඳගෙන ඉටු කළ හැක.

3-හිඳගෙන ඉටුකරන සලාතයට සිටගෙන ඉටුකරන සලා තයේ කුලියෙන් අඩක් ලැබේ.

# 22- ජුම්ආ දිනයෙහි විශේෂත්වය

මෙහි ජුම්ආ දිනයෙහි විශේෂත්වය, එහි සුන්නත් සහ එහි පිළිවෙත් පැහැදිලි කෙරේ.

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඉර උදාවන දිනයන් අතර සිකුරාදා දිනය ඉතාමත් වැදගත් හා විශේෂත්වය ඇති දිනයකි. නබි ආදම් (අලෛ) තුමා නිර්මාණය ලද් දේද, එතුමා ස්වර්ගයට පිවිසියේද, එතුමාව එයින් පිට මත් කළේද එම දිනයෙහිය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'කවරෙක් නිසියාකාරව දෝවනය කර, ජුම්ආ සලාතයට පැමිණ, (ඉමාම්වරයා දේශනය ආරම්භ කළ විට) නිශ් ශබ්දව සිට එයට සවන්දී සිටියේනම්, එම ජුම්ආ දිනය සිට අනෙක් ජුම්ආ දිනය සහ තවත් දින තුනක් අතර සිදුවූ ඔහුගේ පාපයන් සඳහා සමාව ලබා දෙනු ලැබේ. කවරෙක් කුඩා ගල්වලින් සෙල්ලම් කරන්නේද, නිසැක යෙන්ම, ඔහු නිශ්ඵල කාර්යයක් කළේය' යනුවෙන් නබි නායක තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'පස්වෙල සලාතය ඉටුකිරීම, ජුම්ආ සලාතයක් ඉටුකර තවත් ජුම්ආ සලාතයක් ඉටුකිරීම හා රමදාන් මාසයෙහි උපවාසයේ යෙදී, තවත් රමදාන් මාසයෙහි උපවාසයේ යෙදීම ඒවා අතර සිදුවූ පාපයන් කෙරෙහි ප්‍රතිකාරයක් වශයෙන් පවතී. නමුත් ඔහු මහා

පාපයන්ගෙන් ඉවත්වී සිටීම එයට කොන්දේශියකි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා ජුම්ආ (සිකුරාදා) දිනය ගැන පවසන කළ 'සිකුරාදා දිනයෙහි එක් වේලාවක් ඇත. එම අවස්ථාවෙහි මුස්ලිම් දාසයෙකු සලාතය ඉටු කර අල්ලාහ්ගෙන් කිසියම් දෙයක් අයැද සිටියේද, එය අල්ලාහ් ඔහුට නොදී නොසිටී' යැයි පවසා 'එය ඉතාමත් සුළු වේලාවක් පමණි' බව සිය අතින් සංඥා කළේය' යනුවෙන් අබූහුරෛරා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-සතියෙහි දිනයන් අතර සිකුරාදා (ජුම්ආ) දිනය විශිෂ්ඨ දිනයකි.

2-ජුම්ආ සලාතයට විශේෂත්වයක් තිබේ. මෙය පාපයන් කමා කිරීමට හේතුවක් ලෙස පවතී.

3-මෙම දිනයෙහි එක් වේලාවක් තිබේ. මුස්ලිම් දාසයෙකු එම අවස්ථාවේ අල්ලාහ්ගෙන් කරන ප්‍රාර්ථනා පිළිගනු ලැබේ.

# 23- ජුම්ආවට කල්වේලා ඇතිව යාම

▶▶ 'විශ්වාස වන්තයෙනි, (සිකුරාදා දවසවූ) ජුම්ආ දිනයෙහි සලාතය සඳහා (අදාන් පවසා ඔබලාව) අඬ ගැසුවේනම්, එකළ අල්ලාහ්ව සිහිකිරීම දෙස ඔබලා

යන්න. වෙළඳාමද අතහැර දමන්න. ඔබලා දැනගන්නවුන් නම් මෙය ඔබ ලාට වඩා හොඳවේ' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන් – 62:9)**

▶▶'සිකුරාදා දිනයෙහි පුද්ගලයෙකු අනිවාර්ය ස්නානය සේ ජලස්නානය කර, (කල්වේලා ඇතිව) පිටත්ව (ප්‍රථමයෙන් ජුම්ආවට) පැමිණියේද, ඔහු ඔටුවෙකු අල්ලාහ් වෙනුවෙන් (කුර්බානී) කැපීම් කළ අයෙකු සේ සැළැකේ. කවරෙක් දෙවැනි වේලාවෙහි පැමිණියේද, ඔහු ගවයෙක් කැපීම් කළ අයෙකු සේ සැළකේ. කවරෙක් තෙවැනි වේලාවෙහි පැමිණියේද, ඔහු අං ඇති එළුවෙක් කැපීම් කළ අයෙක් සේ සැළකේ. කවරෙක් සිව්වැනි වේලාවෙහි පැමිණියේද, ඔහු කුකුළෙකු කැපීම් කළ අයෙකු සේ සැළැකේ. කව රෙක් පස්වැනි වේලාවෙහි පැමිණියේද, ඔහු බිත්තරයක් පිං කළ අයෙකු සේ සැළකේ. ඉමාම්වරයා පැමිණ විගස මලක්වරුන් දේශනයට සවන් දීම සඳහා පැමිණ අසුන් ගනිති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වදනක් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'මිනිසුන් ජුම්ආවට නොයා සිටීමෙන් වැළකී සිටින්න. නොඑසේනම්, අල්ලාහ් ඔවුන්ගේ සිත්සතන්වලට මුද්‍රාව තබයි. පසුව ඔබලා නොසළකන අය ලෙසට පත්වෙති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-(සලාතයට කැඳවන) අදානයට සවන් දුන් විගස ජුම්ආව සඳහා ඉක්මන් විය යුතු බව අණකර ඇත.
2-ජුම්ආව සඳහා පෙරාතුරුව යාම ශ්‍රේෂ්ඨවේ.
3-ජුම්ආව අතපසු කිරීම ගැන අවවාද කර ඇත. හදවත්හි මුද්‍රාව තැබීමට එය හේතුවේ.

## 24-ජුම්ආවෙහි සුන්නත් හා පිළිවෙත්

▶▶'කවරෙක් ජුම්ආ දිනයෙහි සූරා අල්කැෆ් නමැති අල්කුර්ආන් පරිච්ඡේදය පාරායනා කළේද, එම ජුම්ආ දිනය හා අනෙක් ජුම්ආ දිනය අතර දීප්තියක් ඔහුට ලැබේ' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බෛහකී හා හාකිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා ජුම්ආ දිනයක දේශනා කරමින් සිටින කළ මිනිසුන්ගේ උරහිස පසුකර පැමිණි පුද්ගලයෙකු දුටු එතුමා ඔහු අමතා 'හිඳ ගන්න. ඔබ ජුම්ආවට ප්‍රමාදවී පැමිණීමත් සමග මිනිසුන්ටද හිරිහැර කරන්නේය' යැයි පැවැසූ බවට අබ්දුල්ලාහ් බින් බුස්රු (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : අබූදාවුද් හා නසර්)**

▶▶'ජුම්ආ දිනයෙහි ඉමාම් වරයා දේශනය කරන කළ ඔබ ඔබගේ සොහොයුරා අමතා 'නිශ්ශබ්ද වන්න' යැයි කීවේ නම්, ඔබගේ ජුම්ආව අපතේ යයි' යැයි නබි (සල්) තුමා පැවසූ බව අබුහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'නියතව, ඔබලාගේ දිනයන් අතර ජුම්ආ දිනය විශිෂ්ඨ දිනයකි. එහෙයින්, එදිනයෙහි මාහට අධිකව සලවාත් උච්චාරනය (ප්‍රාර්ථනා) කරන්න. නිසැකව ඔබලා කරන සලවාත් මාහට දන්වනු ලැබේ' යනුවෙන් පැවැසූ කළ 'අල්ලාහ්ගේ දූතයාණනි, ඔබතුමා පස් හා සමග දිරාපත් වූ පසු අපි පවසන සලවාත් ඔබතුමාට දන්වනු ලබන්නේ කෙසේද ?' යනුවෙන් එතුමාගේ මිතුරන් විමසූහ. එයට එතුමා 'නියතව, අල්ලාහ් නබි (වක්තෘ)වරුන්ගේ දේහ (විනාශ කිරීම) පොළොවට තහනම්කර ඇත' යැයි පිළි තුරු දුන් බව අවුස් බින් අවුස් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

## ප්‍රයෝජන

1-ජුම්ආවට පෙරාතුරුව පැමිණීම සතුටුදායක කරුණකි.
2-ජුම්ආ දේශනාව නිශ්ශබ්දව සවන්දීම අනිවාර්ය වේ.
3-ජුම්ආ දිනයේ සූරා අල්කෑෆ් පරිච්ජේදය පාරායනා කිරීම සතුටුදායක කරුණකි.
4-ජුම්ආ දිනයේ නබිනායක තුමාට වැඩියෙන් සලවාත් කීම සතුටුදායක කරුණකි.

# 25-අවුරුදු සලාතය (1)

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් අවුරුදු දිනයේ ඉඳි ස්වල්පයක් හෝ අනුභව නොකරමින් (සලාතයට) නොපැමිණෙන්නේය' යනුවෙන් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

වෙනත් වාර්තාවෙහි නබිතුමා ඉදි මත්තේ ලෙස අනුභව කරන බව සඳහන්ව ඇත.

▶▶'නබි නායක මුහම්මදු (සල්) තුමා ආහාරයක් අනුභව නොකර රමදාන් අවුරුදු සලාතයට නොයන බවත්, හජ් අවුරුදු දින සලාතය ඉටු නොකර ආහාරයක් අනුභව නොකරන බවත්' බුරෛදා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදී)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමාණන්ද, අබූබක්ර් (රලි) තුමාද, උමර් (රලි) තුමාද අවුරුදු දෙකකහිම දේශනය කිරීමට පෙර එකී සලාතය ඉටු කරමින් සිටියහ' යැයි ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'මම නබිනායක මුහම්මදු (සල්) තුමා සමග (රමදාන් හා හජ් යන) අවුරුදු දෙකකහිම සලාතයන් අදාන් හා ඉකාමත් අඬගැසීමෙන් තොරව වරක් හෝ දෙවරක් හෝ නොව, (කීප වතාවන්ම) ඉටු කළෙමි' යනුවෙන් ජාබිර් බින් සමුරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් අවුරුදු හා හජ් අවුරුදු දිනයන් (සලාතය ඉටු කරන) පිටියට යන්නේය. එහි එතුමා ප්‍රථමයෙන් සලාතය ආරම්භ කර, එය අව සන්වූ පසු එතුමා නැගිට සිය පේළිවල එසේම හිඳගෙන සිටින මිනිසුන් මුහුණලා සිටිමින් ඔවුන් අමතා දේශනා සහ උපදෙස් කරන්නේය' යනුවෙන් අබූ සර්ද් අල් කුද්රි (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-රමදාන් අවුරුදු දිනයේ ඉඳි ස්වල්පයක් හෝ අනුභව කර සලාතය සඳහා පිටත්ව යාම නබිතුමාගේ මඟකි.
2-හජ් අවුරුදු දිනයෙහි සලාතය ඉටුකරන තෙක් අනුභව නොකිරීම නබිතුමාගේ මඟකි.
3-අවුරුදු සලාතය සඳහා අදාන් හා ඉකාමත් කීම අනුමත නොවන්නේය.

# 26-අවුරුදු සලාතය (2)

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා අවුරුදු දිනයේ රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කළේය. එයට පෙර හෝ පසුව හෝ කිසියම් සලාතයක් ඉටු නොකළේය' යැයි ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් හා හජ් අවු රුදු සලාතයේ පළමු රකඅතයේ තක්බීර් හතක්ද දෙවැනි රකඅතයේ තක්බීර් පහක්ද උසුරන්නේය' යැයි ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

**(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් හා හජ් අවු රුදු දින (සලාත)යෙහි කාෆ් වල් කුර්ආනිල් මජීද් යන පරිච්ඡේදයද ඉක්තරබතිස් සාඅතු වන් ෂක්කල් කමර් යන පරිච්ඡේදයද පාරායනා කරන්නේය' යනුවෙන් අබූ වාකිද් අල්ලයිති (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා රමදාන් හා හජ් දින යෙහි සලාතය ඉටු කර පසුව දේශනය පවත්වන්නේය' යනුවෙන් ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-ඊද් (අවුරුදු) සලාතය ඉස්ලාමීය ව්‍යවහාර සාරධර්මයකි.

2-එම සලාතය රකඅත් දෙකකින් සමන්විතය. ප්‍රථම රක අතෙහි තක්බීර් හතක්ද දෙවැනි රකඅතෙහි තක්බීර් පහක්ද ඉසිරිය යුතුයි.

3-එම රකඅත් දෙකහිම සූරා කාෆ් සහ සූරා කමර් යන පරිච්ඡේද පාරායනය කිරීම සතුටු දායක කරුණකි.

4-අවුරුදු දිනයෙහි සලාතය ඉටුකළ පසු කුත්බා දේශනය පැවැත්විය යුතුයි.

# 27-අවුරුදු සලාතය (3)

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා අවුරුදු දිනයේ (පිටත් වන හා නැවත පැමිණෙන) මග වෙනස්කර ගන්නේය' යනුවෙන් ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'රමදාන් හා හජ් අවු රුදු දිනවල කන්‍යාවන් හා ඔසප්වූ ස්ත්‍රීන් (අවුරුදු සලා තය ඉටු කරන පිටිය කරා) පිටත් කරන ලෙසත්, ඔසප්වූ ස්ත්‍රීන් සලාතයෙන් ඉවත් වී සිටිය යුතු ලෙසත්, ඔවුන් කුසල් ක්‍රියාවලද ඉස්ලාමය කරා කැඳවන කටයුතුවලද යෙදී සිටිය යුතු බවත් අපහට අණ

කළේය. එවිට එක් කාන්තාවක් 'නබිතුමාණනි, අපගේ ස්ත්‍රියෙකුට වැස්මක් නොමැති නම්, කුමක් කළ යුතුද ?' යනුවෙන් විමසීය. එයට එතුමා 'ඇගේ සහෝදරියෙකුට අතිරේකව පවතින වැස්මක් ඇයට අන්දවන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව උම්මු අතියියා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාර් හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අවුරුදු සලාතය සඳහා එක් මාර්ගයකින් ගොස් වෙනත් මාර්ගයකින් නැවත ඒම නබි මගකි.

2-අවුරුදු සලාතය සඳහා පිටත්වන ස්ත්‍රීන් සිය දේහය සම් පූර්ණයෙන්ම ආවරණය කිරීම සතුටුදායක වේ.

# 28-කුර්බානී දීම

## (සතුන් අල්ලාහ්ගේ මගෙහි බෙලි කපා කැප කිරීම)

▶▶'(මෙසේ කුර්බානි දුන්) ඒවායෙහි මාංශ හෝ ඒවායෙහි රුධිර හෝ අල්ලාහ් වෙත කිසිවිටෙක එක් නොවන් නේය. නමුදු ඔබලාගෙන් ඇති බිය බැතිභාවය ඔහු වෙත එක්වේ' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-22:37)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා කලු සුදු පැහැති අං සහිත බැටළුවන් දෙදෙනෙක් කුර්බානී දුන්නේය. එහි බෙල්ලෙහි තමාගේ පාදය තබා තක්බීරය පවසමින් සිය අතින්ම කැපුවේය' යනුවෙන් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶බර්රාඋ (රලි) තුමා 'මාගේ මාමාවරයෙක් වන අබූ බුර්දා (රලි) තුමා (අවුරුදු) සලාතයට පෙර දුන්

කුර්බානියක් දුටු නබි මුහම්මදු (සල්) තුමා 'මෙය මාංශය සඳහා දුන් එළුවකි' යනුවෙන් පැවැසීය. වහාම ඔහු 'නබිතුමනි, මා වෙත වසරක් සම්පූර්ණවූ සුදු පැහැති එළුවෙක් සිටී. (එය කුර්බානි ලෙස ලබා දෙන්නද ? යනුවෙන් විමසීය. එවිට එතුමා 'ඔබ එය කුර්බානි දෙන්න. නමුදු ඔබ හැර අන් අයට මෙය තහනම්ය' යනුවෙන් පවසා 'කවරෙක් සලාතය ඉටුකිරීමට පෙර කුර්බානි දෙන්නේද, නියතව, ඔහු ඔහු වෙනුවෙන්ම කැපීම් කළේය. කවරෙක් සලාතය ඉටු කළ පසු කුර්බානි දෙන්නේද, එය පිළිගනු ලබන අතර, ඔහු මුස්ලිම් වරුන්ගේ මග අනුගමනය කළේය' යනුවෙන්ද පැවැසූ බව වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'වසර දෙකක් හෝ තුනක් සම්පූර්ණවූ ප්‍රාණීන් පමණක් කුර්බානි දෙන්න. එය නොලැබුවේ නම්, එක් වසරක් සම්පූර්ණවූ බැටලු වෙක් දෙන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-කුර්බානි දීම ඉස්ලාම් ආගමික කරුණකි.

2-කුර්බානි දෙන අය ඔහුගේ අතින්ම කැපීම සතුටුදායක කරුණකි.

3-කුර්බානි සලාතය ඉටුකළ පසු දිය යුතුයි.

# 29-ග්‍රහණ සලාතය

▶▶'අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග හිඳ ගෙන සිටින කළ සූර්ය ග්‍රහණයක් සිදුවිය. වහාම එතුමා තම ඇඳුම අල්ලාගෙන මස්ජිදය තුලට පිවිසීය. අපිද එසේම පිවිසියෙමු. එම ග්‍රහණය ඉවත්වන තෙක් එතුමා අපිට රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කළේය. පසුව එතුමා 'කවරෙකුගේ හෝ මරණය නිමිත්තෙන් සූර්ය හෝ චන්ද්‍ර ග්‍රහණය සිදු නොවන්නේය. එබැවින්, ඔබලා ග්‍රහණයක් දුටුවේනම්, එය ඉවත්වන තෙක් සලා තය ඉටු කර ප්‍රාර්ථනා කරමින් සිටින්න' යැයි ප්‍රකාශ කළ බව අබූබක්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමාණන්ගේ කාලයේ සූර්ය ග්‍රහණයක් ඇතිවිය. එවිට එතුමා සලාතයක් ඉටු කළේය. එම සලාතයෙහි දීර්ඝ වේලාවක් (කියාමෙහි) සිටගෙන සිටීය. පසුව දීර්ඝ වේලාවක් රුකූඋ කළේය. පසුව රුකූඋ වෙන් සිට නැගිට දීර්ඝ වේලාවක් නැවත (කියාමෙහි) සිටගෙන සිටීය. මෙය පළමු කියාමට වඩා මදක් අඩුය. පසුව (නැවත වරක්) දීර්ඝ වේලාවක් රුකූඋ කළේය. මෙය පළමු රුකූඋවට වඩා මදක් අඩුය. පසුව දීර්ඝ වේලා වක් සුජූදු කළේය.

පසුව පළමු රකඅතයෙහි කළ පරිදිම දෙවැනි රකඅතයද ඉටුකර සලතය සම්පූර්ණ කළේය. එවිට ග්‍රහණය ඉවත් වී තිබින. පසුව එතුමා ජනතාව අමතමින් දේශනාවක් කළේය.

(එම දේශනාවේ) අල්ලාහ්ව ප්‍රශංසා කර, පසුව 'නියතව, සූර්යයා සහ චන්ද්‍රයා අල්ලාහ්ගේ සාධකයන් දෙකකි. කවරෙකුගේ මරණය හෝ ජීවිතය හේතු කොට ගෙන ග්‍රහණය ඇති නොවන්නේය. ඔබලා ග්‍රහණයක් දුටුවේ නම්, අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්න. ඔහුව ආඩම්බර කරන්න. (කාලීන) සලාතයන් ඉටු කරන්න. පිං කරන්න. මුහම්මද්ගේ සමාජයිනී. අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි. පිරිමියෙක් හෝ ස්ත්‍රියක් දුරාචාරයෙහි යෙදෙන කළ අධි කව ලැජ්ජවට පත්වන්නා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැත. මුහම්මද්ගේ සමාජයිනී. මා දැන සිටින දේ ඔබලා දැන සිටියේනම්. ඔබලා ස්වල්පයෙන් සිනහවී වැඩියෙන් අඩා වැළපී සිටින්නෙහුය' යනුවෙන් පැවැසූ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'නබි (සල්) තුමාගේ කාලයේ සූර්ය ග්‍රහණය සිදුවූකළ අස්සලාතු ජාමිආ (සලාතය සඳහා සැරසෙන්න) යැයි කැඳවනු ලබන්නේය' යනුවෙන් අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

# ප්‍රයෝජන

1-ග්‍රහණය සිදුවූවිට එකී සලාතය ඉටු කිරීම නබි මගකි.
2-ඒ සඳහා 'අස්සලාතු ජාමිආ' යැයි කැඳවීම් කළ යුතුයි.
3-එය දීර්ඝ රකඅත් දෙකකින් යුත් සලාතයකි. සෑම රක අතයෙහිම රුකූඋ දෙකක් තිබේ.
4-සලාතය අවසන්වූ පසු ඉමාම්වරයා ජනතාව අමතා දේශ නයක් පැවත්වීම සතුටුදායක වේ.

# 30-වැස්ස අපේක්ෂා කිරීම

## ජුම්ආ දේශනයෙහි වැස්ස අපේක්ෂා අයැදීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා ජුම්ආ දිනයක දේශ නය පවත්වා ගෙන සිටින කළ මිම්බර් (දේශනා කුටිය) දිසාවෙහි ඇති දොරටුවෙන් පුද්ගලයෙක් පැමිණ එතුමා ගේ ඉදිරියෙහි සිටගෙන 'අල්ලාහ්ගේ දූතයාණෙනි, සිව් පාවන් විනාශ විය. මාර්ගයන් විසන්ධි විය. එහෙයින්, අපහට වර්ෂාව වැසීම සඳහා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් අයැදීය. වහාම එතුමා තමාගේ දෑත් ඔසවා 'ස්වාමිනී, අපට වර්ෂාව වස්සවනු මැනවි. ස්වාමිනී, අපට වර්ෂාව වස්සවනු මැනවි. ස්වාමිනී, අපහට වර්ෂාව වස්සවනු මැනවි. යැයි ප්‍රාර්ථනා කළේය. මෙසේ වාර්තා කරන අනස් (රලි) තුමා මෙසේද පවසන්නේය.

අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි. අහසෙහි වළාකුලු හෝ වැස්ස වැසීමේ සළකුණු හෝ අපි නොදිටුවෙමු. අප හා සල්ඌ යන කඳු ගැට අතර කිසියම් නිවසක් හෝ ගොඩ නැගිල්ලක් නොතිබින. පසුව එම කඳු ගැට පිටු පසින් පළිහයක් ලෙස වළාකුලුවක් මතුවී අහස මැදට පැමිණ විසිරී ගොස් වර්ෂාව වැස්සේය. අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි. මෙනිසා දින හයක් අපි ඉර නොදිටීමු.

පසුව මීළඟ ජුම්ආ දින නබිතුමා දේශනය පවත්වාගෙන සිටින කළ එම දොරටුවෙන් පුද්ගලයෙක් පැමිණ එතුමා ඉදිරියේ සිටගෙන එතුමා අමතා 'අල්ලාහ්ගේ දූතයාණනි, සම්පත් විනාශ විය. මාර්ග විසන්ධි විය. එනිසා, වර්ෂාව

නවත්වන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් අයැදිය. වහාම නබිතුමා තම දෑත් ඔසවා 'ස්වාමිනී මෙම වර්ෂාව අප අවට ප්‍රදේශවල වස්සවනු මැනවි. මෙය අපහට විපාකයක් ලෙස පත් නොකරනු. ස්වාමිනී. වැලි කඳු, කඳුගැට, ඇලදොළු හා සරු බිම්වල මෙම වර්ෂාව වස්සවනු මැනවි' යනුවෙන් ප්‍රාර්ථනා කළේය. වහාම වර්ෂාව නතර වී අපි ඉර උෂ්ණයෙන් පිටත්ව ගියෙමු. (යනුවෙන්ද අනස් (රලි) තුමා වාර්තා කරන්නේය)

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මෙම නබිවදනෙහි නබිනායක තුමාගේ දූතත්වය පිළිබඳ සාධකයක් තිබේ.

2-ජුම්ආ දේශනයෙහි වර්ෂාව අයැදමින් ප්‍රාර්ථනා කිරීම අනුමත කර ඇත.

3-මිනිසුන් අධික වර්ෂාවෙන් අසීරුතාවයට පත්වූ කළ එය නවත්වන මෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

# 31-වැස්ස අපේක්ෂිත සලාතය

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා වර්ෂාව අයැද ප්‍රාර්ථනා කිරීම මම දුටුවෙමි. එතුමා කිබ්ලා දිසාවට මුහුණලා සිට ප්‍රාර්ථනා කළේය. සිය සළුව පෙරළා දමා ගත්තේය. පසුව අල්කුර්ආනය ශබ්ද නගා පාරායනා කරමින් රක අත් දෙකක සලාතයක් ඉටු කළේය' යැයි අබ්දුල්ලාහ් බින් සෙයිද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶මිනිසුන් වර්ෂාව නොමැති හේතුවෙන් සිදුවී ඇති සාග තය පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමාට පැමිණිලි කළ විට නබිතුමා මිම්බර් කුටිය ගෙනෙන ලෙසට අණ කළේය. එතුමා වෙනුවෙන් එය සලාතය ඉටුකරන පිටි යෙහි ඔවුන් තැබූහ. මිනිසුන් සැම දෙනාම පිටත්ව එහි පැමිණෙන ලෙස දිනයක් නියම කළේය. පසුව (නියම කළ) එම දින ඉර සම්පූර්ණයෙන් උදාවීමෙන් පසු නබි නායක තුමා පිටත්ව එහි ගොස් මිම්බර් කුටියෙහි හිඳ ගත්තේය.

අල්ලාහ්ගේ නාමය උසුරා තක්බීරය පවසා, අල්ලාහ්ව ප්‍රශංසා කළ පසු 'ඔබලා ඔබලාගේ ගම්බදෙහි ඇතිවූ සාගතය ගැනද, ඔබලාට වැසිය යුතු වර්ෂාව ප්‍රමාද වීම ගැනද මා වෙත පැමිණිලි කළාහුය. ශ්‍රේෂ්ඨමත් ගෞරව නීය අල්ලාහ් ඔහු වෙතම ප්‍රාර්ථනා කරන මෙන් අණකර ඇති අතර, ඔබලාගේ ප්‍රාර්ථනාවන් පිළිගන්නා බවද ඔහු පොරොන්දුවී සිටී' යනුවෙන් ප්‍රකාශ කළ නබිතුමා මෙසේ ප්‍රාර්ථනා කළේය.

**اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعَالَمِيْنَ ، الرَّحْمَنِ الرَّحِيْمِ ، مَالِكِ يَوْمِ الدِّيْنِ ، لاَ إِلَهَ إِلاَّ اللهُ يَفْعَلُ مَايُرِيْدُ، اَللَّهُمَّ أَنْتَ اللهُ لاَ إِلَهَ إِلاَّ أَنْتَ الْغَنِيُّ وَنَحْنُ الْفُقَرَاءُ أَنْزِلْ عَلَيْنَا الْغَيْثَ وَاجْعَلْ مَا أَنْزَلْتَ قُوَّةً وَبَلاَغًا إِلَى حِيْنٍ.**

*අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්. අර්රහ්මා නිර්රහීම්. මාලිකි යෙව්මිද්දීන්. ලා ඉලාහ ඉල්ලල්ලාහු යෆ්අලු මා යුරීද්. අල්ලාහුම්ම අන්තල්ලාහු ලාඉලාහ ඉල්ලා අන්තල් ගනීයියු වනහ්නුල් ෆුකරාඋ. අන්සිල් අලෛනල් ග්හයිත. වජ්අල් මා අන්සල්ත කුව්වතන් ව බලාගන් ඉලා හීන්.*

**අර්ථය** :
සියලු ප්‍රශංසා විශ්වයේ සෑම දේ මවා පාලනය කරන අල්ලාහ්ටම හිමිවේ. ඔහු අසීමිත කරුණා වන්තයා සහ අසමාන ආදර වන්තයාය. (ඔහු) විනිශ්ච දිනයෙහි අධිපතියා(ද වේ)ය. වන්දනාමාන බල මහිමයට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවෙක් නොමැත. ඔහු අදහස් කරන දෙය කරයි. ස්වාමිනී, වන්දනාමාන බල මහිමයට සුදුස්සා ඔබ හැර වෙනත් කිසිවෙකු නොමැත. ඔබ (කව රෙකුගෙන් හෝ) අවශ්‍යතා නොවන්නාය. අපි අවශ්‍යතා ඇත්තන්ය. අප කෙරෙහි වර්ෂාව වස්සවනු මැනවි. ඔබ වස්සවන එම වර්ෂාව අපහට පලදායික ලෙසද, සෑම දා එකී පලය ලැබීමට සාධකයක් වශයෙන්ද ලබා දෙනු මැනවි.

පසුව එතුමා කිහිල්ලෙහි සුද පෙණෙන තරමට තම දෑත් ඔසවා මිනිසුන් දෙසට තම පිටු පස හරවා තම සළුවය පෙරළා දමා ගත්තේය. එවිටද එතුමා දෑත් ඔසවා සිටීය. පසුව මිනිසුන් දෙසට මුහුණලා (මිම්බර් කුටියෙහි සිට) බැස රකඅත් දෙකක සලාතයක් ඉටු කළේය. (එකළ) අල්ලාහ් වළාකුලු උදා කළේය. විදුලි කෙටීම් හා ගිගුරුම් ඇතිවිය. පසුව අල්ලාහ්ගේ පිහිටෙන් වර්ෂාව වැස්සේය.

වැහි ජලය ගලාගෙන යන විටම නබිතුමා (පිටියෙන් සිට) මස්ජිදය දෙසට පැමිණීය. මිනිසුන් තම තමන්ගේ නිවෙස් දෙසට ඉක්මන්වී යාම දුටු එතුමා තම හක්කේ දත් පෙණෙන තරමට සිනහවිය. පසුව එතුමා 'නියතව, අල්ලාහ් සියළුම දෙයක් කෙරෙහිම ඉතා ශක්ති වන්තයා

බවත්, මම අල්ලාහ්ගේ දාසයා සහ දූතයා බවත් සාක්ෂි දරමි' යනුවෙන් ප්‍රකාශ කළේය. මෙය ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶'දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමා (අල්ලාහ්ගෙන්) වර්ෂාව අයැද සිටීම සඳහා පිටත්ව ඇවිත් අදානය හෝ ඉකාමතය කීමෙන් තොරව අපට රකඅත් දෙකක සලාත යක් ඉටු කළේය. පසුව අපහට දේශනා කිරීමෙන් පසු කිබ්ලා දෙසට මුහුණලා තම දෑත් ඔසවා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළේය. වම් කොටස දකුණටද දකුණු කොටස වමටද වන සේ තම සළුව පෙරළා දමා ගත්තේය' යැයි අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : ඉබ්නු මාජා)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා (වර්ෂාව අයැද සිටීම සඳහා) ඉවසිලිවන්තව සහ සැනසීමෙන් සාමාන්‍ය ඇඳුම් පැළඳමින් පිටත්වූයේය' යනුවෙන් ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-වැස්ස අපේක්ෂිත සලාතය කුත්බා දේශනාව සමග රක අත් දෙකක් ඉටු කිරීම නබි මඟකි.

2-මෙම සලාතයෙන් පසු සළුව මාරුකර පැළඳීම සතුටුදායක කරුණකි.

3-සලාතයට පෙර හෝ පසු කුත්බා දේශනාව කළ හැක.

4-බැගෑපත්කමින් හා ඉවසිලි භාවයෙන් (සලාතයට) පිටත් වීම නබි මඟකි.

# 32-වැස්ස හා සම්බන්ධ සමහර නීතිරීතීන්

## වර්ෂාව දකින කළ කිව යුතු හා නොකිව යුතු කරුණු

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා එක් දින රාත්‍රියක් වර් ෂාව වැසීමෙන් පසු හුදෛබියා නැමැති ස්ථානයේ අපට සුබහ් සලාතය ඉටු කළේය. එය අවසන්වූ පසු එතුමා ජනතාව අමතා 'ඔබලාගේ ස්වාමියා කුමක් පවසන බව ඔබලා දන්නේද ?' යනුවෙන් විමසීය. එයට ඔවුන් 'මෙය අල්ලාහ් සහ ඔහුගේ දූතවරයා පමණක් ඉතාමත් දැන සිටින්නන්ය' යනුවෙන් කීහ. එවිට එතුමා 'මගේ දාසයන් අතර, මාව පිළිගත් අය හා ප්‍රතික්ෂේප කළ අය සිටිති. කවරෙක් අල්ලාහ්ගේ භාග්‍යයෙන් වර්ෂාව වැසූ බව පව සන්නේද, ඔහු මාව විශ්වාස කරමින් තාරකාවන් ප්‍රතික් ෂේප කළේය. එසේම, කවරෙක් මෙවන් සමහර තාරකා වන්ගේ පැවතීම මත වර්ෂාව වැසූ බව පවසන්නේද, ඔහු මාව ප්‍රතික්ෂේප කරමින් තාරකාවන් විශ්වාස කළේය' යැයි අල්ලාහ් පැවැසූ බව ප්‍රකාශ කළේය. මෙය සෙයිද් බින් කාලිද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා වර්ෂාව වැසීම දුටු විගස අල්ලාහුම්ම සයියිබන් නාෆිඅන් **:اَللَّهُمَّ صَيِّبًا نَافِعًا**--ම් අල්ලාහ්, ප්‍රයෝජනවත් වර්ෂාවක් ලෙස මෙය පත්කරනු මැනවි' යැයි ප්‍රාර්ථනා කරන බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## වර්ෂාව වසින වේලාව කවරෙක් දනීද ?

▶▶'අදෘශ්‍යමාන කරුණු පහක් පිළිබඳව අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොදනී. ඒවානම්, කවරෙක් හෝ හෙට දවස කුමක් සිදුවේදැයි නොදනී. කවරෙක් හෝ ගැබ්හි ස්ථාවරය ගැන නොදනී. කවරෙක් හෝ හෙට දින උපයා ගන්නා දෙය කුමක් දැයි නොදනී. කවරෙක් හෝ තමා මරණයට පත්වන්නේ කුමන ස්ථානයක දැයි නොදනී. කවරෙක් හෝ වර්ෂාව කුමණ වේලාවන්හි පැමිණීදැයි නොදනී' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-මෙම තාරකාව මගින් හෝ මෙම තාරකාව මේ ස්ථානයට පැමිණීම නිසා වර්ෂාව වැසූ බව කීම තහනම්ය. නමුත් අල්ලාහ්ගේ භාග්‍යයෙන් හා කරුණාවෙන් වර්ෂාව වැසූ බව කිව යුතුයි.
2-වර්ෂාව වැසීම දකිනවිට 'අල්ලාහුම්ම සයියිබන් නාෆිඅන්' යනුවෙන් කීම නබි මඟකි.
3-වර්ෂාව වැසීම අදෘශ්‍යමාන කරුණුවලින් එකකි. මෙවන් කරුණු සූක්ෂම භාවයෙන් හා සීමා කර අල්ලාහ් හැර අන් කිසිවෙක්ට හෝ දැනගත නොහැක.

# 33-ඉස්තිහාරා සලාතය

ඉස්තිහාරා සලාතය යනු, යම් යහපත් කරුණක් කිරීමට පෙර කරන කාලීන සලාතයකි.

▶▶ නබි මුහම්මදු (සල්) තුමා අල්කුර්ආනයේ පරිච්ඡේදයන් අපට ඉගැන්වූ සේම, සෑම ක්‍රියාවන්හිම කුසල තෝරා ගැනීමේ ක්‍රමයද, ඉගැන්වූවේය. එතුමා 'ඔබලාගෙන් කව රෙක් හෝ යහපත් ක්‍රියාවක යෙදීමට අදහස් කළේනම්, රකඅත් දෙකක කාලීන සලාතයක් ඉටුකර පසුව මෙසේ උසුරිය යුතුයි' යැයි පැවසූ වදනක සඳහන් ප්‍රාර්ථනාවක් ජාබිර් බින් අබ්දුල්ලා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

اَللَّهُمَّ إِنِّيْ أَسْتَخِيْرُكَ بِعِلْمِكَ وَأَسْتَقْدِرُكَ بِقُدْرَتِكَ وَأَسْأَلُكَ مِنْ فَضْلِكَ الْعَظِيْمِ ، فَإِنَّكَ تَقْدِرُ وَلاَ أُقْدِرُ وَتَعْلَمُ وَلاَ أَعْلَمُ وَأَنْتَ عَلاَّمُ الْغُيُوْبِ ، اَللَّهُمَّ إِنْ كُنْتَ تَعْلَمُ أَنَّ هَذاَ اْلأَمْرَ خَيْرٌ لِيْ فِيْ دِيْنِيْ وَمَعَاشِيْ وَعَاقِبَةِ أَمْرِيْ أَوْ عَاجِلِ أَمْرِيْ وَآجِلِهِ فَاقْدُرْهُ لِيْ وَيَسِّرْهُ لِيْ ثُمَّ بَارِكْ لِيْ فِيْهِ وَإِنْ كُنْتَ تَعْلَمُ أَنَّ هَذاَ اْلأَمْرَ شَرٌّ لِيْ فِيْ دِيْنِيْ وِمَعَاشِيْ وَعَاقِبَةِ أَمْرِيْ أَوْ فِيْ عَاجِلِ أَمْرِيْ وَآجِلِهِ فَاصْرِفْهُ عَنِّيْ وَاصْرِفْنِيْ عَنْهُ وَاقْدُرْهُ لِيْ الْخَيْرَ حَيْثُ كَانَ ثُمَّ أَرْضِنِيْ بِهِ

[رواه البخاري]

අල්ලාහුම්ම ඉන්නී අස්තකීරුක බි ඉල්මික, ව අස්තක් දිරුක බිකුද්රතික, ව අස්අලුක මින් ෆලුලිකල් අලීම්, ෆ ඉන්නක තක්දිරු වලා උක්දිරු, වතඃලමු වලා අඃලමු, ව අන්ත අල්ලාමුල් ගුයූබ්, අල්ලාහුම්ම ඉන් කුන්ත තඃලමු අන්න හාදල් අම්ර ක්හයිරුන් ලී ෆී දීනී වමආෂී වආකිබති අම්රී අව් ආජිලි අම්රී වආජිලිහි ෆක්දුර්හු ලී වයස් සිර්හු ලී තුම්ම බාරික්ලී ෆීහි, වඉන් කුන්ත තඃලමු අන්න හාදල් අම්ර ෂර්රුන්ලී ෆීදීනී වමආෂී වආකිබති අම්රී අව් ෆීආජිලි අම්රී වආජිලිහි ෆස්රිෆ්හු අන්නී වස්රිෆ්නී *අන්හු වක්දුර්හුලී අල් හයිර හයිතු කාන තුම්ම අර්ලිනී බිහී.*

## අර්ථය :

ඕ : අල්ලාහ්, ඔබ වෙත (සෑම දේ පිළිබඳ) ඥානය තිබෙන හෙයින් ඔබගෙන් යහපත අයැදිමි. ඔබ වෙත ශක්තිය තිබෙන හෙයින් ඔබගෙන් ශක්තිය අයැදිමි. ඔබගෙන් ඔබේ උතුම්වූ භාග්‍ය අයැදිමි. නියතව ඔබ සැබෑ ශක්ති වන්තයාය. මා ශක්තිවන්තයෙක් නොවෙමි. ඔබ සෑම දේ පිළිබඳ ඥානවන්තයාය. මා ඥානවන්තයෙක් නොවෙමි. ඔබ අදෘශ්‍යමාන කරුණු දැන සිටින ඥාන වන්තයාය.

ස්වාමිනී, යම් කාර්යයක් මාගේ ධහමටද මාගේ ජීවිත යටද මාගේ පරලොව ජීවිතයටද යහපතක් බවට ඔබ දකින්නේ නම්, එයට අදාල ශක්තිය මාහට ලබා දෙනු මැනවි. එය මාහට සරලකර පසුව එහි අභිවෘධිය ඇති කරනු මැනවි. එසේම, යම් කාර්යයක් මාගේ ධහමටද මාගේ ජීවිතයටද මාගේ පරලොව ජීවිතයටද අයහපතක් බව ඔබ දකින්නේ නම්, එම කාර්යයෙන් මාවද මාව එම කාර්යයෙන්ද ඉවත් කරනු මැනවි. කෙසේ වෙතත් යහ පත කෙරෙහි ශක්තිය මාහට ලබා දෙනු මැනවි. පසුව එය මාහට තෘප්ති සහගතව පවත්වනු මැනවි.

**(ග්‍රන්ථය : බුහාරි)**

# ප්‍රයෝජන

1-තමා අදහස් කරන කාර්යයෙහි ප්‍රතිඵලය නොදැන සිටින මුස්ලිම්වරයා එහි යෙදීමට පෙර ඉස්තිහාරා සලාතය ඉටු කළ යුතුයි.

2-සෑම කාර්ය සඳහාම ඉස්තිහාරා සලාතය ඉටුකළ හැක. නමුදු එම කාර්යයෙහි යෙදීමට පෙර එය ඉටුකළ යුතුයි.

# 34-අනාථයන් රැක බලා ගැනීම

▶▶'ඔබ අනාථයන් සමග තරවටු නොකරන්න' යැයි අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-93:9)**

▶▶'ඔවුන් අල්ලාහ් කෙරෙහි ආදරයෙන් දිළිඳුන් හට, අනාථ යන්ට හා සිරකරුවන්ට ආහාර සපයන්නෝය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-76:8)**

▶▶මුහම්මදු (සල්) තුමා 'මම හා අනාථයන්ට රැකවරනය ලබා දෙන්නා ස්වර්ගයෙහි මෙසේ සිටිමු යනුවෙන් පවසා තම දබර ඇඟිල්ල හා මැද ඇඟිල්ල සංඥා කළේය. එම ඇඟිලි දෙක අතර සුළු හිස්තැනක් පැවතිය' යනුවෙන් සහ්ල් බින් සඃද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶මුහම්මදු (සල්) තුමා 'මම හා අනාථයන්ට රැකවරනය ලබා දෙන්නා, ඔවුන් ඥාතීන් හෝ ඥාතීන් නොවන්නන් හෝ වේවා ස්වර්ගයෙහි මෙලෙස සිටින්නෙමු බව පවසා තම දබර ඇඟිල්ල හා මැද ඇඟිල්ල සංඥා කළේය' යැයි අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අනාථයන් රැකබලා ගැනීමේ ශ්‍රේෂ්ඨත්වය හා එය කරා උනන්දු කිරීම.

2-මෙය ස්වර්ගයෙහි පිවිසීමට හා එහි තරාතිරම් උසස්වීමට හේතුවේ.

3–ඥාති අනාථයන් හෝ ඥාති නොවන අනාථයන් හෝ වේවා ඔවුන් සැම දෙනා අනාථයන්ය.

# 35–අනාථයන්ගේ ධනය අනුභව කිරීම

▶▶සැබැවින්ම, අනාථයන්ගේ සම්පත් අයුතු ලෙස අනුභව කරන්නන් තම බඩවල්වල අනුභව කරනුයේ ගින්නය. තවද ඔවුන් (එලොවෙහි) දළලන ගින්නෙහි ඇතුළුවෙති. **(අල්කුර්ආන්–4:10)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'විනාශය ගෙන දෙන කරුණු හතෙන් වැළකී සිටින්න' යනුවෙන් පැවැසූ කළ එතුමාගේ අනුගාමිකයින් 'නබිතුමනි, ඒවා කුමක්ද ?' යනුවෙන් විමසූහ. එයට එතුමා 'ඒවා අල්ලාහ්ට ආදේශ කිරීම, හූනියම් කිරීම, අල්ලාහ් (ඝාතනය කිරීමට) තහ නම් කළ අයෙකුව අයුතු ලෙස ඝාතනය කිරීම, පොලිය අනුභව කිරීම, අනාථයන්ගේ ධනය අනුභව කිරීම, යුධ පිටියෙන් පලා යාම හා විශ්වාසනීය අසරණ පතිවත් ස්ත්‍රිය නින්දා කිරීම යනාදීන්ය' යැයි පැවැසූ බව අබුහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'ස්වාමිනී, අනාථයා හා ස්ත්‍රිය යන අසරණ දෙදෙනාගේ වගකීම් මම ගරුත්වයට පත් කළෙමි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව කුවෛලිද් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අනාථයන්ගේ ධනය අනිසි ලෙස අනුභව කිරීම පිළිබඳව අවවාද කර ඇත.
2-මෙලෙස අනුභව කිරීම විනාශය ගෙනදෙන මහා පාප ක්‍රියාවන් අතර එකකි.

# 36-ප්‍රිය කරන්නා ඔහු සමගම සිටී

▶▶ගැමියෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'එලෝ දිනය කවර දින සිදුවේද?' යනුවෙන් ඇසීය. එවිට එතුමා 'ඔබ එම දිනය වෙනුවෙන් කුමක් පිළියෙල කර සිටින් නේද ?' යනුවෙන් ඔහුගෙන් විමසීය. එයට ඔහු 'අල්ලාහ් හා ඔහුගේ දූතවරයා කෙරෙහි ප්‍රියභාවය පිළියෙල කර මින් සිටින්නෙමි' යනුවෙන් කීය. එවිට එතුමා 'මිනිසා ඔහු ප්‍රිය කරන පුද්ගලයා සමගම සිටී' යනුවෙන් පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'පුද්ගලයෙකු නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවට පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මිනිසෙක් එක් සමාජ යක් කෙරෙහි ප්‍රිය කරයි. නමුදු ඔහු (ඔවුන් කරා ගොස් ඔවුන් හා සමග) එකතු නොවීය. ඔහු පිළිබඳව ඔබතුමා දරණ මතය කුමක්ද ? යනුවෙන් විමසීය. එකළ එතුමා 'මිනිසා ඔහු ප්‍රිය කරන පුද්ගලයා සමගම සිටී' යනුවෙන් පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ආත්මයන් එකින් එක එකතුවීමේ ස්වභාවයෙන් යුත්තකි. ඒවා යහපත් ආත්ම යන් දුටුවිට ඒ හා සමග එකතුවේ. අයහපත් ආත්මයන් දුටු විට එයින් වැළකේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථය : අබූදාවූද්)**

## ප්‍රයෝජන

1-යහපත්ශීලීන් ප්‍රිය කිරීම උතුම්ය. ඔවුන්ට වෙනත් (කුසල්) ක්‍රියාවන් ප්‍රමාණවත් නොවුවත්, මෙය ඔවුන් හා සමග ස්වර්ගයෙහි සිටීමට හේතුවේ.
2-නපුරු මිනිසුන් සහ ප්‍රතික්ෂේප කරන්නන් ප්‍රිය කිරීම අනතුරු දායකය.
3-කවරෙක් කුමන සමාජයන් ප්‍රිය කරන්නේද ඔහු එලො වෙහි ඔවුන් හා සමග සිටී.

# 37-ඡායා රූප හා සම්බන්ධ නීතිරීති

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'බල්ලන් හා රූප ඇති නිවසෙහි මලක් වරුන් නොපිවිසෙති' යනුවෙන් පැවැසූ බව අබූ තල්හා (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'නියතව, එලෝ දිනයේ අල්ලාහ් හමුවෙහි කෲර වේදනාවට ලක් කරනු ලබන් නන් රූප අඳින්නන්ම වේ' යැයි පැවසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ආයිෂා (රළි) තුමිය රූප සහිත කොට්ටයක් මිළදී ගත් තාය. එය දුටු නබිනායක මුහම්මදු (සල්) තුමා නිවස තුලට නොපිවිස දොරටුවෙහිම රැඳී සිටියේය. එතුමාගේ මුහුණෙහි පැවති පිළිකුල්භාවය දුටු ආයිෂා (රළි) තුමිය 'අල්ලාහ්ගේ දූතයාණෙනි, අල්ලාහ්ගෙන් හා ඔහුගේ දූත වරයාගෙන් මම සමාව අයදිමි. මා කළ පාපය කුමක්ද ?' යනුවෙන් ඇසීය. එකළ එතුමා 'මෙය කුමන කොට්ටයද? යනුවෙන් විමසූ විට ආයිෂා තුමිය 'ඔබතුමා හිඳ ගැනීම සඳහා හා ඔබතුමා කොට්ටයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා මෙය මිළදී ගත්තෙමි' යනුවෙන් පැවැසුවාය.

එවිට නබිතුමා 'මෙම රූප ඇඳ වර්ණනා කළ අයට එලෝ දිනයේ වේදනා කරනු ලැබේ. එසේම, 'ඔබලා නිර්මානය කළ මෙම රූපයන්ට පණ දෙන්න යනුවෙන්ද අණ කරනු ලැබේ. රූප ඇති නිවෙස්හි මලක් වරුන් නොපිවිසෙති' යනුවෙන් ප්‍රකාශ කළ බව ආයිෂා (රළි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-රූප ඇඳීම තහනම්ය. මෙය මහා පාප ක්‍රියාවන් අතරෙහි එකකි.
2-රූප තිබෙන නිවෙස්වල මලක්වරුන් නොපිවිසෙති.
3-පරලොව දිනයෙහි මිනිසුන් අතර අධික වේදනාවට ලක් වන්නේ රූප අඳින්නන්ය.

# 38-සිහිනයෙහි විශේෂත්වය

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'සුභාසිංසනය හැර අන් කිසිවක් නබිත්වයෙන් පසුව ඉතිරිවී නොමැත' යැයි පැවැසූ කළ එතුමාගේ ශ්‍රාවකරුවන් 'සුභාසිංසනය යනු කුමක්ද ?' යනුවෙන් විමසූහ. එවිට එතුමා 'එය සුභ සිහි නයන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා 'සුභ සිහිනයන් අල්ලාහ්ගෙන් සිටද, අසුභ සිහිනයන් සාතාන්ගෙන් සිටද සිදුවන්නේය. ඔබලාගෙන් කවරෙක් හෝ පිළිකුල් සිහිනයක් දුටුවේ නම්, ඔහු තම වම් දෙස කරා තුන්වරක් කෙල ගසා එකී උවදුරුවලින් අල්ලාහ්ගෙන් රැකවරණය පැතිය යුතුයි. නියතව, එයින් ඔහුට කිසිදු විපාකයක් හෝ නොසිදුවේ' යැයි පැවසූ බව අබූකතාදා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් හෝ තමා නොදුටු සිහිනයක් දුටු බව පවසන්නේද, ඔහු (අවසාන දිනයේ) තිරිඟු ඇට දෙකක් එකතු කර බඳින ලෙසට බල කරනු ලැබේ' යනුවෙන් පැවසූ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-යහපත් සිහින නබිත්වයෙන් කොටසක් හා සුභාසිංසන යක් බැවින් එයට වැදගත් කමක් තිබේ.

2–සුභ සිහින අල්ලාහ්ගෙන් සිටද අසුභ සිහින ෂෛතාන් ගෙන් සිටද සිදුවේ.
3–සිහිනය පිළිබඳව අසත්‍ය පවසන්නාට අධික දඬුවම් පණා වනු ලැබේ.

# 39–සිහිනයෙහි සාරධර්ම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'සුභ සිහින අල්ලාහ් ගෙන් සිටද, අසුභ සිහින ෂෛතාන්ගෙන් සිටද සිදුවේ. ඔබලාගෙන් කවරෙක් හෝ පිළිකුල් සිහිනයක් දුටුවේ නම්, ඔහු තම වම් දෙස කරා තුන්වරක් කෙල ගසා එකී උවදුරුවලින් අල්ලාහ්ගෙන් රැකවරණය පැතිය යුතුයි. නියත වශයෙන්ම, එයින් ඔහුට කිසියම් විපාකයක් හෝ නොසිදුවේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූකතාදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

වෙනත් වාර්තාවක 'ඔහු කුමන දෙස කරා නිදා ගෙන සිටියේද, එයින් අනෙක් දෙසට පෙරළා නිදාගත යුතුයි' යනුවෙන් නබිතුමා පැවැසූ බවද අබූ කතාදා (රලි) තුමා වාර්තා කරන්නේය.

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කවරෙක් හෝ සුභ සිහිනයක් දුටුවේනම්, නියතව, එය අල්ලාහ් ගේ මාර්ගයෙන් සිදුවූ එකකි. එහෙයින් ඔහු ඒ සඳහා අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි. ඒ පිළිබඳව අන් අයටද පැවැසිය හැකි. ඔහු අසුභ සිහිනයක් දුටුවේ නම්, එය නියතව, ෂෛතාන්ගේ මාර්ගයෙන්

සිදුවූ එකකි. එනිසා, එකී උවදුරුවලින් අල්ලාහ්ගෙන් ඔහු රැකවරණය පැතිය යුතුයි. ඒ ගැන අන් අයට කිසිවක් නොපැවැසිය යුතුයි. නිසැකයෙන්ම, එයින් ඔහුට කිසිඳු විපාකයක් නොසිදු වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූසර්ද් අල්කුද්රි (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැත්වූ දේශනාවකදී 'ඔබලාගෙන් කවරෙකුගේ හෝ සිහිනයෙහි ෂෛතාන් සෙල්ලම් කළේනම්, ඔහු ඒ පිළිබඳව කිසිඳු කෙනෙකුට හෝ නොපැවැසිය යුතුයි' යනුවෙන් පැවැසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

# ප්‍රයෝජන

1−මුස්ලිම්වරයෙකු තමා අප්‍රිය කරන සිහිනයක් දුටුවේනම්, තම වම් දෙස කරා තුන්වරක් කෙල ගසා එම සිහිනයේ හා ෂෛතාන්ගේ උවදුරුවලින් අල්ලාහ්ගෙන් රැකවරණය පැතිය යුතුයි. එසේම අනෙක් දෙසට පෙරළා නිදාගත යුතුයි.

2−මුස්ලිම්වරයෙකු තමා අප්‍රිය කරන සිහිනයක් දුටුවේනම්, එය කිසියම් කෙනෙකුට හෝ නොකිව යුතුයි. නියතව, එයින් කිසිඳු විපාකයක් ඔහුට නොසිදුවේ.

3−මුස්ලිම්වරයෙකු තමා දුටු පළක් නොමැති සිහිනයක් අන් අයට නොකිව යුතුයි. එය සාතාන්ගේ සෙල්ලමකි.

# 40-සංග්‍රහ ඇරයුම පිළිගැනීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'මුස්ලිම් වරයෙක් අන් මුස්ලිම් වරයෙකුට කළයුතු කරුණු පහකි. ඒවා සලාම යට පිළිතුරු දීම, ලෙඩුන්ගේ සුව දුක් විමසීම, ජනාසා (මළකඳ) සමග යාම, ආගන්තුක සංග්‍රහය වෙනුවෙන් කෙරෙන ඇරයුම පිළිගැනීම හා කිඹිහුම කළ තැනැත් තාට පිළිතුරු දීම යනාදීන්ය' යනුවෙන් පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කවරෙක් හෝ වලීමා (මනමාලයා විසින් පිළියෙළ කරන) භෝජන සංග්‍රහයට ඇරයුම් කරනු ලැබුවේනම්, එයට සහභාගි වන්න' යනුවෙන් ප්‍රකාශ කළ වදනක් ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කවරෙක් හෝ සංග්‍රහයකට ඇරයුම් කරනු ලැබූවේනම්, ඔහු එයට සහභාගි විය යුතුයි. ඔහු කැමැතිනම් එය අනුභව කළ යුතුයි. අකැමැතිනම් අනුභව නොකළ යුතුයි' යනුවෙන් පැවැසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ආගන්තුක සංග්‍රහයන් අතර ඉතාමත් නපුරු සංග්‍රහය දුප්පතුන් නොසළකා ධනවතුන්ට පමණක් ඇරයුම් කරමින් පිලියෙල කරන වලීමා සංග්‍රහයවේ. කවරෙක් (ඇරයුම අනුව) සංග්‍රහයට සහභාගි නොවූයේනම්, ඔහු

අල්ලාහ්ට හා ඔහුගේ දූත වරයාට විරුද්ධකම් කළ අයෙකු වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-වලීමා සංග්‍රහයට කෙරෙන ඇරයුම පිළිගත යුතු බව අණ කර ඇත.

2-ආගන්තුක සංග්‍රහයට කෙරෙන ඇරයුම පිළිගැනීම මුස් ලිමෙකු අන් මුස්ලිමෙකුට කළයුතු කරුණුවලින් එකකි.

3-ආගන්තුක සංග්‍රහයට කෙරෙන ඇරයුම පිළිගත්තේනම්, එයට සහභාගි වුවද, නොවැළැක්විය හැකි හේතූන් මත ආහාර අනුභව නොකර සිටීමට හැක.

# 41-අවසර පැතීම

▶▶'විශ්වාස වන්තයිනි, ඔබලාගේ නිවෙස් හැර (අන්) නිවෙස් වලට (ඇතුළුවීමට ඔබලාට අවශ්‍ය වුවහොත් එම නිවැසි යන්ගෙන්) ඔබලා (තුන්වතාවක්) අනුමැතිය උදෙසා, එම නිවැසියන් හට සලාම් පවසන තෙක් (ඒවායෙහි) ඇතුළු නොවන්න' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-24:27)**

▶▶'තවද, ඔබලා අතර සිටින ළමුන් වැඩිවියට පත්වූයේනම්, ඔවුනට පෙර සිටි (වැඩිහිටි) අය අනුමැතිය පැතූ සේම ඔවුන්ද අනුමැතිය පැතිය යුතුයි' යනුවෙන් අල්ලාහ් පව සන්නේය. **(අල්කුර්ආන්-24:59)**

▶▶ ජාබිර් (රලි) තුමා 'මම මාගේ පියාගේ ණයක් පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත ගොස් එතුමාගේ දොර තට්ටු කළෙමි. එකළ එතුමා 'කවුද ?' යැයි විමසූ විට 'මම බව' කීවෙමි. එකළ එතුමා 'මම මම කියන්නේ කවරෙක්ද ?' යනුවෙන් අප්‍රසන්නතාවය හඟවමින් විම සීය' යැයි වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'අවසරය පැතිය යුතු බව අණකර ඇත්තේ (ඇසින්) දිටීමේ හේතුවෙනි' යනු වෙන් පැවැසූ බවට සහ්ල් බින් සඃද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ මම නබි මුහම්මදු (සල්) තුමාට සලාමය නොපවසා එතු මාගේ නිවස තුල පිවිසියෙමි. එකළ එතුමා 'ඔබ නැවත පිටත්ව ගොස් අස්සලාමු අලෛකුම් මම පැමිණීමට අව සරද? යැයි විමසන්න' යනුවෙන් පැවැසූ බව කල්දා බින් හම්බල් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කවරෙක් හෝ තුන්වරක් අවසරය පතා එයට අවසරය නොලැබුවේ නම්, ඔහු නැවත හැරී යායුතුයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූමූසා අල්අෂ්අරී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

# ප්‍රයෝජන

1-නිවසක පිවිසීමට පෙර අවසරය ලබාගත යුතු බව අණ කර ඇත.

2-අවසරය පතන්නාගෙන් ඔබ කවරෙකුද ? යැයි විමසූවිට 'මා' බව නොපවසා තම නම කීම සුන්නත්ය.
ඃ-තුන්වරක් අවසරය පැතිය යුතුයි. අවසරය ලැබුවේ නම්, නිවසතුල පිවිසිය හැක. නොඑසේනම්, හැරී යායුතුයි.

# 42-සාතාන් කෝළාහළ කිරීම

▶▶'(ඕ : නබි,) මාගේ වහලුන්ට ඔබ පවසන්න. (කවරුන් සමඟ කථා කළද) කුමක් යහපත්ද එයම ඔවුන් පැවැසූ වාවේ. නියතව, ෂෛතාන් ඔවුන් අතර කෝළාහළ ඇති කරයි' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-17:53)**

▶▶'නියතව, ෂෛතාන් අරාබිය අර්ධ ද්වීපයේ සලාතය ඉටු කරන්නන් තමාහට (කීකරුවී) වන්දනාමාන කිරීම පිළි බඳ විශ්වාසය අත් හැරියේය. නමුත්, ඔහු ඔවුන් අතර කලබල ඇති කිරීමට උත්සාහය දරන්නේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'නිසැකයෙන්ම, ෂෛතාන්ගේ අර්ෂය (සිංහාසනය) මුහු දෙහි පිහිටා ඇත. (ඔහු එහි සිට) තම සේනාවන් පිටත් කර යවයි. ඔවුහු මිනිසුන් අතර ගොස් කලබලය ඇති කරති. මිනිසුන් අතරේ අධික කලබලය ඇති කරන්නා ඔවුන් අතර ශ්‍රේෂ්ඨවන්තයාය' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'ඔබලාගෙන් සෑම පුද්ගලයෙකුටම ජින් සමූහයෙන් කෙනෙකු මිත්‍රයෙකු ලෙස සම්බන්ධකර ඇත' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පවැසූ විට එතුමාගේ ශ්‍රවකරුවන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමාටත්ද ?' යනුවෙන් විමසූහ. එකළ එතුමා 'ඔව් මාහටත්ය. නමුත්, අල්ලාහ් ඒ පිළිබඳව මාහට උපකාර කළේය. ඔහු මාහට කීකරුවිය. ඔහු මාහට යහපතකින් තොර කිසිඳු දෙයක් හෝ අණ නොකරයි' යනුවෙන් පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-නියතවශයෙන්ම, විශ්වාසවන්තයින්ට සාතාන් සතුරා බව තහවුරු වේ.
2-මිනිසුන් අතර සිදුවන කලබල ගැන අවවාදයෙන් සිටීම හා ඒවා නැති කිරීමට උත්සහ කිරීම අනිවාර්යවේ. මක් නිසාදයත්, මේවා සාතාන්ගේ ක්‍රියාවන්ය.

# 43-වංචා කිරීම

▶▶'විශ්වාස වන්තයිනී, ගිවිසුම් නිසි ලෙස (සම්පූර්ණයෙන්) ඉටු කරන්න' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-5:1)**

▶▶ඔබලා ගිවිසුම සම්පූර්ණයෙන් ඉටු කරන්න. මක්නිසාද යත්, නිසැකයෙන්ම ගිවිසුම ගැන ප්‍රශ්න කරනු ලැබේ' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-17:34)**

▶▶'කවරෙක් කෙරෙහි හෝ ගුණාංග සතරක් තිබේද, ඔහු පැහැදිලි අවස්ථාවාදියාය. එයින් ගුණාංගයක් කවරෙක් කෙරෙහි හෝ තිබී ඔහු එයින් ඉවත්වන තෙක් කුහක මෙහි එම ගුණය ඔහු කෙරෙහි පවතී. ඒවානම්, ඔහුට විශ්වාස කළේනම්, ද්‍රෝහිකම් කරයි. ඔහු යමක් ප්‍රකාශ කළේනම්. අසත්‍යයම පවසයි. ඔහු ගිවිසුමක් කළේනම්, එය කඩ කරයි. ඔහු තර්ක කළේනම්, වංචනිකව විවාද කරයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වදනක් අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'පරලොව දිනයෙහි වංචා කළ සෑම දෙනාගේ අතින්ම කොඩියක් බැගින් තිබේ. එකළ මෙය මොහු කළ වංචා වකි යනුවෙන් පවසනු ලබේ' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-වංචා කිරීම තහනම් කරුණක්වන බැවින් එය කෙරෙහි අවවාද කර ඇත.

2-වංචා කිරීම අවස්ථාවාදීන්ගේ ගුණාංගයකි.

3-තමන කළ නින්දිත ක්‍රියා නිසා වංචනිකයන් පරලොව දිනයේ ප්‍රසිද්ධියට පත් කරවනු ලැබේ.

# 44-රැවටීම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා ආහාර ගොඩක් පසු කර ගමන් කළේය. එවිට එය තුල තම අත දැමූ එතුමා ගේ ඇගිලිවලට තෙත ගතියක් දැනින. එවිගස එතුමා ආහාර වෙළෙන්දාණෙනි, මෙය කුමක්ද ? යනුවෙන් විම සීය. එයට ඔහු 'අල්ලාහ්ගේ දූතයාණෙනි, වැහි ජලයෙන් එසේ තෙත්විය' යනුවෙන් කීය. එකළ නබිතුමා 'ඒවා (තෙත්වූ දේ) මිනිසුන්ගේ බැල්මට පෙනෙන සේ උඩට තැබිය හැකිනේ? කවරෙකු වංචා කරන්නේද, ඔහු මට අයත් කෙනෙකු නොවන්නේය' යැයි පැවැසීය. මෙය අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

▶▶'අපට එරෙහිව ආයුධ ඔසවන්නාද, අපට වංචා කරන්නාද අප (සමාජයේ) අය නොවන්නේය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'ධර්මය යනු, යහපත අපේක්ෂා කිරීමකි' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා පැවැසූවිට අල්ලාහ්ගේ දූත යාණෙනි, කාහට යහපත අපේක්ෂා කිරීමද ? යනුවෙන් අපි එතුමාගෙන් විමසීමු. එයට එතුමා 'එය අල්ලහ්ටද, ඔහුගේ දූතවරයාටද, ඔහුගේ ධර්ම ග්‍රන්ථයටද, මුස්ලිම් වරුන්ගේ නායකයන්ටද හා සැම මුස්ලිම්වරුන්ටම යහ පත අපේක්ෂා කිරීමකි' යනුවෙන් ප්‍රකාශ කළ බව තමීම් බින් අව්ස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මිනිසුන්ට වංචා කිරීම තහනම්ය. මෙය මහා පාපයන් අතර එකකි.
2-මිනිසුන්ට යහපත අපේක්ෂා කිරීම අනිවාර්යවේ.

# 45-කෝපවීම

▶▶පුද්ගලයෙකු තමාට උපදෙස් කරන මෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් ඉල්ලීය. එයට එතුමා 'ඔබ කෝප නොවන්න' යැයි පැවැසීය. ඔහු නැවත නැවත උපදෙස් කරන මෙන් ඉල්ලා සිටි සැම විටම එතුමා 'ඔබ කෝප නොවන්න' යනුවෙන්ම ප්‍රකාශ කළේය. මෙය අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'කෙනෙකුව වට්ටන්නා වීරයෙක් නොවේ. සැබෑ වීරයා නම්, කෝපය පැමිණෙන විට සිය හදවත මෙල්ල කරන් නාය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'ඔබලාගෙන් කවරෙක් හෝ සිටගෙන සිටිනවිට කෝපය පැමිණිනම්, ඔහු හිඳගත යුතුයි. එවිට ඔහුගේ කොපය ඉවත්වූයේනම් ප්‍රශ්නයක් නොවේ. නොඑසේනම්, ඔහු නිදා ගත යුතුයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වදනක් අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶'අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග හිඳගෙන සිටින කළ එතුමා ඉදිරියෙහි දෙදෙනෙක් එකිනෙකාව බැණ වදිමින් සිටියහ. ඔවුන්ගෙන් කෙනෙක් අනෙකාව (අධික) කෝපයෙන් බැණ වැදිය. එයින් ඔහුගේ මුහුණ රතු පැහැයට වෙනස්විය. (එය දුටු) නබිතුමා 'මම එක් වදනක් දන්නෙමි. එය ඔහු කිවේනම්, ඔහුගේ කෝපය ඔහුගෙන් ඉවත්වේ. (එය) අඌදු බිල්ලාහි මිනෂ්ෂෛතානි ර්රජීම් (එළවන ලද ෂෛතාන්ගේ උවදුරුවලින් මම අල්ලාහ්ගෙන් ර්‍ඝකවරණය පතන්නෙමි) වේ' යැයි පැවැසූ බව සුලෙයිමාන් බින් සුර්ද් (රලි) වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-කෝපවීමෙන් වැළකී සිටින මෙන් නබිනායක තුමා උප දෙස් කරන අතර, එසේ කෝපය පැමිණවිට එය මෙල්ල කරන්නාට ප්‍රසංසා කරයි.

2-සිටගෙන සිටින කළ කෝපය පැමිණවිට හිඳ ගත යුතු බවත්, එසේ කෝපය ඉවත් නොවූයේනම්, ඔහු නිදාගත යුතු බවත් මග පෙන්වා දී ඇත.

3-කෝපය පැමිණි විට අල්ලාහ් වෙත සෛතාන්ගේ උවදුරු වලින් ර්‍ඝකවරණය පැතිය යුතු බව නබිනායක තුමා මග පෙන්වා දී ඇත.

# 46-මිනී පිට්ටනි කරා යාම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මිණීවළ කරා යාම මම ඔබලාට තහනම් කර සිටියෙමි. එබැවින් (මින්

ඉදිරියට) ඒවා කරා යන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව බුරෛදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)** 'මෙය පරලොව දිනය සිහි කරයි' යන වැකිය සහිතව තිර්මිදි ග්‍රන්ථයෙහිද මෙම වදන සඳහන්ව පවතී.

▶▶ මිනීවළ කරා ගමන් කළේනම්, මෙලෙස උසුරන ලෙස නබිනායක මුහම්මදු (සල්) තුමා තමාගේ ශ්‍රාවකරුවන්ට ඉගැන්වූ බව සුලෙයිමාන් බින් බුරෛදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා ඉබ්නු මාජා)**

اَلسَّلاَمُ عَلَيْكُمْ أَهْلَ الدِّيَارِ مِنَ الْمُؤْمِنِيْنَ وَالْمُسْلِمِيْنَ، وَإِنَّا إِنْ شَاءَ اللهُ بِكُمْ لَلاَحِقُوْنَ، نَسْأَلُ اللهَ لَنَا وَلَكُمْ الْعَافِيَةَ

*අස්සලාමු අලෙයිකුම් අහ්ලද් දියාරි මිනල් මු:මිනීන වල් මුස්ලිමීන්, ව ඉන්නා ඉන්ෂා අල්ලාහු ලලාහිකූන්. නස් අලුල්ලාහ ලනා වලකුමුල් ආෆියා.*

## අර්ථය :

මිනීවළෙහි සිටින විශ්වාස වන්ත මුස්ලිම් වරුනි, ඔබලා කෙරෙහි සාමය පහළ වේවා. අල්ලාහ්ගේ කැමැත්ත මත නියතව, අපිද ඔබලා මුන ගැසීමට සිටින්නන්ය. අපහට හා ඔබලාට යහපත අයදින්නෙමු.

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලා මිනීවළ පෙරටු කර සලාතය ඉටු නොකරන්න. ඒ මත හිඳ නොගන්න' යැයි පැවැසූ බව අබූමර්සද් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කෙනෙක් ගින්නක් මත හිඳගෙන එමගින් ඔහුගේ ඇඳුම් හා ශරී රය දැවීම, මිනීවළ මත හිඳ ගැනීමට වඩා උතුම්ය' යැයි පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මිනීවල බැහ දැකීම සතුටුදායක කරුණකි. එය එලොව දිනය සිහි ගන්වයි.
2-සුසාන භූමියතුල පිවිසෙන කළ නබිනායක තුමා පැවැසූ පරිදි ප්‍රාර්ථනා කිරීම සතුටුදායක වේ.
3-මිනීවල පෙරටුකර සලාතය ඉටු කිරීම තහනම්ය. මක් නිසාදයත්, එසේ කිරීම එය කරා වන්දනාමානය කිරීමට හේතුවක් වශයෙන් පවතී.
4-මිනීවළ මත හිඳ ගැනීම තහනම්ය.

# 47-මත්පැන් පානය කිරීම

▶▶ 'විශ්වාස වන්තයෙනි, නියතව, මත්පැන්ද, සූදු කෙළියද, (නැමදුම සඳහා) සිටුවන ලද දේ (පිළිරූ) ද, සලකුණ බලන (සූදු කෙළියෙහි) ර්තලද (මේ සියල්ල) ෂෛතාන් ගේ කාර්යයන්ගෙන් යුත් අප්‍රිය කළ යුතු ඒවාය. එනිසා, මේවායින් වැළකී සිටින්න. (එනිසා) ඔබලා ජයග්‍රහණය කරන්නෙහුය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-5:90)**

▶▶ 'සැබවින්ම, මත්ගතිය ඇති කරන සැම දේ මත්පැන්ය. සැම මත්පැන්ම තහනම්ය. මෙලොවෙහි

කවරෙක් හෝ අඛණ්ඩව මත්පැන් පානය කර, ඒ කෙරෙහි (අල්ලාහ් ගෙන්) පාපොච්චාරණය නොකර සිටිමින් මරණයට පත් වෙන්නේද, ඔහු පරලෝ දිනයේ එය පානය නොකරයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'මත්වීම ඇති කරන සැම දේ තහනම්ය. මද්‍යපාන ද්‍රව්‍ය යන් පානය කරන්නාට අල්ලාහ් (පරලොව දිනයේ) තීන තුල් හබාල් (නමැති පානය) පොවන බවට ගිවිස ගෙන සිටී' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ කළ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, තීනතුල් ක්හබාල් යනු කුමක්ද ? යනුවෙන් එතුමාගේ යහළුවන් විමසූහ. එයට නබිතුමා 'එය අපාය වාසීන්ගේ දහඩිය හෝ සැරව' යැයි ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶තාරික් බින් සුවෛද් (රලි) තුමා නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් මත්පැන් පානය පිළිබඳව විමසූ කළ එතුමා එය තහනම් කළේය. පසුව ඔහු 'මා එය පාවිච්චි කරන්නේ බෙහෙතක් ලෙසටය' යනුවෙන් කීය. එයට එතුමා 'නියත වශයෙන්ම, එය ලෙඩක් හැර බෙහෙතක් නොවන්නේය' යැයි පැවැසූ බව ඔහු වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'කවරෙක් මෙලොවෙහි මත්පැන් පානය කළේද, ඔහුගේ දින හතලිහක උදෑසන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු පාපොච්චාරනය කළේනම්, අල්ලාහ් පිළිගනී. ඔහු නැවත පානය කළේනම්, ඔහුගේ දින හතලිහක උදෑ සන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු

පාපොච්චාරනය කළේ නම්, අල්ලාහ් එය පිළි ගනී. ඔහු නැවත පානය කළේනම්, ඔහුගේ දින හතලිහක උදෑසන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු පාපොච්චාරනය කළේ නම්, අල්ලාහ් එය පිළිගනී. ඔහු නැවත පානය කළේ නම්, ඔහුගේ දින හතලිහක උදෑසන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු පාපොච්චාරනය කළේ නම්, අල්ලාහ් එය පිළිගනී. ඔහු නැවත සිව්වැනි වතාවත් පානය කළේ නම්, ඔහුගේ දින හතලිහක උදෑසන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු පාපොච්චාරනය කළේනම්, එය අල්ලාහ් පිළි නොගන්නා අතර, ඔහුට සැරව ගංගාවෙන් පොවයි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ් දුල්ලාහ් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-මත්පැන් පානය කිරීම තහනම්ය.

2-එය පානය කරන්නාට දැඩි ලෙස අවවාද කර ඇත.

3-එය ලෙඩක් හැර බෙහෙතක් නොවේ.

# 48-නිශ්ඵල තර්ක විතර්කවල යෙදීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'මට පසුව යහමගෙහි සිටින කිසිදු සමාජයක් හෝ තර්ක විතර්කවල යෙදීමේ හේතුවෙන් තොරව මංමුළාවට නොපත් වේ' යැයි පවසා 'ඔවුන් මෙම උදාහරණය ඉදිරිපත් කළේ නිශ්ඵල විතර්ක යටම වේය. (43:58)' යන අල්කුර්ආන් වැකිය පාරායනා කළේය' යැයි අබූඋමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶ මුහම්මදු (සල්) තුමා 'මිනිසුන් අතර අල්ලාහ්ගේ දැඩි කෝපයට ලක්වන්නේ අධිකව තර්ක විතර්කවල යෙදෙන්නාය' යැයි පැවැසූ බව ආයිෂා (රලි) වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'තමා පවසන කරුණු සත්‍යය වුවත්, ඒ ගැන තර්ක නොකර සිටින්නාට ස්වර්ගයෙහි පහළ කොටසෙහි මාලිගාවක්ද, විහිළුවට වුවත් අසත්‍යය නොපසා සිටින්නාට ස්වර්ගයේ මැද කොටසෙහි මාලිගාවක්ද සහ යහපත් ගුණ ධර්මයෙන් සිටින්නාට ස්වර්ගයේ ඉහළ කොටසෙහි මාලිගාවක්ද ලබා දීමට මම වගකීම් දරන්නෙමි' යනුවෙන් පැවැසූ බව අබූ උමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'එලොව දිනයේ මාහට සමීපව අසුන්ගෙන සිටින්නන් හා මාහට ඉතාමත් ප්‍රිය වන්නයන් ඔබලා අතර සිටින සත් ගුණධර්ම ශීලීන්ය. එසේම, පරලොව දිනයේ මාගෙන් ඈත්වී සිටින්නන් හා මාහට ඉතා අප්‍රිය වන්නයින් ඔබලා අතර සිටින නිශ්ඵල කතාබහක යෙදෙන්නන්, තමාගේ කතාවන් උතුම් ලෙස සිතන්නන් හා විශ්මයෙන් කට අරින්නන්ය' යනුවෙන් ප්‍රකාශ කළේය. එවිට සහාබාවරුන් නබිතුමනී. 'නිශ්ඵල කතාබහක යෙදෙන්නන් හා තම කතාවන් උතුම් ලෙස සිතන්නන් පිළිබඳව අපි දනිමු. නමුත්, විශ්මයෙන් කට අරින්නන් යනු කවරෙක්ද ?' යනුවෙන් විමසූහ. එකළ එතුමා 'ඔවුන් අහංකාරකම පෙන්වන්නන්ය' යනුවෙන් පිළිතුරු දුන් බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-තර්ක කිරීමෙන් වැළකී සිටීමට උනන්දු කර ඇත. පලක් ඇති කරුණක් සඳහා තර්ක කළ හැක. නමුදු, එය යහ පත් ශීලයෙන් පැවතිය යුතුයි.
2-අධික ලෙස තර්ක විතර්කවල යෙදීම පිළිබඳව අවවාදකර ඇත.
4-නබිතුමා නිශ්ඵල කතා බහක යෙදෙන්නන් සහ තම කතාවන් උතුම් ලෙස සිතන්නන් පිළිකුල්කර ඇති අතර එලොව දිනයේ ඔවුන් එතුමාගෙන් ඈත්වමින්ද සිටිති.

# 49-ගස් සිටුවීම හා වගා කිරීම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා අන්සාරී වරියකුවූ උම්මු මුබෂ්ෂිර් යන ස්ත්‍රියට අයත් ඉඳි වත්තක් තුලට පිවිසීය. පසුව එතුමා ඇයගෙන් 'මෙම ගස් සිටුවූයේ මුස්ලිම් වර යෙකුද? නොඑසේනම්, කාෆිර්වරයෙකුද ? යනුවෙන් විම සීය. එයට ඇය 'මුස්ලිම් වරයෙකු බව කීය. එකළ නබි තුමා 'මුස්ලිම් වරයෙකු ගසක් සිටුවූයේනම් හෝ කුමක් හෝ වගා කළේ නම් එයින් මිනිසුන් හෝ සිව්පාවන් හෝ වෙනත් කිසිවක් හෝ අනුභව කළේ නම්, එය ඔහු කළ සදකා හෙවත් පිනක් ලෙස සලකනු ලැබේ' යැයි පැවැසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවර මුස්ලිම් වරයෙක් හෝ ගසක් සිටවා එයින් අනුභව කළ සෑම දේම ඔහුට සදකාවකි. එයින් සොරකම් කළ දේද

ඔහුට සදකාවකි. එයින් සිව්පාවන් අනුභව කළ දේද ඔහුට සදකාවකි. එයින් පරවියන් අනුභව කළ දේද සදකාවකි. එයින් කිසි වක් අඩුවුවද එයද ඔහුට සදකාවකි' යනුවෙන් ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-වගා කිරීමට හා ගස් සිටුවීමට ශ්‍රේෂ්ඨත්වයක් ඇත.
2-ගස්වලින්ද බෝගවලින්ද මිනිසුන් හා සිව්පාවන් අනුභව කළේනම්, එය ඒවා වගා කළ අයට සදාකාවකි.

# 50-වෙළඳාමෙහි නීතිරීතීන්

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා ආහාර ගොඩක් පසුකර ගමන් කළේය. එවිට එය තුලට තම අත දැමූ එතුමාගේ ඇඟිලිවලට තෙත ගතියක් දැනින. එවිගස එතුමා ආහාර වෙළෙන්දනී මෙය කුමක්ද ? යනුවෙන් විමසීය. එයට ඔහු 'අල්ලාහ්ගේ දූතයාණෙනි, වැහි ජලයෙන් එසේ තෙත්විය' යනුවෙන් කීය. එකළ නබිතුමා 'ඒවා (තෙත්වූ දේ) මිනි සුන්ගේ බැල්මට පෙනෙන සේ උඩට තැබිය හැකිනේ ? කවරෙක් වංචා කරන්නේද, ඔහු මාහට අයත් කෙනෙක් නොවන්නේය' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා 'විකුණුම් කරන්නා හා මිළදී ගන්නා යන දෙදෙනා ඉවත්වන තෙක් (වෙළඳාම) කඩ කිරීමට උරුමකම් ඇත්තන්ය. ඔවුන්

දෙදෙනා සත්‍යයම පවසා (කිසිදු දෙයක් හෝ වසං නොකර) පැහැදිලි කළේ නම්, ඔවුන්ගේ වෙළඳාමෙහි බරකත් හෙවත් අභිවෘධිය ඇති කරනු ලැබේ. ඔවුන් දෙදෙනා අසත්‍යය පවසා සත්‍ය තාවය වසං කළේ නම්, ඔවුන්ගේ වෙළඳාමෙහි බරකත් හෙවත් අභිවෘධිය නැති කරනු ලැබේ' යනුවෙන් පැවැසූ බව හකීම් බින් හිසාම් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

# වෙළඳාමෙහි දිවුරීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා '(වෙළඳාමෙහි) දිවුරීම භාණ්ඩයන් විකිණීමට උපකාර වන අතර, එය ලාභයෙහි පාඩුව ගෙන දෙයි' යනුවෙන් පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා '(වෙළඳාමෙහි) අධිකව දිවුරීම ගැන මම අවවාද කරමි. මන්දයත්, සැබැවින්ම, දිවුරීම භාණ්ඩ විකිණීමට උපකාරවේ. පසුව ලාභයෙහි අභිවෘධිය නැති කරයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ කතාදා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

# ප්‍රයෝජන

1-විකිණීමෙහි හා මිළදී ගැනීමෙහි රැවට්ටීම තහනම්ය. එය මහා පාපයකි.

2-විකුණුම් කරන්නා සහ මිළදී ගන්නා යන දෙදෙනා හට ඔවුන් ඉවත්ව යාමට පෙර වෙළඳ භාණ්ඩයක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය හිමිවේ.

3-වෙළඳාමෙහි දිවුරීම තහනම්ය. එසේ දිවුරීම වෙළඳාමෙහි අභිවෘධිය විනාශ කරයි.

# 51-අධිකව සිනාසීම

▶▶'අධිකව සිනා නොවන්න. අධිකව සිනාසීම හෘදය පාලු කරයි' යනුවෙන් නබිනායක මුහමම්දු (සල්) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරන් නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා හකු දත් පෙනෙන සේ සිනාසීම මම කිසියම් විටක හෝ නොදිටිමි. එතුමා සිනා හවුයේ මද සිනහව පමණයි' යනුවෙන් ආයිෂා (රලි) තුමා වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶නබිනායක මුහමම්දු (සල්) තුමා 'ඔබ ඔබගේ සහෝදර යාගේ මුහුණ බලා මද සිනහවීම ඔබට පිනකි. ඔබ කුසල් කෙරෙහි අණ කිරීම හා අකුසල් ගැන වැළැක්වීම ඔබට පිනකි. නොමගෙහි සිටින කෙනෙකුට ඔබ සුමග පෙන්වීම ඔබට පිනකි. ඇස් නොපෙණෙන අන්දයෙකුට ඔබ මග පෙන්වීම ඔබට පිනකි. මාර්ගයෙහි ඇති ගල්, මුල් සහ කටු යනාදීන් ඔබ ඉවත් කිරීම ඔබට පිනකි. ඔබ බාල්දියෙහි ඇති ජලය ඔබ සහෝදරයෙකුගේ බාල්දි යෙහි වැක්කිරීමද ඔබට පිනකි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අධිකව සිනහවීම තහනම්ය.

2-එය හෘදය පාලුවීමට හේතුවකි.

3-එය නබිතුමාගේ යහමගක් නොවන්නේය.

# 52-බොරුවට දිවුරීම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා ‘කවරෙක් හෝ මුස්ලිම් වරයෙකුගේ ධනයක් පැහැර ගැනීම සඳහා බොරු දිවුරු මක් කළේ නම්, අල්ලාහ් ඔහු මත කෝපවී සිටින තත් වයේ ඔහු අල්ලාහ්ව මූණ ගැසේ’ යනුවෙන් පවසා පසුව මේ පිළිබඳ ‘කවරෙක් අල්ලාහ් හා සමග කරනලද ගිවි සුම හා තමන් කළ බොරු දිවුරුම් ස්වල්ප මිළකට විකු ණුම් කරන්නේද, ඔවුන්ට පරලෝ දිනයෙහි කිසිදු භාග්‍ය යන් හෝ නොමැත. තවද, අල්ලාහ් ඔවුන් සමග කථා බහක නොයෙදෙයි. එසේම, අවසන් දිනයේ ඔහු ඔවුන්ව කරුණාවන්ත බැල්මෙන් නොබලයි. තවද ඔවුන්ව (පාප යෙන් සිට) පවිත්‍ර නොකරයි. එසේම, ඔවුන්ට නින්දිත වේදනා පවතී’ (3:77) යන අල්කුර්ආන් වැකිය පාරායනා කළ බවට අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා ‘කවරෙක් හෝ බොරු දිවුරුමක් මගින් මුස්ලිම් වරයෙකුගේ අයිතිවාසිකමක් උදුරා ගන්නේද, අල්ලාහ් ඔහුට අපාය අනිවාර්ය කරයි. ස්වර්ගය ඔහුට තහනම් කරයි’ යනුවෙන් පැවැසූ කළ පුද්ගලයෙකු ‘අල්ලාහ්ගේ

දූතයාණෙනි, ස්වල්ප දෙයක් වුවත්ද ?' යනුවෙන් විමසූ විට එතුමා 'ඔව් අරාක් ගහක (දත් මදින ප්‍රමාණ) කෝටුවක් වුවත්' යනුවෙන් පැවැසූ බව අබූ අමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'අල්ලාහ්ට ආදේශ කිරීම, දෙමාපියන් හට නින්දා කිරීම, පණ ඇති දේ ඝාතනය කිරීම හා බොරුවට දිවුරීම යනා දීන් මහා පාපයන්වේ' යනුවෙන් නබි (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

වෙනත් වාර්තාවක එක් ගැමියෙකු නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මහා පාපයන් කුමක්ද ?' යනුවෙන් විමසීය. එකළ නබිතුමා 'අල්ලාහ්ට ආදේශ කිරීම' යැයි පැවැසීය. පසුව කුමක්ද ? යනුවෙන් ඔහු නැවත විමසූ කළ නබිතුමා 'බොරුවට දිවුරීම' යැයි පැවැසීය. පසුව ඔහු 'බොරුවට දිවුරීම යනු කුමක්ද? යනුවෙන් විමසීය. එයට නබිතුමා 'මුස්ලිම් වර යෙකුගේ ධනයක් පැහැර ගැනීම සඳහා කරන දිවුරීමකි' යනුවෙන් ප්‍රකාශ කළේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-බොරුවට දිවුරා මුස්ලිමෙකුගේ ධනයක් පැහැර ගැනීම ඉමහත් තහනමකි.

2-මෙසේ කරන්නාට උග්‍ර දඬුවම් ලැබේ. ඔහුගේ එම දිවු රුම ඔහුව නරකාදියෙහි ගිල්වයි.

3-මෙයින් වැළකී සිටීම අනිවාර්යවේ.

# 53-බොරු සාක්‍ෂ්‍යය

▶▶'බොරු කීමෙන් වැළකී සිටින්න' යනුවෙන් අල්ලාහ් පව සන්නේය. **(අල්කුර්ආන්-22:30)**

▶▶'කුමක් පිළිබඳව ඔබට දැනුම් ඥානයක් නොමැතිද, ඒවා අනුගමනය නොකරන්න. නියත වශයෙන්ම, ඇස්, කන් හා හෘදය යන සෑම දේ කෙරෙහි ප්‍රශ්න කරනු ලැබේ' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-17:36)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මහා පාපයන් ගැන ඔබලාට මම දැනුම් දෙන්නද ?' යනුවෙන් විමසීය. එසේ මයි අල්ලාහ්ගේ දූතයාණෙනි, යනුවෙන් කීමු. එවිට නබි තුමා 'අල්ලාහ්ට ආදේශ කිරීම දෙමාපියන් හට නින්දා කිරීම යනුවෙන් පවසා හාන්සිවී අසුන් ගත්තේය. පසුව අපි එතුමා නිශ්ශබ්ද නොවෙයිද ? යනුවෙන් අපි කියන තරමට බොරු සාක්ෂි කීම' යැයි නැවත නැවත ප්‍රකාශ කළේය. මෙය අබූබක්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-බොරු සාක්ෂි කීම තහනමකි.

2-මෙය මහා පාපයකි. මන්දයත්, මෙහි අසත්‍යය පැවැසීම හා මුස්ලිම් වරයාගේ හිමිකම පැහැර ගැනීම අන්තර් ගතවේ.

# 54-ශාප කිරීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'විශ්වාස වන්තයෙකුට ශාප කිරීම ඔහුව ඝාතනය කිරීම සේය' යැයි පැවැසූ බව ලහ්හාක් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'සත්‍ය වන්තයා අධිකව ශාප කරන්නෙකු ලෙස සිටිය නොයුතුයි' යැයි පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ අධිකව ශාප කරන්නන් පරලොව දිනයෙහි රැකමදාරු කරන්නන් ලෙස හෝ පරිත්‍යාග ශීලීන් ලෙස නොසිටිති' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ දර්දා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'විශ්වාස වන්තයෙක් දොස්පද කියන්නෙකු, ශාප කරන් නෙකු, අකුසල් කරන්නෙකු හා කැත වචන කියන් නෙකු ලෙස නොසිටිය යුතුයි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය :තිර්මිදි)**

▶▶ 'දාසයෙක් කිසියම් දෙයකට (හෝ කෙනෙකුට) ශාප කළේනම්, එම ශාපය අහස කරා නගිනවිට එකී දොරටු වැසේ. පසුව එය පොළොව කරා බසිනවිට එකී දොරටුද වැසේ. පසුව එය වම හා දකුණු දෙසට හැරී බලනවිට එහිද මාර්ගයක් නොලැබේ. එබැවින්, එය

කවරෙක්ට ශාප කරන ලද්දේද ඔහු එයට සුදුස්සෙකු නම්, ඔහු කරා යයි. ඔහු සුදුස්සා නොවන්නේ නම්, එය ශාප කළ අය වෙතම යාවි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ දර්දා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

## ප්‍රයෝජන

1-පොදුවෙන් මුස්ලිම් වරුන්ට ශාප කිරීම කෙරෙහි අවවාද කර ඇත.
2-අසාධාරණයක් ලෙස කෙනෙකුට ශාප කළේනම්, එම ශාපය ඔහු වෙතම යාවි.
3-ශාප කිරීම සත්‍ය වන්තයින්ගේ හෝ යහපත් ශීලීන්ගේ ගුණාංග නොවන්නේය.

# 55-කවි

▶▶'තවද, කවිවරුන්ව පිළිපදිනුයේ නොමග ගිය අය වේ. නියතව, ඔවුන් එක් එක් බෑවුම්වල ඇවිදින්නෝය යන්න ඔබ නොදුටුවෙහිද? තවද, නියතව, ඔවුන් තමන් නොකළ දෙය (කළ දෙය ලෙස) පවසති. (නමුදු ඔවුන්ගෙන්) විශ් වාසකර, යාකම්ද කර, අල්ලාහ්වද අධික ලෙස සිහිකර, තමන් අසාධාරණයට ලක්වූ පසුව පලිගන්නේද ඔවුන් හැරය. **(අල්කුර්ආන්-26:224-227)**

▶▶නබි (සල්) තුමා 'කවිවලද ඥානය ඇත්තේය' යනුවෙන් පැවැසූ බව උබයි බින් කඃබ් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ බනූ කුරෙලා යුද්ධය සිදුවූ සමයේ නබිනායක මුහම් මදු (සල්) තුමා හස්සාන් (රලි) තුමා අමතා 'ආදේශකරු වන්ට (පිළිතුරක් ලෙස) වස් කවි ගායනා කරන්න. ඔබ හා සමග ජිබ්රීල් (අලෛ) මලක්වරයා සිටින්නේය' යැයි පැවැසූ බව බර්රාඋ බින් ආසිබ් (රලි) පවසන්නේය. **(ග්‍රන්ථ : බුහාර් හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'පුද්ගලයෙකුගේ හද වතෙහි සැරව පිරී එමගින් හදවත නරක්වීම එහි කවි පිරී තිබීමට වඩා ඔහුට උතුමිය' යනුවෙන් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාර් හා තිර්මිදි)**

## ප්‍රයෝජන

1-කවිවල අතර හොඳ හා නින්දිත කවිද ඇත.

2-පුද්ගලයෙකුගේ සිත්සතනෙහි දේව සිතුවිල්ල හා අල්කුර් ආනය නොවන අන්දමට අධිකව කවි කට පාඩම් කිරීම කෙරෙහි අවවාද කර ඇත.

# 56-තහනම් වචන

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් හෝ තම සහෝදරයාව කාෆිර් (ප්‍රතික්ෂේප කරන්නා) යනුවෙන් ඇමතුවේ නම්, ඹුවුන් දෙදෙනාගෙන් කෙනෙකු එසේම කාෆිර් වේ. (එනම්,) අමතනලද තැනැත්තා කාෆිර්නම් ඔහු කාෆිර්වේ. කාෆිර් නොවන්නේ නම්, එසේ ඇමැතු තැනැත්තා කාෆිර්වේ' යනුවෙන් පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාර් හා මුස්ලිම්)**

▶▶'කවරෙක් කෙනෙකුව කාෆිර් යනුවෙන් හෝ අල්ලාහ්ගේ සතුරා යනුවෙන් හෝ ඇමතුවේනම්, ඔහු එසේ නොමැති නම්, එම වචනය ඇමතු තැනැත්තා කරා නැවත ඒවි' යනුවෙන් තමා නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් සවන් දුන් බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶මම නබිනායක මුහම්මදු (සල්) තුමාගේ පිටුපස අසුන් ගෙන වාහනයකින් ගමන් කරමින් සිටියෙමි. එතුමාගේ වාහනය (පාද ලිස්සී) බිමට වැටුනි, එවිට මම 'ෂෛතාන් විනාශවනු මැනවි' යැයි කීමි. එකළ එතුමා 'ෂෛතාන් විනාශවනු මැනවි යැයි නොකියන්න. මක්නිසාද යත්, එසේ කීමෙන් ඔහු නිවසක ප්‍රමාණයට මහත්වී 'මාගේ හැකියාවෙන් එම වාහනය බිමට තල්ලු කළෙමි' යැයි (ආඩම්බරයෙන්) දොඩවයි. නමුදු, බිස්මිල්ලාහි (අල්ලාහ් ගේ පැවැත්මෙන්) යනුවෙන් පවසන්න. මක්නිසාදයත්, එසේ කීමෙන් ෂෛතාන් කෙටටුවී මැස්සෙකුගේ ප්‍රමාණ යට පරිවර්තනයවේ' යනුවෙන් පැවැසූ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

## ප්‍රයෝජන

1-මුස්ලිම්වරයෙකු අමතා කාෆිර් යැයි ඇමතීම තහනම්ය.

2-මුස්ලිම්වරයෙකු අමතා අල්ලාහ්ගේ සතුරා යැයි ඇමතීම තහනම්ය.

3-මෙවන් වචන මුස්ලිම් වරයෙකු අමතා පවසන කළ ඔහු එයට සුදුස්සා නොවන්නේ නම්, එය ඇමතු තැනැත්තා වෙතම ඒවි.

4-ෂෛතාන් විනාශවනු යැයි නොකිව යුතුයි. ඒ වෙනුවට බිස්මිල්ලාහ් යැයි කිව යුතුයි.

# 57-ජිහාද් කිරීමෙහි විශේෂත්වය

▶▶'විශ්වාස වන්තයෙනි, එක් ව්‍යාපාරයක් ගැන මා ඔබලාට දැනුම් දෙන්නද? පීඩා සහිත වේදනාවෙන් එය ඔබලාව මුදවා ගනී. (එවන් ව්‍යාපාරය වනුයේ) ඔබලා අල්ලාහ්වද, ඔහුගේ (මෙම) දූතයාද, විශ්වාසය කර ඔබලාගේ සම්පත් හා ඔබලාගේ ප්‍රාණ මගින් අල්ලාහ්ගේ මාර්ගයෙහි සටන් (ජිහාද්) කිරීමවේ. ඔබලා දැනගන්නවුන්නම්, මෙය ඔබ ලාට වඩාත් හොඳ වේ.' යැයි අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-61:10,11)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'ක්‍රියාවන් අතර උතුම් ක්‍රියාව කුමක්ද ?' යනුවෙන් විමසූවිට එතුමා 'අල් ලාහ්ව හා ඔහුගේ දූතයාව විශ්වාස කිරීමකි' යනුවෙන් පැවැසීය. පසුව කුමක්ද ? යනුවෙන් විමසූ කළ එතුමා 'අල්ලාහ්ගේ මගෙහි ජිහාද් කිරීමකි' යනුවෙන් පැවැසීය. පසුව කුමක් බව විමසූ කළ එතුමා 'පිළිගනු ලබන හජ් කර්තව්‍යයකි' යැයි පැවැසීය. මෙය අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'උදෑසෙන හෝ සවස් වරුවේ හෝ අල්ලාහ්ගේ මගෙහි (ජිහාදය සඳහා) වරක් පිටත්වීම මෙලෝ හා එහි ඇති සියළු දේට වඩා උතුමිය' යැයි නබි (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'කවර දාසයෙකුගේ දෙපාවන්හි අල්ලාහ්ගේ මාර්ගයෙහි දූවිලි පටලය නොවදින්නේද, අපාය ඔහුව අනුභව කරයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට අබ්දුල් රහ්මාන් බින් සුබයිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූත යාණෙනි, අල්ලාහ්ගේ මගෙහි ජිහාද් කිරීමට සමානව පවතින්නේ කුමක්ද ?' යනුවෙන් විමසූ කළ නබිතුමා 'එයට ඔබලා ශක්තිය නොලබති' යනුවෙන් පැවැසීය. මෙසේ එතුමාගෙන් දෙතුන් වතාවන් විමසූ කළද එතුමා 'එයට ඔබලා ශක්තිය නොලබති' යනුවෙන් පවසා, පසුව 'අල්ලාහ්ගේ මගෙහි ජිහාදය කරන්නාට උදාහරණය නම්, උපවාස ශීලය හා සලාතයන් නොකඩවා ඉටුකර, අල්ලාහ්ගේ (අල්කුර්ආන්) වදන්වලට කීකරුවී අනුගම නය කරන්නාය. මෙවන් ජිහාදයෙහි යෙදෙන්නා තම නිවස කරා පැමිණෙන තෙක් එම ස්ථාවරයෙන්ම සිටී' යනුවෙන්ද පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

# ප්‍රයෝජන

1-අල්ලාහ්ගේ මගෙහි ජිහාද් කරන්නාට ඉමහත් තරාතිර මක් ලැබේ.

2-සැබැවින්ම, ජිහාදය ක්‍රියාවන් අතර උතුම් ක්‍රියාවකි.

3-මෙය නරකාදියෙන් ජය ගැනීමට හේතුවේ.

# 58-ජිහාද් කරන්නා හා දිවි පුදන්නාගේ කුලිය

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

'අල්ලාහ් කෙරෙහි විශ්වාසය, ඔහුගේ දූතවරයා කෙරෙහි සත්‍යභාවය සහ ඔහුගේ මගෙහි ශුද්ධවූ යුද්ධ කිරීමේ චේතනාව කවරෙකුව අල්ලාහ්ගේ මගෙහි සටන් කිරීමට පිටත් කළේද, ඔහුගේ වගකීම අල්ලාහ් භාර ගනී. එනම්, ඔහුව ස්වර්ගය කරා පිවිස වීමේ හෝ කුලිය හා යුධ සම් පත් පිරිනමමින් ඔහු පිටත්වූ නිවස කරා ආපසු පිවිස වීමේ වගකීම අල්ලාහ් භාර ගන්නේය. මුහම්මදුගේ ප්‍රාණය කවරෙක් සතුව පවතින්නේද, ඔහු මත දිවුරා කියමි. කවරෙක් අල්ලාහ්ගේ මාර්ගයෙහි (සටන් කර එමගින්) තුවාලයක් ලැබුවද, ඔහු පරලොව දිනයේ එසේ තුවාලයෙන්ම පැමිණේ.

මුහම්මදුගේ ප්‍රාණය කවරෙකු සතුව පවතින්නේද, ඔහු කෙරෙහි දිවුරා කියමි. මුස්ලිම් වරුන්ට අසීරුතාවයක් නොවන්නේනම්, අල්ලාහ්ගේ මගෙහි සටන් කරන කිසි යම් කුඩා සේනාවක් සමග හෝ කිසිවිටක මම නොයා නොසිටියෙමි. නමුදු ඔවුන් සැම දෙනාටම වාහන පහසු කම් සපයා දීමට මා වෙත පහසුකම් නොතිබුණි. එසේම ඔවුන් වෙතද පහසුකම් නොතිබුණි. සමහරවිට මා එම කුඩා සේනාව සමග ගියේනම්, වාහන පහසුකම් නොළැද අයට මා සමග නොපැමිණ සිටීමට අසීරුතාවයවක් ලෙස පැවැතිය හැක.

මුහම්මදුගේ ප්‍රාණය කවරෙක් සතුව පවතින්නේද, ඔහු කෙරෙහි දිවුරා කියමි. නියතව, මා අල්ලාහ්ගේ මගෙහි සටන් කරමින් සිය දිවිය පුදකර, (නැවත පණදීම) පසුව සටන් කරමින් දිවිය පුදකර, (නැවත පණ දීම) පසුව සටන් කරමින් දිවිය පුද කිරීමට මා කැමැත්තෙමි' යනුවෙන් පැවැසීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ මුහම්මදු (සල්) තුමා 'ඇඟිල්ලෙන් කෙනිත්තීම කෙනෙකු (සාදාරණයෙන්) කෙසේ ගණන් ගන්නේද, එසේම, (අල් ලාහ්ගේ මගෙහි) දිවි පුදන්නා තමා ඝාතනය කිරීමද ගණන් ගනී' යැයි ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා 'ස්වර්ගයෙහි පිවිස සිටින්නන් අතර, (ශුද්ධවූ සටනෙහි) දිවි පුදකළ අය හැර අන් කව රෙකු හෝ මෙලොවෙහි සියළුම දේ ලැබුනත්, මෙලොව කරා නැවත ඒමට අකැමැතිවේ. අල්ලාහ් ඔහුට (දිවි පුද කළ අයට) ලබාදී ඇති දායාදයෙහි වටිනාකම දිටීමෙන් ඔහු පමණක් මෙලොව කරා නැවත පැමිණ අල්ලාහ්ගේ මාර්ගයෙහි දස වතාවක් තමා ඝාතනය කළ යුතු බවට සිතයි' යැයි ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)**

▶▶ 'දිවි පුදන්නාගේ ණය හැර අන් සැම පාපයන් අල්ලාහ් සමා කරන්නේය' යැයි නබිනායක (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-පරිශුද්ධ යුද්ධයේ සටන් කිරීමට උසස් තරාතිරමක් තිබේ. ස්වර්ගයෙහි පිවිසීමට මෙය ඉමහත් කාරණයක් ලෙසට පත්වේ.
2-දිවි පුදන්නාට ඉමහත් කුලියක් ලැබේ. සාතනයෙහි වේද නාව ඔහුට සරලවේ.
3-දිවි පිදීම පාපයන් සියල්ල කෙරෙහි පව් සමාව ලැබීමට ඉමහත් හේතුවේ.

# 59-ජිහාදයෙහි නබිතුමාගේ ශ්‍රාවකරුවන්

▶▶බද්රය (යනු ප්‍රථම යුද්ධය සිදුවූ ස්ථානය) කරා පිටත්වූ නබි මුහම්මදු (සල්) තුමා සහ එතුමාගේ ශ්‍රාවකරුවන් අවසානයේ මුෂ්රික් වරුන්ට (මුස්ලිම් වරුන්ට විරුද්ධව යුද්ධ කිරීමට පැමිණි ආදේශ කරුවන්) පෙරාතුරුව බද්ර යට පැමිණියහ. පසුව මුෂ්රික් වරුන්ද එහි පැමිණියහ. එකළ නබිතුමා 'ඔබලා කුමන තැනකට ගියද, එහි ඔබ ලාට පෙරාතුරුව මා නොපැමිණ සිටිය නොහැක.

පසුව, මුෂ්රික් වරුන්ද එහි සමීපව පැමිණ කළ නබිතුමා 'ස්වර්ගය ලබාගැනීම සඳහා නැගිට්ට පැමිණෙන්න. එකී පළල අහස් හා පොලෝ තලයෙහි ප්‍රමාණවේ' යනුවෙන් පැවැසීය. එවිට උමෛර් බින් හිමාම් (රලි) තුමා 'අල්ලාහ් ගේ දූතයාණෙනි, අහස් හා පොලොවෙහි ප්‍රමාණ ස්වර්ග යද ?' යැයි විමසීය. එවිට එතුමා 'ඔව්' යනුවෙන් කී විගස උමෛර් (රලි) තුමා 'ආහා ආහා' යැයි කීය.

'ආහා ආහා යැයි ඔබ කීමට උනන්දු කළේ කුමක්ද ?' යනුවෙන් නබිතුමා විමසූ කළ උමෛර් (රලි) තුමා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මම ස්වර්ග වැසියෙක් වීමේ ආශාවෙන් එසේ කීමි' යනුවෙන් කීය. එයට නබිතුමා 'නියත වශයෙන්ම, ඔබ ස්වර්ග වාසියකි' යනුවෙන් පැවැසීය. පසුව ඔහු සිය ර්තල කුඩුවෙන් ඉඳි ස්වල්පයක් ර්ගෙන එය අනුභව කළේය. පසුව, යුද්ධයෙහි යෙදී සිය දිවිය පුද කරන තෙක් සටන් කළේය. මේ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ මාගේ පුංචි පියාවූ අනස් බින් නල්රු (රලි) තුමා බද්ර් යුද්ධයට සහභාගි නොවීය. ඔහු (නබි මුහම්මදු (සල්) තුමා අමතා) 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මුෂ්රික් වරුන්ට එරෙහිව යෙදෙන යුද්ධයේ අල්ලාහ් මාව සහභාගි කළේ නම්, මා කෙසේ ක්‍රියා කරන්නෙව්ද යන්නෙහි අල්ලාහ් දනී' යනුවෙන් කීය.

පසුව පැවැති උහද් යුද්ධ සමයේ මුෂ්රික් වරුන් යුද්ධයෙහි යෙදුනු අවස්ථාවේ ඔහු සටන් කරමින් ඉදිරියට ගියේය. එහිදී ඔහු සඃද් බින් මුආද් (රලි) තුමාව මූන ගැසීය. එවිට ඔහු සඃද් ඉබ්නු මුආද් (රලි) තුමා අමතා 'නල්රුගේ ස්වාමියා කෙරෙහි දිවුරා කියමි. උහද් කන්දට එහා සිට මම ස්වර්ගයෙහි සුගන්දය හැඟෙන්නෙමි' යැයි කීය. පසුව සඃද් (රලි) තුමා නබිතුමා වෙත පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, අනස් බින් නල්රු (රලි) තුමා ක්‍රියා කළ සේ මටනම් ක්‍රියා කළ නොහැක' යනුවෙන් කීය.

කඩුවෙන් හෝ හෙල්ලෙන් හෝ ඊතලයෙන් හෝ සිදුවූ අසූවකට වඩා අධික ප්‍රමාණ තුවාල ඔහුගේ ශරීරයෙහි අපි දිටිමු යනුවෙන් අනස් (රලි) වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ එක් ගැමියෙක් නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ එතුමාව පිළි ගෙන, අනුගමනය කළේය. පසුව ඔහු මා ඔබතුමා සමග යුද්ධයට පිටත්වන්නේද ? යනු වෙන් කීය. ඔහු ගැන නබිතුමා තම ශ්‍රාවකරුවනට යම් උපදේශයක් පැවැසීය. පසු දිනක පැවැති යුද්ධයක දී නබිතුමාට ලැබූ යුධ සම්පත් කීපයක් එතුමා බෙදා හැරි යේය. එයින් ඔහුටද කොටසක් වෙන්කර එය තම ශ්‍රාව කරුවන් මගින් ඔහුට යැව්වේය.

එම අවස්ථාවේ ඔහු ශ්‍රාවකරුවන්ගේ ඔටුන් තණ කැමට දක්කාගෙන සිටියේය. ඔහු පැමිණ විට ඔහුගේ කොටස ඔහුට පිරිනැමූහ. මෙය කුමක්ද? යැයි ඔහු විමසීය. මෙය නබිතුමා ඔබට ලබාදුන් කොටස බව ඔවුන් කීහ.

වහාම ඔහු නබිනායක තුමා හමුවට ගොස් නබිතුමනී, මෙය කුමක්ද ? යනුවෙන් වමසීය. එයට නබිතුමා 'මෙය ඔබ වෙනුවෙන් මා ලබාදුන් කොටසකි' යනුවෙන් පැවැසීය. එවිට ඔහු 'මම මෙය සඳහා ඔබතුමාව අනුගමනය නොකළෙමි' යනුවෙන් පවසා, තම උගුර සංඥා කරමින් මම ඔබතුමා අනුගමනය කරන්නේ මෙම ස්ථානයෙහි ඊතලයෙන් පහර ලබා සිය දිවිය පුදකර, ස්වර්ගයෙහි පිවිසීම සඳහාය' යනුවෙන් කීය. එය සවන්දුන් නබිතුමා 'ඔබ අල්ලාහ්ව සත්‍යය කළේ නම්, අල්ලාහ් ඔබව සත්‍යය කරයි' යනුවෙන් පැවැසීය.

ශ්‍රාවකරුවන් එම ස්ථානයේ ස්වල්ප වේලාවක් රැඳී සිට පසුව සතුරන් සමග යුද්ධ කිරීම සඳහා පිටත්ව ගියහ. එම යුද්ධයේදී ඔහු ඝාතනයට පත්විය. පසුව ඔහුව නබි තුමාගේ ඉදිරියට ඔසවා ගෙනෙනු ලැබින. ඔහු සංඥා කළ පරිදි ඔහුගේ උගුර ර්තල පහරෙන් තුවාලවී තිබින. 'මොහුද අර පුද්ගලයා?' යනුවෙන් නබිනායක තුමා විම සීය. එයට ශ්‍රාවකරුවන් 'ඔව්' බව කීහ. එකළ නබිතුමා 'ඔහු අල්ලාහ්ව සත්‍යය කළේය. අල්ලාහ්ද ඔහුව සත්‍යය කළේය' යනුවෙන් ප්‍රකාශ කළේය. මෙය ෂද්දාද් ඉබ්නු හාද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : නසාඉ)**

## ප්‍රයෝජන

1-නබිතුමාගේ ශ්‍රාවකරුවන්ට බලවත් විශ්වාසයද, අල්ලාහ් ගේ මගෙහි සිය දිවිය පුදකිරීමේ උනන්දුවද තිබින.
2-ඔවුන්ට වීරකම හා කුසල් ක්‍රියාවන් කරා යොමුවීමේ සීඝ්‍ර භාවය තිබින.

# 60-මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'මුස්ලිම්වරයා අන් මුස් ලිම්වරයාට සහෝදරයාය. ඔහුට ඔහු අපරාධ නොකරයි. ඔහුව ආරක්ෂා කරයි. කවරෙක් තම සහෝදරයාගේ අව ශ්‍යථාවය ඉටු කිරීමෙහි යෙදී සිටින්නේද, ඔහුගේ අවශ්‍ය තාවය ඉටු කිරීමෙහි අල්ලාහ් යෙදී සිටී. කවරෙක් හෝ මුස්ලිම් වරයෙකුගේ

පීඩාවක් ඉවත් කරන්නේද, ඔහුගේ පරලොව පීඩාවක් අල්ලාහ් ඉවත් කරයි. කවරෙක් හෝ මුස්ලිම් වරයෙකුගේ දුර්වලතාවයක් වසං කරන්නේද, පරලොව දිනයෙහි අල්ලාහ් ඔහුගේ දුර්වලතාවයන් වසං කරයි' යැයි පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් මුස්ලිම් වර යෙකුට මෙලොවෙහි සිදුවන පීඩාවක් ඉවත් කළේද, ඔහු ගේ පරලොව පීඩාවක් අල්ලාහ් ඔහුගෙන් ඉවත් කරයි. කවරෙක් ණය කරදරයෙන් ලක්වී සිටින්නාට (එය අත් හැර හෝ කල් දී හෝ) සැලකිල්ලක් ලබා දෙන්නේද, ඔහුට අල්ලාහ් මෙලොවෙහි හා එලොවෙහි සැළකිල්ලක් ලබා දෙයි. කවරෙක් මුස්ලිම් වරයෙකුගේ දුර්වලාවයක් වසං කළේද, අල්ලාහ් ඔහුගේ දුර්වලතාවයන් මෙලොවේ හා එලොවහේ වසං කරයි. දාසයෙක් තම සහෝදරයාට උපකාර කරන කළු අල්ලාහ් ඔහුට උපකාර කරමින් සිටී. කවරෙක් දැනුම් ඥානයක් ලබා ගැනීමේ මගෙහි යෙදෙන්නේද, ඔහුට අල්ලාහ් ස්වර්ගයට යාමේ මාර්ගය සරල කරයි.

කුමණ කණ්ඩායමක් අල්ලාගේ මස්ජිදයක එක් රැස්වී එහි අල්ලහ්ගේ ධර්ම ග්‍රන්ථය පාරායනා කර, ඔවුනතර පරස්පරව ඉගෙන ගන්නේද, ඔවුන් කෙරෙහි අල්ලාහ්ගේ කරුණාව පහළුවේ. ඔහුගේ දායාදයන් පිරිවරමින් පවතී. මලක්වරුන් ඔවුන් වටකර සිටිති. අල්ලාහ් ඔවුන් ගැන ඔහු සමග සිටින මලක්වරුන්ට ප්‍රකාශ කරයි. කවරෙකු ගේ ක්‍රියාව ඔහුව පසුබැමට ලක් කළේද, එවන්නාගේ වංශ භාවයට එය ඉදිරියට ගෙන යාමට නොහැකි වේ'

යැයි ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතාවන් ඉටුකිරීම සඳහා වෙහෙස දැරීම උතුම් කාර්යයකි. විශේෂයෙන් ඔවුන් අතර සිටින අසරණයන්ගේ අවශ්‍යතාවන් ඉටු කිරීම උතුම්ය. මන්ද යත්, ඔවුන්ගේ අවශ්‍යතාවන් ඔවුන්ට අති දුෂ්කරය.

2-කවරෙක් තම සහෝදර මුස්ලිම් වරයාට උපකාර කරන් නේද, ඔහුට අවශ්‍යවූවිට අල්ලාහ් ඔහුට උපකාර කරයි.

# 61-සුන්නා හා බිද්ආ

සුන්නා යනු නබි තුමාගේ මග යනුවෙන්ද, බිද්ආ යනු එයට පටහැනිව ධර්මය තුල ඇතුලත් කරනලද අදහස් හා ක්‍රියාවන් යනුවෙන්ද හැඳින්වේ.

▶▶'(ඕ : නබි, මිනිසුන්ට) ඔබ පවසන්න. ඔබලා අල්ලාහ්ව ප්‍රිය කරන්නේ නම්, මාව පිළිපදින්න. අල්ලාහ් ඔබලාව ප්‍රිය කරයි. තවද ඔබලාගේ පාපයන්ට සමාව ලබා දෙයි' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්–3:31)**

▶▶'නමුත්, ඔබගේ ස්වාමියා කෙරෙහි දිවුරා කියමි. සත්‍ය වශයෙන්ම, ඔවුන් තමන් අතර ඇතිවූ ආරාවුලේදී ඔබව විනිශ්චයකරු ලෙස කර, ඔබ දෙන්නා වූ තීරණය තම සිත්වල කිසිම අතෘප්තිභාවයෙන් තොරව සම්පූර්ණයෙන් පිළිගන්නා තෙක් ඔවුන් විශ්වාස වන්තයින් වන්නෝය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්–4:65)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් අපගේ මෙම ධර්මයෙහි නොමැති දෙයක් අලුතින් ඇති කරන්නේද, එය ප්‍රතික්ෂේප කළ යුතු දෙයක් වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමාණන් 'කවරෙක් අපි අණ නොකළ කාර්යයක් කරන්නේද, එය ප්‍රතික්ෂේප කරනු ලැබේ' යනුවෙන් ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා අපට සිත් ගැස්සී නෙත් වලින් කඳුලු හැලෙන විශිෂ්ඨ දේශනාවක් කළේය. අපි 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙය සමුගැනීමේ දේශනාවක් සේ පවතින්නේය. අපට (තවත්) දේශනා කරන්න' යනු වෙන් කීවෙමු.

එකළ නබිතුමා 'ඔබලා අල්ලාහ් කෙරෙහි බියකමෙන් සිටින ලෙසත්, හබෂා (ඉතියෝපියා)වෙ නීග්‍රෝ වහළෙක් ඔබලාට නායකයා වශයෙන් පත් කළත්, ඔහුට සවන්දී කීකරුවන ලෙසත් මම ඔබලාට අනුශාසනා කරමි. මින් ඉදිරියට ජීවත් වන්නන් නිශ්චය වශයෙන්ම, විවිධ මත මතාන්තර රැසක් දකිති. එකළ ඔබලා මාගේ මගද යහ මගෙහි ජීවත් වූ කලීෆා හෙවත් ජනාධිපති වරුන්ගේ මගද පිළිපැදිය යුතුයි. එනම්, මාගේ යහමග සිය හකු දතෙන් හපා තදෙන් අනුගමනය කරන්න. (ආගමික නාමයෙන්) අළුතින් ඇතිවන බිද්අත් කරුණු ගැන මම ඔබලාට අවවාද කරමි. නියතව, එසේ බිහිවන සෑම බිද්

අත් කරුණුම නොමගකි' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉර්ෆාල් බින් සාරියා (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා දේශනා කරන කළ 'නිශ්චයෙන්ම, වැකි අතර ඉමහත් උතුම් වැකි අල්ලාහ් ගේ වැකියකි. යහ මගෙන් උතුම් යහමග නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මගකි. ක්‍රියාවන් අතර නපුරුම ක්‍රියාව අළුතෙන් බිහිවූ බිත්අත් කරුණකි. සෑම බිත්අත් කරුණුම නොමගකි' යනුවෙන් ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

# ප්‍රයෝජන

1-ආගමෙහි බිද්අත් කරුණක් ඇති කිරීම තහනම්ය. මන්ද යත්, මෙය මුස්ලිම් වරයෙක් නබිතුමා මාර්ගය නොකළ කරුණක් මගින් අල්ලාහ්ට වන්දනාමාන කිරීමක් සේය.

2-බිද්අත් කිරීම ඉමහත් පාපයකි. මෙය නොපිළිගනු ලබන අතර එය ඔහු වෙතම නැවත යවනු ලැබේ.

3-සෑම බිද්අත් වර්ගවල සිටම වැළකී සිටීම අනිවාර්ය වේ. මක්නිසාදයත්. ඒවා සියල්ල නපුරු සහ නොමග යොමු කිරීමකි.

4-අල්ලාහ්ගේ ස්නේහය සහ ඔහුගේ පව් සමාව ලැබීමට අයත් මගනම්, නබිනායක තුමාව පිළිපැදීමය.

# 62-සලවාත් කීමෙහි විශේෂත්වය

▶▶'නියත වශයෙන්ම, අල්ලාහ් සහ ඔහුගේ මලක් වරුන් නබිතුමා කෙරෙහි සලවාත් කියති. (එබැවින්) විශ්වාස වන්තයිනි, ඔබලාද ඔහු කෙරෙහි සලවාතය හා සලාමය පවසන්න' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-33:56)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙකු මා කෙරෙහි වරක් සල්වාත් කියන්නේද, එය වෙනුවට අල්ලාහ් ඔහු කෙරෙහි දස වරක් සලවාත් පවසයි' යනුවෙන් ප්‍රකාශ කළ බවට අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'ඔබලාගේ දිනයන් අතර විශිෂ්ඨ දිනය සිකුරාදා (ජුම්ආ) දිනයකි. එදින මා කෙරෙහි අධිකව සලවාත් කියන්න. මන්ද යත්, ඔබලා පවසන සලවාතය සැබැවින්ම මාහට දන්වනු ලැබේ' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා පැවැසූවිට 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමා අභාව ප්‍රාප්තවී දිරාපත් වීමෙන් පසුව අපි පවසන සලවාත් ඔබ තුමා හමුවට කෙසේ දන්වනු ලබන්නේද ?' යැයි ශ්‍රාව කරුවන් විමසූහ. එවිට එතුමා 'නිසැකයෙන්ම, අල්ලාහ් නබි (වක්තෘ)වරුන්ගේ දේහ අනුභව කිරීම පොළොවට තහනම් කර ඇත' යැයි එතුමා පැවැසීය. මේ බව අව්ස් බින් අව්ස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මාගේ මිනීවල උත්සව පවත්වන ස්ථානයක් ලෙස නොකර ගන්න. මා කෙරෙහි සලවාත් කියවන්න. ඔබලා කුමන තැනක සිටියද, ඔබලා පවසන සලවාත් මා වෙත දන්වනු ලබන්නේය' යනුවෙන් පැවසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶'කවරෙක් හෝ මා කෙරෙහි සලවාත් පැවසුවේ නම්, ඔහුගේ සලවාතයට මම පිළිතුරු දෙන තෙක් අල්ලාහ් මාගේ ප්‍රාණය මාහට ලබා දෙන්නේය' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : අබූදාවූද්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මාගේ නාමය පවසන කළ කවරෙකු මා කෙරෙහි සලවාත් නොපැවැසුවේද, ඔහු විනාශයට පත් වේවා' යනුවෙන් පැවසූ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදී)**

## ප්‍රයෝජන

1-නබිනායක මුහම්මදු (සල්) තුමා කෙරෙහි සලවාත් කීම සතුටුදායක කරුණකි.
2-එය අධිකව කීම, විශේෂයෙන් සිකුරාදා දිනයෙහි කීම සතුටුදායක කරුණකි.
3-නබිනායක මුහම්මදු (සල්) තුමාණන් කෙරෙහි සලවාත් කියන්නාට කුලිය ලැබේ.

# 63-ණයකරුට අවකාශ ලබාදීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාට පෙර විසූ මිනි සෙකුගේ ප්‍රාණය මලක්වරුන් අත්පත් කර ඔහුගෙන් 'ඔබ කුසල් ක්‍රියාවන් කුමක් හෝ කර ඇත්තේද ?' යනු වෙන් විමසූහ. ඔහු 'කිසිවක් නොමැති' බව කීය. පසුව ඔවුන් ඔහුගෙන් 'ඒ බව කල්පනා කර බලන්න' යනු වෙන් කීහ. එකළ ඔහු 'මා මිනිසුන්ට ණයට (මුදල්) දුන් නෙමි. ණයෙන් පීඩනයට ලක්වූ අයට අධික අවකාශ ලබා දෙන ලෙසද, ණය නැවත ලබා දීමට හැකියාවන් ඇති අය සමග සැහැල්ලු ලෙස හැසිරෙන ලෙසද (මාගේ ණය එකතු කරන) තරුණයන්ට මම අණ කළෙමි' යනු වෙන් කීය' එකළ අල්ලාහ් 'ඔහු සමග අවංකභාවයෙන් හැසිරෙන' ලෙසට (මලක්වරුන් අමතා) පැවැසීය' යනු වෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'පුද්ගලයෙක් මිනිසුන්ට ණයට දෙමින් සිටීය. ඔහු (තම ණය මුදල් එකතු කරන) තරුණයා අමතා 'ණයෙන් කර දරයට ලක්වූ අය කරා ඔබ ගියේ නම්, ඔහු හා සමග සැහැල්ලු ලෙස හැසිරෙන්න. (එවිට) අල්ලාහ් අප සමග සැහැල්ලු ලෙස හැසිරෙයි' යනුවෙන් පවසා ඇත්තේය. පසුව ඔහු අල්ලාහ් හමුවට ගිය විට අල්ලාහ් ඔහු සමග සැහැල්ලු ලෙස හැසිරීය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶අබූ කතාදා (රලි) තුමා තමාගෙන් ණය ලබාගත් පුද්ගල යාව සෙවීය. ඔහු සැඟවිය. පසු දිනක ඔහු හමුවූ කල ඔහු තමා ණයෙන් ශ්‍රමයට ලක්වී සිටින බව කීය. එයට අබූ කතාදා (රලි) තුමා ‘අල්ලාහ් කෙරෙහි දිවුරා කියන් නේද ?’ යැයි විමසූ කළ ඔහු ‘අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි’ යනුවෙන් කීවේය. වහාම අබූ කතාදා (රලි) තුමා ‘කවරෙක් තමාව පරලොව දිනයෙහි ශ්‍රමයෙන් අල්ලාහ් ජය ලබා දීමට අදහස් කරන්නේද, ඔහු ණයෙන් ශ්‍රමයට ලක්වූ තැනැත්තාට අධික ලෙස අවකාශ ලබා දිය යුතුයි. නොඑසේ නම්, එම ණය අත් හැරිය යුතුයි’ යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව පැවසීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1–ණයෙන් ශ්‍රමයට ලක්වූ පුද්ගලයාට අධික අවකාශයක් ලබාදීම හෝ එම ණය අත්හැරීම සතුටුදායක කරුණකි.
2–එසේ කිරීම පරලොව දිනයෙහි ශ්‍රමයෙන් මිදීමට හේතු වේ.
3–මෙසේ කිරීම අල්ලාහ් දාසයා සමග සැහැල්ලු ලෙස හැසි රීමට හේතුවේ.

# 64–පොලිය පිළිබඳ අවවාදය

▶▶‘ෂෙතාන් පහර දීමෙන් කවරෙකුව සිහිය විකල්වීමට කළේද, එවැන්නෙකු නැගිටින්නා සේ හැර, (වෙනත් අන්දමකින් අන්තිම දිනයේ) පොලිය අනුභව

කරන්නන් නොනැගිටින්නෝය. එ(ම තත්වයට ඔවුන් ලක් වීම)ය නියතව වෙළෙඳාම පොලිය වැනිය යැයි සැබැවින්ම ඔවුන් කී නිසාය. තවද, අල්ලාහ් වෙළඳාම අනුමතකර, පොලිය තහනම් කළේය. එබැවින්, (ඔබලාගෙන්) කවරෙකු හට තම ස්වාමියාගෙන් (පොලිය ගැන අවවාදකර) උපදේශය පැමිණ, පසුව එයින් ඔහු වැළකී සිටියේද (ඔහු එයට) පෙර (ලැබ) ගිය දෙය ඔහුටය. තවද, ඔහුගේ කාර්යය අල්ලාහ් දෙසය. තවද, (මෙම අණය ලැබීමෙන් පසු) කවු රුන් (පොලිය ලැබීම දෙස) හැරෙන්නෝද ඔවුන් නිරයේ වැසියන්ය. ඔවුන් එහි නිරුරුව (රැඳී) සිටින්නන්ය. අල්ලාහ් (එහි කිසිම අභිවෘධියක් නොමැතිව) පොලිය නැතිකර දමන්නේය. තවද, දාන (අභිවෘධිය මගින්) වර්ධනය කරයි. තවද, පව් කර ප්‍රතික්ෂේප කරමින් සිටින එක් එක්කෙනාව අල්ලාහ් ප්‍රිය නොකරයි.

**(අල්කුර්ආන්–2:275,276)**

▶▶'විශ්වාස වන්තයෙනි, අල්ලාහ්ට බිය වන්න. තවද, ඔබලා (සත්‍ය) විශ්වාස වන්තයින් නම්, පොලියෙහි (අරගත් දෙය හැර) ඉතිරිය (නොගෙන) හැර දමන්න. එහෙයින් (අණ කළ පරිදි) ඔබලා නොකරන්නේ නම්, අල්ලාහ් ගෙන්ද ඔහුගේ දූතයාගෙන්ද සංග්‍රාමයේ නිවේදනය අර ගන්න. තවද ඔබලා (සමාව ඉල්ලා) පසුතැවිලිවී හැරුනේ නම්, ඔබලාගේ මුල් මුදල් ඔබලාට ඇත. ඔබලා (අධිකව අරගෙන ණයවුවන්ට කිසිම) අසාධාරණය නොකරන්න. (එසේම) ඔබලාද (මුල් මුදල් ලබා ගැනීමේදී) අසාධාරණ යට ලක් නොවන්නෙහුය' යැයි අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්–2:278.279)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'මහා පාපයන් හතකින් ඔබලා වැළකී සිටින්න' යනුවෙන් පැවැසූ කළ, ශ්‍රවකරු වන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඒවා කුමක්ද ?' යනුවෙන් විමසූහ. එයට නබිතුමා '(ඒවා) අල්ලාහ්ට ආදේශ කිරීම, හූනියම් කිරීම, හේතුවෙන් තොරව අනීතියෙන් ප්‍රාණයක් ඝාතනය කිරීම, පොලිය අනුභව කිරීම, අනාථයන්ගේ ධනය අනුභව කිරීම, යුධ පිටියෙන් පළා යාම හා විශ් වාසනීය අසරණ පතිවත් ස්ත්‍රීන්ට දොස් පද කීම' යනු වෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරී හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා පොළිය ලබා ගන්නාට හා ලබා දෙන්නාට ශාප කළ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-පොලිය ගැනීම ඉමහත් තහනමකි. මෙය විනාශය ගෙන දෙන මහා පාපයන් අතර එකකි.

2-එය විස්තීර්ණ භාවය විනාශ කරයි. පොළිය අඛණ්ඩව අනුභව කරන්නාට එරෙහිව අල්ලාහ් හා ඔහුගේ දූත වරයා යුධ ආඥාව ප්‍රකාශ කරති.

3-පොළිය ලබා ගන්නා හා ලබා දෙන්නා නබිනායක තුමා ගේ ශාපයට ලක්වෙති.

# 65-අල්කුර්ආනයයෙහි විශේෂත්වය

▶▶'ඔබලාගෙන් කවරෙක් හෝ සිය නිවසට පැමිණිවිට ඉතා මහත් ගර්භනී ඔටුවන් තුන් දෙනෙක් ලබා ගැනීමට කැමැති වන්නෙහුද ? යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා අපෙන් විමසූ කළ අපි 'ඔව්' යනුවෙන් කීමු. එකළ නබිතුමා 'ඔබලාගෙන් කෙනෙකු සිය සලාතයෙහි පාරායනා කරන වැකි තුනක්, ඉතා මහත් ගර්භනී ඔටු වන් තුන් දෙනෙකු ලැබීමට වඩා ඔහුට උතුම්ය' යැයි පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'කවරෙක් අල්ලාහ්ගේ ධර්ම ග්‍රන්ථයෙන් එක් අකුරක් පාරායනා කරන්නේද, ඔහුට එක් කුසලක් ලැබේ. එක් කුසලක් යනු, එවන් දශ ගුණයකි. අලිෆ් ලාම් මීම් (الم) එක් අකුරක් බව මම නොකියමි. එනමුත්, අලිෆ් එක් අකුරකි. ලාම් එක් අකුරකි. මීම් එක් අකුරකි' යනු වෙන් ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶'කවරෙක් දක්ෂකමින් අල්කුර්ආනය පාරායනා කරන් නේද, ඔහු ගෞරවනීය යහපත්ශීල මලක්වරුන් සමග සිටී. කවරෙකු ඉතා ශ්‍රමයෙන් ගොතා ගොතා පාරායානා කරන්නේද, ඔහුට කුලි දෙකක් ලැබේ' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අල්කුර්ආනය පාරායනා කිරීමේ විශේෂය.
2-පාරායනා කරන සෑම අකුරක් සඳහාම කුසලක් ලැබේ.
3-දක්ෂකමින් පාරායාන කරන්නා ස්වර්ගයෙහි මලක්වරුන් සමග සිටී.
4-ශ්‍රමයෙන් පාරායානා කරන්නාට කුලි දෙකක් ලැබේ.

# 66-සූරා බකරා හා ආලඉම්රාන්හි විශේෂත්වය

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගේ නිවැස් මිනී වළ ලෙස නොපවත් වන්න. කුමන නිවසෙහි සූරා බකරා පරිච්ඡේදය පාරායානා කරනු ලබන්නේද, සැබැවින්ම, සාතාන් එහි සිට බියවී පලා යයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්කුර්ආනය පාරායනා කරන්න. නිශ්චයෙන්ම, එය පරලොව දිනයෙහි තමාව පාරායනා කළ අය වෙනුවෙන් නිර්දේශ කරන්නෙකු සේ පැමිණේ. සුදු සෞන්දර්යමත් බකරා සහ ආලඉම්රාන් යන පරිච්ඡේදයන් දෙක පාරායනා කරන්න. මන්දයත්, එම පරිච්ඡේදයන් දෙක පරලොව දිනයෙහි වළාකුලු ලෙස හෝ සෙවණැල්ල ලබා දෙන කුඩයක් ලෙස හෝ පියාඹන පක්ෂි රංචුවක් ලෙස හෝ පැමිණේ. ඒවා පාරා යනා කළ අය වෙනුවෙන් එය තර්ක කරයි. බකරා

පරිච්ඡේදය පාරායනා කරන්න. එය පාරායනා කිරීම අභිවෘධියකි. එය පාරායානා නොකර සිටීම පාඩුවකි. එම අභිවෘධිය ලබා ගැනීම කාල කන්නියන්ට නොහැකි වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ උමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් රාත්‍රියෙහි බකරා පරිච්ඡේදයේ අවසන් වැකි දෙක පාරායනා කරන් නේද, එයම ඔහුට ප්‍රමාණවත්වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-බකාර හා ආලඉම්රාන් යන පරිච්ඡේදයන්ට විශේෂ භාව යක් තිබේ.

2-එම පරිච්ඡේදයන් දෙක ඒවා පාරායනා කරන්නා වෙනු වෙන් තර්ක කරයි.

3-බකරා පරිච්ඡේදය පාරායනා කිරීම සාතාන්ව නිවැසින් පිටමන් කරයි.

4-බකරා පරිච්ඡේදයෙහි අවසන් වැකි දෙක පාරායනා කිරී මටද විශේෂයක් තිබේ.

# 67-අල්ලාහ්ගේ මගෙහි වියදම් කිරීම

▶▶ 'දාසයන් සෑම දා උදෑසන සමයට පැමිණෙන විට ඔහු කරා මලක් වරුන් දෙදෙනෙකු පැමිණෙති. ඔවුන්ගෙන් කෙනෙක් 'ස්වාමිණී, ඔබගේ මගෙහි වියදම් කරන්නාට කුසල ලබා දෙනු මැනවි'

යනුවෙන්ද, 'ඔබගේ මගෙහි වියදම් නොකර සඟවන්නාට විනාශය ලබා දෙනු මැනවි' යනුවෙන්ද ප්‍රාර්ථනා කරන බව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කරන පින ධනය ඌන නොකරයි. දාසයෙක් කෙනෙකුට සමාව දීමෙන් ඔහුගේ ගෞරවය අල්ලාහ් උසස් නොකර නොසිටී. කවරෙක් අල්ලාහ් වෙනුවෙන් බැගෑපත්කමින් හැසිරෙන්නේද, අල්ලාහ් ඔහුව උසස් නොකර නොසිටී' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'අල්ලාහ් පවිත්‍රභාවය හැර අන් කිසිවක් පිළි නොගන්නා බැවින්, කවරෙක් හෝ පවිත්‍ර ජීවනෝපායෙන් එක් ඉඳි යක් හෝ පින් කළේනම්, එය අල්ලාහ් සිය දකුණු අතින් පිළිගනී. පසුව ඔබලා අශ්ව පැටියෙක් හදා වඩා ගන්නා සේ අල්ලාහ් එය පින් කළ අය වෙනුවෙන් කන්දක ප්‍රමාණය වන තෙක් හදා වඩා වර්ධනය කරයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ 'පුද්ගලයෙකුට අල්ලාහ් ධනය (පොහොසත්කම) ලබා දී එය සත්‍යයෙහි වියදම් කිරීමේ හැකියාවද ලබා දී ඇත. තවත් පුද්ගලයෙකුට අල්ලාහ් දැනුම් ඥානය ලබා දී ඔහු එය (අන් අයට) ඉගැන්වීමෙහි හා එමගින්

විනිශ්චය කිරීමෙහි නිරතවී සිටී. මෙම පුද්ගලයන් දෙන්නෙකු කෙරෙහි හැර අන් කිසිවෙකු කෙරෙහි හෝ ඊර්ෂ්‍යාව නොකළ යුතුයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-පින් කිරීම හා අල්ලාහ්ගේ මගෙහි වියදම් කිරීම පිළිබඳ විශේෂත්වය.

2-අනුමත මාර්ගයෙන් උපයාගත් දේයින් කරන පින් (පම ණක්) පිළිගනු ලැබේ.

3-පින් කිරීම ධනයෙහි වර්ධනය වීමට හා එහි විස්තීර්ණ භාවය ඇති වීමට හේතුවේ.

# 68-දානය කිරීමෙහි විශේෂත්වය (1)

▶▶'දානය ගැන, නැතිනම් (මඃරූෆ් නම්) හොඳ දෙය ගැන, නැතිනම් මිනිසුන් අතරෙහි සමාදානය ඇති කිරීම පිළි බඳව අණ කළ කෙනා හැර, ඔවුන් කථා කරන රහස්හි බොහෝ දේහි කිසිම යහපතක් නොමැත. තවද, යමෙක් අල්ලාහ්ගේ සෙනහස සොයා එය කළේනම්, අප ඔහුට ඉමහත් (හොඳ) කුලිය දෙන්නෙමු' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-4:114)**

▶▶'කුමණ දෙයක් ඔබලා වියදම් කළද, එයට යුතු දෙය ඔහු පිරිනමයි' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-34:39)**

▶▶ මම නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණිමි. එකළ එතුමා 'ධනය ගුණ කිරීමේ ආශාව (පරලොව දින කෙරෙහි) ඔබලාව නොසැළකිලිමත් කළේය (102:1)' යන වැකිය පාරායනා කර, 'මිනිසා මගේ ධනය, මගේ ධනය යනුවෙන් පවසයි. නියත වශයෙන්ම, ඔබ අනුභව කර නැති කළ හෝ ඔබ ඇඳුම් ඇඳ නැති කළ හෝ ඔබ දානය කර වියදම් කළ හෝ දෙය හැර ඔබගේ ධනය වෙනත් කුමක් තිබේද ?' යනුවෙන් ප්‍රකාශ කළ බව අබ් දුල්ලාහ් බින් සිග්ගීර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ 'පුද්ගලයෙක් මුඩු බිමක සිටින කළ 'මෙම මිනිසාගේ වත්තෙහි වර්ෂාව වස්සවනු මැනවි' යනුවෙන් වලාකුළෙන් සිට නාදයක් ඇසීය. වහාම එම වලාකුළ ගමන් කර ගෙන ගොස් ගල් පරවූ ස්ථානයක තම ජලය ඉස්සීය. එහි පිහිටා ඇති ඇලක් එකී සැම ජලයම උරා ගත්තේය. එම පුද්ගලයා එම ජලය ලුහු බඳිමින් ගමන් කරන කළ එහි එක් වත්තතක මිනිසෙක් උදෙල්ලෙන් ජලය සපයා ගෙන සිටීය.

ඔහු ඔහුව අමතමින් 'අල්ලාහ්ගේ දාසයනි, ඔබගේ නම කුමක්ද ?' යනුවෙන් විමසීය. එවිට ඔහු වලාකුළෙන් තමා සවන්දුන් නමම පවසා, අල්ලාහ්ගේ දාසයනි, මගේ නම විමසන්නේ කුමක් නිසාද ? යනුවෙන් ඇසීය. එයට ඔහු 'මෙම ජලය කුමන වලාකුළෙන් සිට පැමිණියේද, එම වලාකුළෙන් ඔබගේ නම පවසා 'මෙම මිනිසාගේ වත්තට වර්ෂාව වස්සවනු මැනවි' යන ශබ්දයක් මම සවන් දුනිමි' යනුවෙන් කීය.

පසුව එම පුද්ගලයා නැවත ඔහුව අමතා 'ඔබ මෙහි කුමක් කරන්නේද ?' යනුවෙන් විමසීය. එයට ඔහු 'ඔබ මෙසේ විමසනවිට මා කිව යුතුමයි. මෙම වත්තෙහි පැළ වන දෙයින්, තුනෙන් කොටසක් දානය කරමි. (තවත්) තුනෙන් කොටසක් මම හා මාගේ පවුලේ අය අනුභව කරමු. (ඉතිරි) තුනෙන් කොටසක් නැවත මෙම වත්තෙහි වගා කරමි' යනුවෙන් පිළිතුරු දුන්නේය. මෙසේ නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබු හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය: මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-දානය කිරීම විශේෂ ක්‍රියාවකි.
2-එය ධනයෙහි අභිවෘධිය හා බරකත් හෙවත් ආශිංසනය වර්ධනයවීමට හේතුවේ.
3-මුස්ලිමෙකුට ඉතිරිව පවතින්නේ ඔහු කළ දානය පමණය.

# 69-දානය කිරීමෙහි විශේෂත්වය (2)

▶▶'ඔබලා හොඳ දෙයින් කුමක් වියදම් කළද එය ඔබලාටමම යහපතකි' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-2:272)**

▶▶'පරලොව දිනයේ මිනිසුන් අතර විනිශ්චය කරන තෙක් සෑම මිනිසාම තමා කළ දානයේ සෙවණැල්ලෙහි සිටිති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව උක්බා බින් ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

▶▶'ඉඳි භාගයක් දානය කර හෝ නරකාදියෙන් ඔබලාව ආරක්ෂාකර ගන්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අදී බින් හාතම් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'නිත්‍ය දානය, ප්‍රයෝජනවත් දැනුම් ඥානය හා තමා ගැන ප්‍රාර්ථනා කරන විනය ගරුක දරුවා යන කරුණු තුනක් හැර මිනිසෙකු මිය යාමෙන් ඔහුගේ ක්‍රියාකර කම් සියල්ල විසන්ධිවේ' යැයි නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

## ප්‍රයෝජන

1–දානය කිරීම පරලොව දිනයෙහි බිය ජනක භාවයෙන් ජයග්‍රහණය කිරීමට හේතුවේ.
2–කළ දානය සුළුවෙන් හෝ වේවා, එය නරකාදියෙන් නිද හස්වීමට හේතුවේ.
3–දානය කළ තැනැත්තාගේ මරණයෙන් පසුද එකී කුලිය ඔහුට අඛණ්ඩව ලබමින් පවතී.

# 70–විශේෂ දානය

▶▶'පොහොසත්ව සිටිනවිට කරන දානය විශේෂ දානයකි. ඔබ දානය කිරීම සමීප ඥාතීන්ගෙන් සිට පටන් ගන්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් වෙත පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඉමහත් කුලිය ලබා දෙන දානය කුමක්ද ?' යනුවෙන් විමසීය. එයට නබිතුමා 'එය ධනය ලැබීම අපේක්ෂාකර, දිළිඳුකමට පත්වේ දැයි බියවී දේහ ආරෝග්‍යයෙන් හා ලෝභකමින් සිටින කළ ඔබ කරන දානය ඉමහත් කුලිය ලබා දෙන දානයකි. පණ උගුරු දන්ඩට පැමිණෙන මරණාසන්න මොහොතේ ඔහුට මෙපමණ දෙන්න මොහුට මෙපමණ දෙන්න යනු වෙන් පවසන අවස්ථාව පැමිණෙන තෙක් දානය කිරීම කල් නොතබන්න. එම අවස්ථාවේ එම ධනය (ඔබගේ හිමිකරුවන් වන) වෙනත් අයට හිමිවෙමින් පවතී' යනු වෙන් පැවැසීය. මේ බව අබූහුරෛා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'දිළින්දෙකුට දානය කරන්නාට දානය කිරීමේ කුලිය පමණක්ද, ඥාතියෙකුට දානය කරන්නාට දානය කිරීම සහ ඥාතිත්වය රැකීම යන කුලි දෙකක්ද ලැබේ' යනුවෙන් ප්‍රකාශ කළ බව සල්මාන් බින් ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-අවශ්‍යවූ ඥාතීන්ට දානය කිරීම අන් අයට දානය කිරීමට වඩා උතුම්ය.

2-පුද්ගලයෙක් නීරෝගි භාවයෙන් සිටින කළ, දිගු කලක් ජීවත්වීමට අපේක්ෂා කරන කළ හා දිළිඳුකම කෙරෙහි බියෙන් සිටින කළ කරන දානය උතුම් දානයකි.

# 71-රහස්ගතව දානය කිරීම

▶▶'ඔබලා ප්‍රසිද්ධව දානය කළේ නම් එයද හොඳය. තවද, එය ඔබලා රහසිගතව දුප්පතුන්ට දුන්නේනම්, එය ඔබ ලාට වඩාත් හොඳය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්-2:271)**

▶▶'අල්ලාහ්ගේ සෙවණැල්ල හැර අන් කිසි සෙවණැල්ලක් හෝ නොමැති දිනයේ අල්ලාහ් හත් දෙනෙකුට පමණක් සිය අර්ෂයෙහි සෙවණැල්ල ලබා දෙයි. ඔවුහු, යුක්ති සහගතව ක්‍රියා කළ නායකයා, අල්ලාහ්ගේ වන්දනාමා නයෙහි තියලී සිටි තරුණයා, මස්ජිදය කරා සිය ආත් මාව යොමු කළ පුද්ගලයා, අල්ලාහ් වෙනුවෙන් ප්‍රියකර ඒ අනුව මිත්‍රවී හා ඒ අනුව වෙන්වූ පුද්ගලයන් දෙන්නා, උසස් වංශයේ හා සෞන්දර්යමත් ස්ත්‍රියෙක් දුරාචාරයට කැඳවන කළ 'මම අල්ලාහ් කෙරෙහි බියවන්නෙමි' යනු වෙන් පැවැසූ පුද්ගලයා, තම වම් අත නොදැනෙන පරිදි සිය දකුණු අතින් රහසිගතව දානය කරන්නා හා තනිව සිට අල්ලාහ්ව සිහි කරමින් කඳුළු හෙලෙන පුද්ගලයා යන්නන්ය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබුහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ප්‍රසිද්ධව කරන දානයට වඩා රහසිගතව කරන දානය උතුම්ය.

2-රහසිගතව දානය කරන්නාට පරලොව දිනයේ අල්ලාහ් සිය අර්ෂයෙහි සෙවණැල්ල ලබා දෙයි.

# 72-ප්‍රසිද්ධව දානය කිරීම

▶▶අපි එක් පෙරවරුවෙහි නබිනායක මුහම්මදු (සල්) තුමා හා සමග සිටින කළ පාවහන් නොපැළඳ හා ප්‍රමාණවත් ඇඳුම් නොපැළඳමින් එක් කණ්ඩායමක් පැමිණියහ. ඔවුහු සළුව හා පොරෝනයෙන් පොරවාගෙන හා කඩු එල්ලා ගනිමින් සිටියහ. ඔවුන් සැම දෙනා මුලර් ගෝත්‍ර යට අයත් පිරිස්ය. ඔවුන්ගේ දිළිඳුකම දුටු නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මුහුණ වෙනස් විය. එතුමා වහාම තම නිවසට ගොස් පසුව නැවත පැමිණ අදානය (සලාතයට කැඳවීම්) කරන ලෙස බිලාල් (රලි) තුමාට අණ කළේය. ඔහු අදානය හා ඉකාමතය (සලාතය ආරම් භවීම දැනුම්දීම) කීය. පසුව නබිතුමා ඔවුන්ට සලාතය ඉටුකළ පසු දේශනාවක් කළේය. එම දේශනයෙහි…

'මිනිසුනි, ඔබලා ඔබලාගේ ස්වාමියාට බියව (ක්‍රියා කර)න්න. ඔහු කවරෙකු නම් ඔබලාව එක් ආත්මාවෙහි සිට නිර්මාණය කළේය. එ(ම ආත්මාවෙ)හි සිට එ(ම ආත්මාවෙ)හි බිරියද නිර්මාණය කළේය. තවද, මෙම දෙදෙනාගෙන් අධික පිරිමින්ද ගැහැණුන්ද පැතිරීමට සැළැස්වූයේය. තවද අල්ලාහ් මගින් (තමන්ගේ අයිතීන්) ඔබලා (එකිනෙකා) අසාගන්නෝද (එවන්) ඔහු ගැනද තවද ලේ නෑ සම්බන්ධතාවය (බිඳ දැමීම) ගැනද ඔබලා බිය වන්න. නියතව, අල්ලාහ් ඔබලාව පරීක්ෂාවෙන් බලා සිටින්නා ලෙස සිටී.

**(අල්කුර්ආන්-4:1)**

'විශ්වාස වන්තයෙනි, ඔබලා අල්ලාහ්ට බියවන්න. එක් එක් ආත්මාව (අන්තිම දිනය වූ) හෙට වෙනුවෙන් තමා කුමක් පෙරටු කළේද යන්න බලත්වා. තවද, ඔබලා අල් ලාහ්ට බියව (ක්‍රියා කර)න්න. නියතව, අල්ලාහ් ඔබලා කරන දෙය හොඳින් දැන හඳුන්නාය.

**(අල්කුර්ආන් – 59:18)**

යන අල්කුර්ආනයේ වැකි පාරායනා කළ පසු 'කවරෙක් හෝ තමා සතුව ඇති දීනාරයෙන්ද දිර්හමෙන්ද, ඇඳු මෙන්ද, තිරිඟු පිටි සාඅකින්ද, ඉඳි සාඅකින්ද නොඑසේ නම්, ඉඳි භාගයක් හෝ දානය කරන්න' යනුවෙන් පැවැසීය. වහාම අන්සාර්වරු (මදීනාවාසීන්)ගෙන් කෙනෙකු උසුලීමට නොහැකි බරක් සහිත පසුම්බියක් රැගෙන ආවේය. පසුව මිනිසුන් එක් එක්කෙනා එසේම (රැගෙන) ආහ. අවසානයේදී ආහාර හා රෙදිවලින් යුත් ගොඩ දෙකක් දකින්නට වීමි. එවිට නබිනායක තුමාගේ මුහුණ රත්රන් සේ දිළිසීමද මම දිටිමි. එවිට නබිතුමා 'කවරෙක් ඉස්ලාම්හි යහපත් කරුණක් ඇති කළේද, ඔහුට එයට අදාල කුලියද, ඔහුට පසු ඒවා පිළිපදින්නන්ට ලැබෙන කුලියද ඔහුට ලැබේ. නමුදු ඔවුන්ගේ කුලියෙන් කිසිවක් හෝ අඩුවක් නොසිදුවේ. එසේම, කවරෙකු ඉස්ලාම්හි අයහපත් කරුණක් ඇති කළේද, ඔහුට එයට අදාල පාප යද, ඔහුට පසුව ඒවා පිළිපදින්නන්ට ලැබෙන පාපයද ඔහුට ලැබේ. නමුදු, ඔවුන්ගේ පාපයෙන් කිසිවක් හෝ අඩුවක් නොසිදු වේ' යැයි පැවැසීය. මේ බව ජරීර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-යහපත් ආදර්ශයක් උදෙසා ප්‍රසිද්ධව දානය කිරීමට ඉස් ලාම් ධර්මය අණ කරයි.

2-මෙසේ ප්‍රසිද්ධියෙන් දානය කිරීම මූනිච්චාවක් නොවන් නේය. නමුදු එය කුසල් කිරීමට ආදර්ශයක් ලෙස පවතී.

# 73-සිඟමන් කර හා නොකර ලබාගැනීම

▶▶'මිනිසුන්ගෙන් සිඟමන් කරමින් සිටින මිනිසා පරලොව දිනයෙහි මස් මාංශ නොමැති මුහුණෙන් පැමිණේ' යනු වෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ් දුල්ලාහ් බින් උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් මම යමක් අයැ දීමි. එතුමා මට ලබා දුන්නේය. පසුව (නැවත) අයැදීමි. එතුමා ලබා දුන්නේය. පසුව (නැවත) අයැදීමි. එතුමා නැවත ලබා දුන්නේය. පසුව එතුමා 'හකීම්, සැබැවින්ම මෙම ධනය කොළ පැහැයෙන් (සෞන්දර්ය) හා මිහිරි රසෙන් යුත් දෙයකි. කවරෙක් එය (සිඟමන් නොකර) උතුම් සිත් සතනින් ලබා ගන්නේද, ඔහුට එහි අභිවෘධිය කරනු ලැබේ. කවරෙක් තණ්හා සිතුවිල්ලෙන් ලබා ගන් නේද, ඔහුට එහි අභිවෘධිය කරනු නොලැබේ. මෙවැන්නා ආහාර අනුභව කළත් කුස නොපිරුණු අය සේය. ඉහ ළින් ඇති (දානය කරන) අත පහළින් ඇති (ලබාගන්නා) අතට වඩා උතුම්ය' යනුවෙන් පැවැසූ බව හකීම් බින් හිසාම් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා මාහට යමක් ලබා දුන් නේය. එකළ මා '(නබිතුමනි) මාහට වඩා ඉතා අවශ්‍ය වුවන්ට මෙය ලබා දෙන්න' යනුවෙන් කීමි. එවිට එතුමා 'ඔබ මෙය ලබා ගන්න. ඔබ තණ්හා නොවී හා සිඟමන් නොකර මෙවන් දේ ඔබට ලැබෙන්නේ නම්, එය ඔබ ලබා ගන්න. ඔබ තණ්හාවී හා සිඟමන් කරමින් ලබාගත යුතු නම්, ඔබ සිත්සතන හා ලුහුබැඳ නොයන්න' යැයි පැවැසූ බව උමර් (රළි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-අනවශ්‍ය හේතූන් මත මිනිසුන්ගෙන් සිඟමන් කිරීම තහ නම්ය.

2-අත පෑමෙන් තොරව ලැබෙන දේ ලබා ගැනීම අනුමතකි.

# 74-සමහර තහනම් කියමන්

▶▶ 'කාලයට දොස් නොකියන්න. මක්නිසාදයත්, සැබවින්ම කාලය අල්ලාහ් මයවේ' යනුවෙන් මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රළි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා 'අල්ලාහ් සිතූ පරිදි හා මෙම පුද්ගලයා සිතූ පරිදි සිදුවිය' යැයි නොපවසන්න. අල්ලාහ් ගේ සිතුවිල්ලට පසු මෙම පුද්ගලයා සිතූ දේ සිදුවිය යැයි පවසන්න' යැයි පැවැසූ බව හුදෛෆා (රළි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

▶▶'අල්ලාහ් සිතූ පරිදි සහ මුහම්මදු සිතූ පරිදි සිදුවිය යැයි නොපවසන්න' යනුවෙන් මුහම්මදු (සල්) තුමා පැවැසූ බව තුෆයිල් බින් සග්බරා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : අහ්මද්)**

## ප්‍රයෝජන

1–කාලයට දොස් කීම තහනම්ය.

2–අල්ලාහ් සිතූ පරිදි හා මෙම පුද්ගලයා සිතූ පරිදි සිදුවිය යැයි කීම තහනම්ය. නමුදු, අල්ලාහ්ගේ සිතුවිල්ලට පසු මෙම පුද්ගලයා සිතූ දේ සිදුවිය යැයි කිව යුතුයි.

# 75–මරණය සිහි කිරීම හා එයට ආශා නොවීම

▶▶'ප්‍රීතිය විසන්ධි කරන මරණය ගැන ඔබලා අධිකව සිහි කර ගන්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදී)**

▶▶'ඔබලාගෙන් කවරෙක් හෝ තමාට සිදුවූ කරදරය හේතු කොට ගෙන මරණය ප්‍රිය නොකරන්න. එසේ ප්‍රිය කළ යුතුම නම්, ස්වාමිනි, මම ජීවත්වීම මාහට යහපතක් ලෙස පවතින කල් මාව ජීවත් කරවන්න. මම නැසී යාම මට යහපතක් වන්නේ නම්, මාව මරණයට පත් කරන්න යැයි කියන්න' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'ඔබලාගෙන් කවරෙක් හෝ මරණය ප්‍රිය නොකරන්න. එය පැමිණීමට පෙර එය නොඅඬගසන්න. කුමක්නිසාද යත්, ඔබලාගෙන් කෙනෙකු නැසී ගියේනම්, ඔහුගේ ක්‍රියාවන් සියල්ල ඔහුගෙන් විසන්ධි වේ. නිසැකයෙන්ම, විශ්වාස වන්තයෙකුට ඔහුගේ ජීවිත කාලය ඔහුට කුසල වර්ධනය කරයි' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අධිකව මරණය සිහි කිරීම සතුටුදායක කරුණකි.
2-කරදර සිදුවන අවස්ථාවල මරණය ප්‍රිය කිරීම තහනම්ය.

# 76-මරණාසන්න මොහොත

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් මරණාසන් නට ලක්වූ තැනැත්තාට ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කියා දෙන්න' යැයි ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙකුගේ අවසන් කියමන ලා ඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවතින්නේද, ඔහු ස්වර්ගයෙහි පිවිසේ' යනුවෙන් පැවැසූ බව මුආද් බින් ජබල් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදී)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා අභාප්‍රාප්ත වීමට දින තුනකට පෙර දිනක් එතුමා 'ඔබලාගෙන් කවරෙක්

හෝ අල්ලාහ් කෙරෙහි යහපත් චේතනාවක් නොමැතිව නැසී නොයන්න' යනුවෙන් කළ ප්‍රකාශයට තමා සවන් දුන් බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ෂහාදා වදනෙහි විශේෂත්වය.
2-මරණාසන්නයේ සිටින කෙනෙකුට ෂහාදාව කිව යුතුයි.
3-අල්ලාහ් කෙරෙහි යහපත් සිතුවිල්ලෙන් සිටිය යුතු බවට අණ කර ඇත.

# 77-ක්‍රියාවන් එහි නිමාව අනුව තීන්දු කිරීම

▶▶'සැබැවින්ම, ඔබලාගෙන් කෙනෙකු සිය මවගේ කුසෙහි දින හතලිහක් ධාතු ස්ථාවරයෙන් සිටී. පසුව එසේම (දින හතලිහක්) ගර්භාෂයේ එල්ලා සිටින ස්ථාවරයෙන් සිටී. පසුව ඔහු එසේම (දින හතලිහක්) මස් මාංශ ලෙස පරිවර්තනය වේ. පසුව අල්ලාහ් ඔහු වෙත කරුණු හත රක් සමග එක් මලක් වරයෙක් එවයි. ඒ අනුව ඔහුගේ ක්‍රියාවන්, ඔහුගේ ආයුෂ කාලය, ඔහුගේ ජීවනෝපාය හා ඔහු යහපත් ශීලයාද අයහපත් ශීලයාද යන කරුණු සටහන් කරනු ලැබේ. පසුව ඔහුට ප්‍රාණය පිඹිනු ලැබේ.

ඔබලාගෙන් කෙනෙක් ඔහු හා අපාය අතර රියනක ප්‍රමාණයක් පවතින ස්ථාවරය තෙක් අපාය වැසියෙකු සේ ක්‍රියා කරමින් සිටී. එවිට ඔහුගේ සටහන ඔහුව අභිභවා

යාමෙන් ඔහු ස්වර්ග වැසියන්ගේ ක්‍රියාවන්හි යෙදමින් ස්වර්ගයෙහි පිවිසේ. එසේම, ඔබලාගෙන් කෙනෙක් ඔහු හා ස්වර්ගය අතර රියනක ප්‍රමාණයක් පවතින ස්ථාවරය තෙක් ස්වර්ග වැසියෙකු සේ ක්‍රියා කරමින් සිටී. එවිට ඔහුගේ සටහන ඔහුව අභිභවා යාමෙන් ඔහු අපාය වැසි යන්ගේ ක්‍රියාවන්හි යෙදමින් අපායයෙහි පිවිසේ' යනු වෙන් සත්‍ය වන්තයාවූ හා සත්‍ය වන්තයා ලෙස සනාථ කරන ලද මුහම්මදු (සල්) තුමා අපහට අනාවරණය කළ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'සෑම දාසයන්ම ඔවුන් කුමන ස්ථාවරයෙහි නැසී ගියේද, එවන් ස්ථාවරයෙහිම (පණ පොවා) නැගිට්ටවනු ලැබේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-නපුරු නිමාව කෙරෙහි බියෙන් සිටීම හා නපුරු නිමාව බව සිතීමට හැකිවන දෙයින් දුරස්වීම අනිවාර්ය වේ.

2-සෑම ක්‍රියාවන්ම එකී නිමාව අනුව තීන්දු කරනු ලැබේ.

# 78-ජනාසා සලාතය (1)

▶▶'කවරෙකු හෝ මරණයට පත්වී ඔහුගේ ජනාසා සලාත යෙහි අල්ලාහ්ට කිසිවක් හෝ ආදේශ නොකළ හතලිස් දෙනෙක් යෙදුනේනම්, ඔහු වෙනුවෙන් කරන ඔවුන්ගේ ශ්‍රේකමදාරුව (මැදිහත්වීම) අල්ලාහ් පිළිගනී'

යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කිසියම් පුද්ගලයෙකු ගේ ජනාසාවක් කෙරෙහි 100 දෙනෙකින් යුත් කණ්ඩාය මක් සලාතය ඉටු කළේ නම්, ඔවුන් සැම දෙනා ඔහු වෙනුවෙන් රැකමදාරු කළේනම්, ඔවුන්ගේ රැකමදාරුව අල්ලාහ් පිළිගනී' යැයි පැවැසූ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ ප්‍රසූත අවස්ථාවේ මියගිය ස්ත්‍රියෙකු වෙනුවෙන් මුහම්මදු (සල්) තුමාගේ පිටුපස සිට ජනාසා සලාතය ඉටු කළෙමි. එතුමා එම ජනාසාවෙහි මාධ්‍යයෙන් සිට සලාතය ඉටු කළේය. මේ බව සමුරා බින් ජුන්දුබ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ මම පිරිමියෙකු වෙනුවෙන් අනස් බින් මාලික් (රලි) තුමා සමග ජනාසා සලාතය ඉටු කළෙමි. ඔහු ජනාසාවෙහි හිසට ඉදිරියෙන් සිට ගත්තේය. පසුව කුරෙෂ් ගෝත්‍රයේ ස්ත්‍රියෙකුගේ ජනාසාවක් ගෙනවිත් 'අබූහම්සා (අනස්) මෙම ජනාසාවටද සලාතය ඉටු කරන්න' යනුවෙන් පැවැ සූහ. එකළ එතුමා එම ජනාසාවේ (සන්දූක්) මාධ්‍යයෙහි ඉදිරියෙන් සිට ගත්තේය. එවිට එතුමාගෙන් 'පිරිමි ජනා සාවට හා ස්ත්‍රී ජනාසාවට මෙසේ ඔබ සිටගත් තැන නබි තුමා සිටීම ඔබ දුටුවේද' යැයි විමසූහ. එයට එතුමා 'එසේ මයි' යැයි කී බව අබූ කාලිබ් තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶සෛද් (රලි) තුමා අපේ ජනාසාවන්ට තක්බීර් සතරක් කියන්නේය. (දිනක්) ජනාසාවකට එතුමා තක්බීර් පහක් කීය. මේ ගැන එතුමාගෙන් මා විමසූ කළ එතුමා 'නබි නායක මුහම්මදු (සල්) තුමා මෙසේ කියන්නේය' යැයි පැවැසූ බව අබ්දුල් රහ්මාන් බින් අබී ලෛලා (රහ්) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ජනාසා සලාතය ඉටුකරන කළ ඉමාම්වරයා පිරිමි ජනා සාවෙහි හිසට ඉදිරියෙන්ද, ස්ත්‍රී ජනාසාවෙහි මාධ්‍යයට ඉදිරියෙන්ද සිටිය යුතුයි.
2-ඉමාම් වරයා තක්බීර් සතරක් කිව යුතුයි.
3-ජනාසා සලාතයෙහි තක්බීර් පහක් කීම අනුමතවේ.
4-ජනාසා සලාතයෙහි අධික පිරිස් සහභාගි කරවා ගැනීම සතුටු දායකවේ.

# 79-ජනාසා සලාතය (2)

## සූරා ෆාතිහාව පාරායනා කිරීම

▶▶මම ඉබ්නු අබ්බාස් (රලි) තුමාගේ පිටුපස සිට ජනාසා සලාතයක් ඉටු කළෙමි. එතුමා සූරා ෆාතිහා පරිච්ජේදය (ශබ්ද නගා) පාරායනා කළේය. පසුව එතුමා 'මෙය සුන් නත් (කාලීන ක්‍රියා) ලෙස ඔබලා දැනගැනීම සඳහා මෙසේ කළෙමි' යනුවෙන් පැවැසූ බව තල්හා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

# ජනාසා සලාතයෙහි ප්‍රාර්ථනා කිරීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා ජනාසාවක් සඳහා සලා තය ඉටු කළේය. එහි එතුමා කළ ප්‍රාර්ථනාව මම කට පාඩම් කර ගත්තෙමි. එය මෙසේය.

اَللَّهُمَّ اغْفِرْلَهُ، وَارْحَمْهُ، وَعَافِهِ، وَاعْفُ عَنْهُ، وَاَكْرِمْ نُزْلَهُ، وَوَسِّعْ مُدْخَلَهُ، وَاغْسِلْهُ بِالْمَاءِ وَالثَّلْجِ وَالْبَرَدِ، وَنَقِّهِ مِنَ الْخَطَايَا كَمَا نَقَّيْتَ الثَّوْبَ الْأَبْيَضَ مِنَ الدَّنَسِ، وَأَبْدِلْهُ دَارًا خَيْرًا مِنْ دَارِهِ، وَأَهْلاً خَيْرًا مِنْ أَهْلِهِ، وَزَوْجًا خَيْرًا مِنْ زَوْجِهِ، وَأَدْخِلْهُ الْجَنَّةَ وَأَعِذْهُ مِنْ عَذَابِ الْقَبْرِ– أَوْمِنْ عَذَابِ النَّارِ.

අල්ලාහුම් මග්ෆිර්ලහු, වර්හම්හු, වආෆිහී, වඃෆු අන්හු, වඅක්රිම් නුස්ලහු, වවස්සිඃ මුද්(ක්)හලහු, වග්සිල්හු බිල්මාඉ වස්තල්ජි වල්බර්දි, වනක්කිහි මිනල් ක්හතායා කමා නක්කයිතස් සව්බල් අබ්යල මිනද් දනසි, ව අබ් දිල්හු දාරන් ක්හයිරන් මින් දාරිහි, වඅහ්ලන් ක්හයිරන් මින් අහ්ලිහි, වසව්ජන් ක්හයිරන් මින් සව්ජිහි, ව අද් හිල්හුල් ජන්නත්ත වඅඉද්හු මින් අදාබිල් කබ්රි. (අව් මින් අදාබින් නාරි.)

## අර්ථය :

ඕ අල්ලාහ්, ඔහුට පව් සමාවද, භාග්‍යද, ආරෝග්‍යද ලබා දෙනු මැනවි. ඔහුගේ පාපයන් නැති කරනු මැනවි. ඔහු දැනට පිවිස සිටින තැන විශාලකර ගරු කරනු මැනවි. ඔහුව ජලයෙන්, හිම් කැටයෙන් හා මිදි දියෙන් සෝදනු මැනවි. සුදු රෙදි කිලිටු කසලෙන් පවිත්‍ර කරන සේම,

ඔහුගේ පාපයන් පවිත්‍ර කරනු මැනවි. ඔහුගේ නිවසට වඩා හොඳ නිවසක්ද, ඔහුගේ පවුල් ඥාතීන්ට වඩා හොඳ පවුල් ඥාතීන්ද, ඔහුගේ බිරිඳට වඩා හොඳ බිරියෙක්ද, ලබා දෙනු මැනවි. ඔහුව ස්වර්ගයෙහි ප්‍රවේශ කරනු මැනවි. ඔහුව මිනීවළ වේදනාවෙන් (හෝ නරකාදියෙහි වේදනාවෙන්) ආරක්‍ෂා කරනු මැනවි.

'මෙම ජනාසාව ලෙස මා සිටිය යුතුව තිබුනා නොවේද ? යනුවෙන් මා මහත් ආශාවට පත්වූයෙමි' යනුවෙන් අව්ෆ් බින් මාලික් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ජනාසා සලාතයෙහි සූරා ෆාතිහාව පාරායනා කළ යුතුයි.

2-නබිනායක මුහම්මදු (සල්) තුමාට සලවාත් උසුරීමෙන් පසු ජනාසා වෙනුවෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

# 80-ජනාසා සලාතය (3)

▶▶ මස්ජිදය අතුගාමින් සිටි එක් කලු පැහැති පිරිමියෙකු හෝ ස්ත්‍රියකු නැසීගිය පුවත ගැන නබිනායක මුහම්මදු (සල්) තුමා නොදැන සිටියේය. දිනක් ඔහු ගැන මතක් වූ කළ කොහිද මේ පුද්ගලයා ? ඔහුට කුමක්ද වූයේ ? යනුවෙන් විමසීය. එවිට එතුමාගේ ශ්‍රාවකරුවන් 'අල්ලාහ් ගේ දූතයාණෙනි, ඔහු නැසී ගියේය' යනුවෙන් කීහ. එවිට නබිතුමා 'ඇයි ඒ ගැන මාහට දැනුම් නුදුන්නේ ? කොහිද ඔහුගේ

මිනීවළය මාහට පෙන්වන්න' යනුවෙන් පැවැසීය. පසුව නබිතුමා ඔහුගේ මිනීවළට පැමිණ ඔහු වෙනුවෙන් සලාතය ඉටු කළේය. මේ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා නජ්ජාෂි රජු නැසිගිය පුවත එදිනම තම (ශ්‍රවකරුවන්හට) දැනුම් දුන්නේය. (පසුව) ඔවුන්ව සලාතය ඉටු කරන ස්ථානය කරා කැඳවා ගෙන ගොස් පේළියට සිටවා තක්බීර් සතරක් කීවේය. මේ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## <u>ප්‍රයෝජන</u>

1-මිනීවළ අසලෙහි ජනාසා සලාතය ඉටු කිරීම ඉස්ලාමය අනුමත කරයි.
2-ගායිබ් (කණ්ඩායමක් ඉටු නොකළ තත්වයේ) ජනාසාව වෙනුවෙන් සලාතය ඉටු කිරීම ඉස්ලාමය අනුමත කරයි.

# 81-ජනාසාවට සහභාගිවීම

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් හෝ ජනාසා වට එකී සලාතය ඉටුකරන තෙක් සහභාගිවූයේද, ඔහුට එක් කීරාතයක් ප්‍රමාණ කුසලක් ලැබේ. කවරෙක් හෝ භූමිදානය කරන තෙක් සහභාගි වූයේද, ඔහුට කීරාත් දෙකක කුසලක් ලැබේ' යැයි පැවැසූවිට 'කීරාත් දෙකක් කියන්නේ කුමක්ද ?' යනුවෙන් නබිතුමාගෙන් විමසූහ. එවිට එතුමා 'ඉතා විශාල කඳු දෙකක ප්‍රමාණයවේ' යැයි පැවසීය. මෙය අබූහුරෙයිරා (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'රෝගීන්ගේ සුව දුක් විමසීම, ජනාසාව සමග ගමන් කිරීම, කිඹුහුම යවන් නාට පිළිතුරු කීම, අසරණයන්ට උපකාර කිරීම, අපරාධ යට ලක් වුවන්ට උපකාර කිරීම, සලාමය ව්‍යාප්ත කිරීම හා දිවුරුම් කළ අයට එය ඉටු කිරීමට උපකාර වීම' යන කරුණු හතක් ගැන තමාට අණ කළ බව බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලා ජනාසාව දුටු කළ නැගිට සිටින්න. කවරෙක් හෝ එය පසුපස ගමන් කරන්නේද, ඔහු එය බිම තබන තෙක් හිඳ නොගන්න' යැයි ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රි (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ උම්මු අතියියා (රලි) තුමිය '(ස්ත්‍රීන්වන අපි) ජනාසාව සමග ගමන් කිරීම වළක්වන ලදී. නමුදු, එය (තහනම) අපට තදින් බලකර නොමැත' යනුවෙන් පවසන්නීය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-ජනාසාව සමග ගමන් කිරීම සුන්නත් යනු නබිතුමාගේ මගකි.

2-මෙයට ඉමහත් කුලිය ලැබේ.

3-ජනාසාව සමග ගමන් කරන්නන් එය බිම තබන තෙක් අසුන් නොගැනීම සුන්නතකි.

4-ජනාසාව හා සමග ගමන් කිරීම ස්ත්‍රීන්ට තහනම් කර ඇත.

# 82-ජනාසාවෙහි සමහර නීතිරීතීන්

## ජනාසාව සිඹීම

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා අභාවයට පත්වූ පසු, අබුබක්ර් සිද්දීක් (රලි) තුමා එතුමාව සිඹීය' යනුවෙන් ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

**(ග්‍රන්ථය : බුහාරි)**

## නැසීගිය අයට බැණීම

▶▶'නැසීගිය අයට නොබණින්න. මක්නිසාදයත්, ඔවුන් කළ දේහි පල ඔවුන්ට ලැබෙමින් සිටිති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ජනාසාව සීඝ්‍රයෙන් ගෙන යාම

▶▶'ජනාසාව සීඝ්‍රයෙන් ගෙන යන්න. මක්නිසාද යත්, එය යහපත් ශීල ජනාසාවක් වන්නේ නම්, (ඔහුට ලැබෙන කුලිය කරා සීඝ්‍රයෙන්) ගෙනගිය අය ලෙසට ඔබලා පත් වෙති. එය අයහපත් ශීල ජනාසවක් වන්නේ නම්, එම අයහපත ඔබලාගේ උරහිසෙන් (සීඝ්‍රයෙන්) බැස්සවූ අය ලෙසට ඔබලා පත්වෙති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා තිර්මිදි)**

▶▶'විශ්වාස වන්තයාගේ ණය ගෙවන තෙක් ඔහුගේ ප්‍රාණය එල්ලා සිටින ස්ථාවරයෙහි පත් කරනු ලැබේ'

යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶'ලහ්ද් (යන ක්‍රමයෙහි මිනීවළ කැපීම) අපට අයත් ක්‍රම යකි. ෂක් (යන ක්‍රමයෙහි මිනීවළ කැපීම) අන් අයට අයත් ක්‍රමයකි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

## ප්‍රයෝජන

1–ජනාසාව සිඹීම අනුමත වේ.
2–නැසීගිය අයට බැණීම තහනම්ය.
3–ජනාසාව සීඝ්‍රයෙන් ගෙන යන ලෙස අණකර ඇත.
4–නැසීගිය අය ගෙවිය යුතු ණය සීඝ්‍රයෙන් ගෙවීම අනිවාර් යවේ.
5–ලහ්ද් ක්‍රමයෙහි මිනීවළ කැපීම සතුටුදායක වේ.

# 83–ජනාසාව භූමිදානය කිරීම

▶▶'ඉර උදාවීම ආරම්භයේ සිට ඉර (සම්පූර්ණයෙන්) උදා වන තෙක්, ඉර මුදුනට පැමිණ සිට ඉර ඇළවන තෙක් හා ඉර බැසීම ආරම්භයේ සිට එය (සම්පූර්ණයෙන්) බසින තෙක් යනාදි තුන් වේලාවන්හි සලාතය ඉටු කිරීම සහ අපෙන් නැසීගිය අය භූමිදානය කිරීම නබිනායක මුහම්මදු (සල්) තුමා අපට තහනම් කළේය' යනුවෙන් උක්බා බින් ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා ජනාසාව මිනීවළෙහි තබන කළ මෙසේ පවසන බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

بِسْمِ اللهِ وَبِاللهِ وَعَلَى مِلَّةِ رَسُوْلِ اللهِ

**බිස්මිල්ලාහි වබිල්ලාහි වඅලා මිල්ලති රසූලිල්ලාහි**

(අල්ලාහ්ගේ නාමයෙන්ද, අල්ලාහ්ගේ පිහිටෙන්ද, අල් ලාහ්ගේ දූතයාගේ ආගම අනුවද ඔබ මිනීවළෙහි තබමි)

**(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶ 'අපි නබි මුහම්මදු (සල්) තුමාගේ දියණියගේ ජනාසාවට සහභාගි වූයෙමු. එවිට එතුමා මිනීවළෙහි සමීපව හිඳ ගෙන සිටියේය. එතුමාගේ දෑසින් කඳුළු හෙලීම මම දුටු වෙමි. 'පසුගිය රාත්‍රි සංසර්ගයෙහි නොයෙදුනු කවරෙක් හෝ සිටින්නේද ?' යනුවෙන් විමසූ කළ අබූතල්හා (රලි) තුමා 'මම සිටිමි' යැයි කීය. වහාම නබිතුමා ඔහු අමතා 'ඇගේ මිනීවළෙහි බසින්න' යැයි පැවසීය. ඔහු ඇගේ මිනීවළෙහි බැසීය. පසුව අපි ඇය භූමිදානය කළෙමු' යනුවෙන් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-ඉර උදාවීම ආරම්භවී එය (සම්පූර්ණයෙන්ම) උදාවන තෙක් ඉර මුදුනට පැමිණ එය ඇළවන තෙක් හා ඉර බැසීමට ආරම්භවී එය (සම්පූර්ණයෙන්ම) බසින තෙක් ජනාසාව භූමිදානය කිරීම තහනම්ය.

2-ජනාසාවක් මිනීවළෙහි තබන්නා 'බිස්මිල්ලාහි වබිල්ලාහි වඅලා මිල්ලති රසූලිල්ලාහි' යනුවෙන් උසුරීම සුන්නත් නම්වූ නබි මගකි.
3-ස්ත්‍රියෙකුගේ ජනාසාව ඇයගේ මහ්රම් නොවන්නන්ද (එනම්, ඇය සමග විවාහවීමට අනුමත අයද) භූමිදානය කළ හැක.

# 84-මිනීවළ සමතලා කිරීම

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා කුමණ කාර්ය සඳහා මාව පිටත් කළේද, එවන් කාර්යක් සඳහා මා ඔබව පිටත් කරන්නද ?' යනුවෙන් මාගෙන් විමසා 'කිසිදු පිළිමයක් විනාශ නොකර සහ කිසිදු උස්කර ඇති මිනීවළක් සම තලා නොකර නොසිටින්න' යැයි අලි බින් අබීතාලිබ් (රලි) තුමා පැවැසූ බව අබුල් හයියාජ් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා මිනීවළවල් සමතලා කරන ලෙස අණ කිරීම මා සවන් දුන් බව ෆුලාලා බින් උබයිද් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා මිනීවළවල් ආලේප කිරීම, එහි මත හිඳ ගැනීම හා එහි මත ගොඩනැගිලි ඉදිකිරීම තහනම්ය කළේය' යනුවෙන් ජාබිර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමා 'මිනීවළ මත හිඳ නොගන්න. එයට මුහුණලා සලාතය ඉටු නොකරන්න' යැයි පැවසූ බව අබූ මර්සද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මිනීවළ මත ගොඩනැගිලි ඉදිකිරීම හෝ එය උස් කිරීම හෝ එයට ආලේප කිරීම හෝ තහනම්ය.
2-මිනීවළ මත හිඳ ගැනීම වළක්වා ඇත.
3-මිනීවළ මත සලාතය ඉටු කිරීම තහනම්ය.

# 85-මිනීවළෙහි සිදුවීම්

▶▶ දාසයෙකුව මිනීවළෙහි තැන්පත් කර, ඔහුගේ මිත්‍රයන් ඔහු හැර ආපසු ගමන්කරන කළ ඔවුන්ගේ පාවහන් හි නාදය ඔහුට ඇසේ. එවිට එහි මලක්වරුන් දෙදෙනෙකු පැමිණ ඔහුව වාඩිකරවා ඔහුගෙන් මෙම මුහම්මදු (සල්) තුමා ගැන ඔබ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද ? යනු වෙන් ඔහුගෙන් අසති. එවිට මොහු 'එතුමා අල්ලාහ්ගේ දාසයා හා දූතයා ලෙස සාක්ෂි පැතූ' බව පවසයි. වහාම ඔහුට 'නිරයේ ඔබේ නවාතැන (ස්ථානය) බලන්න. මේ වෙනුවට අල්ලාහ් ස්වර්ගයෙහි නවාතැනක් ඔබට ඇති කළේය' යනුවෙන් ඔහුට පැවැසේ. ඔහු එම නවාතැන් දෙකම බලයි.

එසේම ඔහු කාෆිර් හෝ මුනාෆික් වරයෙකුනම්, ඔහු මා නොදනිමි. මිනිසුන් ප්‍රකාශ කළ දේම මාද ප්‍රකාශ කර මින් සිටියෙමි යැයි පවසයි. එවිට 'ඔබ දැනගත්තේද,

පිළිපැද්දේද නොමැත. යනුවෙන් ඔහුට පැවැසේ. පසුව යකඩ (තලන ලොකු) මිටියෙන් ඔහුගේ කන් දෙකහි අතර (හිසට) පහරක් දෙනු ලැබේ. එවිට ඔහු කෑකෝ ගසයි. ඒ ශබ්දය මිනිස් හා ජින් වර්ගයන් හැර ඔහුට අසල සිටින සෑම දේටම ඇසේ. මෙලෙස නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගෙන් කෙනෙක් නැසී ගියේනම්, ඔහුගේ නවාතැන උදේ හා සවස ඔහුට පෙන්වනු ලැබේ. ඔහු ස්වර්ගවැසියෙකුනම්, ස්වර්ග වැසි යෙක් ලෙස පෙන්වනු ලැබේ. ඔහු අපාය වැසියෙකුනම්, අපාය වැසියෙකු ලෙස පෙන්වනු ලැබේ. ඔහුට 'අල්ලාහ් පරලොව දිනයේදී ඔබව නැගිට්ටවන තෙක් ඔබේ ලැගුම් ස්ථානය මේ බව පවසනු ලැබේ' යනුවෙන් පැවසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

# ප්‍රයෝජන

1-මිනීවළෙහි මලක්වරුන් දෙන්නෙක් ප්‍රශ්න කිරීම සනාථ කර ඇත.

2-මිනීවළෙහි වේදනාව හා භාග්‍යය ඇති බව සනාථ කර ඇත.

3-නැසීගිය අය පරලොව දිනය පැමිණීමට පෙරාතුරුව ස්වර් ගයෙහි හෝ නරකාදියෙහි ඇති තම ස්ථානය දකිති.

# 86-ඉවසීමට දිරිගැන්වීම

▶▶'ඉවසිලි වන්තයින් වන) ඔවුනට පීඩාවක් ඇති වූ කළ, නියතව අප අල්ලාහ්ටමු අයත් වුවන්ය. නියතව, අප ඔහු වෙතම ආපසු යන්නන් යැයි කියති. ඔවුන්ගේ ස්වාමියා ගේ ආශිර්වාදයද කරුණාවද ඇතිවනුයේ මෙවැනි අය හටය. තවද යහමග ලැබුවන් මෙවැනි අයමය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන්-2:156, 157)**

▶▶'ඉවසිම යනු පීඩාවක් සිදුවූ වහාම ඇතිවීමකි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'කුමන මුස්ලිම් වරයෙකුට හෝ කුමණ පීඩාවක් සිදුවූ කළ අල්ලාහ් අණකළ පරිදි උසුරියේනම්, එයට වඩා යහ පතක් අල්ලාහ් ඔහුට ලබාදෙයි' යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව උම්මු සලමා (රලි) තුමිය වාර්තා කරන්නීය. එය මෙසේය :

إِنَّا لِلّٰهِ وَإِنَّا إِلَيْهِ رَاجِعُونَ، اَللهُمَّ أَجِرْنِيْ فِيْ مُصِيْبَتِيْ، وَاخْلُفْ لِيْ خَيْرًا مِنْهَا

**ඉන්නා ලිල්ලාහි වඉන්නා ඉලෙයිහි රාජිඋන්, අල්ලාහුම්ම අජිර්නී ෆී මුසීබතී, වඅ්ලුෆ් ලී ක්හයිරන් මින්හා.**

(සැබැවින්ම, අපි අල්ලාහ් වෙනුවෙන්ම සිටිමු. අපි ඔහු වෙතම නැවත යායුතුවෙන් සිටිමු. දෙවියනේ, මම ලක්වී සිටින පීඩාවෙහි මට කුලිය ලබාදෙනු මැනවි. මේ වෙනුවට මීට වඩා හොඳ දෙයක් මට ලබා දෙනු මැනවි)

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶'විශ්වාස වන්තයාගේ තත්ත්වය කුමණ පුදුමයක්ද ? ඔහු ගේ සෑම කාර්යයන්ම ඔහුට යහපතක් ලෙස පවතින් නේය. ඔහුට සතුටුවන කාර්යයක් සිදුවූ කළ, ඔහු තුති පුද කරයි. එය ඔහුට යහපත් ලෙස පවතින්නේය. ඔහුට පීඩාවක් සිදුවූ විට ඔහු එය ඉවසාගෙන සිටී. එයද ඔහුට යහපත් ලෙස පවතින්නේය. මෙසේ විස්වාස වන්තයාට හැර අන් කිසිවෙකුට නොලැබේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව සුහයිබ් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-පීඩාවන් කෙරෙහි ඉවසීම විශේෂ කරුණකි.
2-පීඩාවකට ලක්වූ වහාම ඉවසීම උතුම්භාවයකි.
3-දුක් පීඩාවන් සිදුවන කළ ඉවසීම විශ්වාස වන්තයාගේ ලක්ෂණයකි.
4-පීඩාවන් සිදුවන කළ නබිවදන් මගින් ලැබී ඇති දික්රය උසුරීමෙහි විශේෂත්වය.

# 87-අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීම

▶▶නබි මුහම්මදු (සල්) තුමා 'අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීමට අදාල සම්පතක් ලබා සිටින කවර මුස්ලිම් වර යෙකු හෝ එය ලියා තම සතුව නොතබා රාත්‍රි දෙකක් හෝ ගත කිරීමට අවසරය නොමැත' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'අල්ලාහ්ගේ දූතයාණෙනි, මම පොහොසත් භාවයෙන් සිටිමි. මාගේ එකම දියණිය හැර මාගේ උරුමකරුවන් කිසිවෙක් හෝ නොමැත. මගේ සම්පත්වලින් තුනෙන් දෙකක කොටසක් මා දානය කරන්නද ?' යනුවෙන් විම සීමි. එයට නබිනායක මුහම්මදු (සල්) තුමා 'නොහැක' යනුවෙන් පැවැසීය. පසුව මා 'එයින් අඩක් දානය කරන් නද ?' යනුවෙන් විමසීමි. එයට එතුමා 'නොහැක' යනු වෙන් පැවසීය. නැවත මා 'තුනෙන් එකක් දානය කරන් නද ?' යනුවෙන් විමසීමි. එයට එතුමා 'තුනෙන් එකක් දානය කරන්න. එයද අධිකවේ. ඔබ ඔබේ හිමිකාරිණිය මිනිසුන්ගෙන් සිඟමන් කරන දිළින්දක් ලෙස පත්කිරී මට වඩා ඇය පොහොසත් ස්ථාවරයෙහි පත්කිරීම ශ්‍රේෂ් ඨයකි' යනුවෙන් ප්‍රකාශ කළ බව සෙයිද් බින් අබී වක් කාස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'නියතව, අල්ලාහ් සෑම උරුම කරුවන්ටම එකී උරුමකම ලබාදී ඇත. එබැවින්, උරුමකරුවන්ට මරණ සාසනය නොමැත' යැයි පැවැසූ බව අබූඋමාමා අල්බාහිලී (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

▶▶පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් වෙත පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මාගේ මව අවසාන කැමැත්ත ප්‍රකාශයක් නොකළ ස්ථාවරයේ හදිසියෙන්ම වියෝවට පත්විය. ඇයට (වියෝ යාමට පෙර) කථා කිරී මට හැකිවූයේ නම්, දානය කරන මෙන් අණ කිරීමට ඇති යැයි මම සිතමි. එනිසා මා

ඇය වෙනුවෙන් දානය කළේ නම් එකී කුලිය ඇයට ලැබේද ?' යනුවෙන් විමසීය. එවිට නබිතුමා 'ඔව්' යැයි පැවැසීය. මේ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## <u>ප්‍රයෝජන</u>

1-කවරෙකු සතුව අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීමට අදාල සම්පත් ඇත්තේද, ඔහු අවසාන කැමැත්ත ප්‍රකාශ කළ යුතු බව අණකර ඇත. ඔහු එහිදි සීමා ඉක්මවා නොයා යුතුයි.

2-මිනිසෙකු තමාගේ වියෝවට පෙර තම සතු සම්පත්වලින් තුනෙන් එකක කොටසක් පමණක් අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීමට හැක.

3-සමහර උරුමකරුවන්ට පමණක් ඔවුන්ට අයත් හිමිකමට වඩා වැඩියෙන් ලබා දිය යුතු බව අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීම තහනම්ය.

4-නැසීගිය පුද්ගලයා අවසන් කැමැත්ත ප්‍රකාශ නොකළත් ඔහු වෙනුවෙන් දානය කිරීම අනුමත වේ.

# 88-හිමිකම් පිළිබඳ නීතිරීතීන්

▶▶'නියම කරන ලද කොටස් එකී උරුමක් කරුවන්ට ලබා දෙන්න. ඉතිරිව පවතින දේ නැසීගිය අයගේ කිට්ටුම ඥාති පිරිමින්ට අයත්ය' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'නියත වශයෙන්ම, අල් ලාහ් සෑම උරුමකරුවන්ටම එකී උරුමකම ලබාදී ඇත. එබැවින්, උරුමකරුවන්ට මරණ සාසනය නොමැත' යනු වෙන් ප්‍රකාශ කළ බව අබූ උමාමා අල්බාහිලී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

▶▶නබි මුහම්මදු (සල්) තුමා 'මුස්ලිම් වරයෙකු කාෆිර් වර යෙකුට හෝ කාෆිර් වරයෙකු මුස්ලිම් වරයෙකුට හෝ උරුමකරුවෙකු විය නොහැක' යනුවෙන් පැවසූ බව උසාමා බින් සෙයිද් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

## ප්‍රයෝජන

1-උරුමකරුවන්ට අදාල කොටස් ලබා දීම අල්ලාහ් විසින්ම නියම කර ඇත.
2-උරුමකරුවන්ට අවසාන කැමැත්ත ලිවීම තහනම්ය.
3-නිගමනය කළ කොටස්වලට පසු යමක් ඉතිරිවූයේ නම්, එය නැසීගිය තැනැත්තාගේ කිට්ටුම ඥාති පිරිමියෙකුට අදාලවේ.
4-මුස්ලිම් හා කාෆිර්වරුන් අතර උරුමකම් නොවන්නේය.

# 89-නැසීගිය අය වෙනුවෙන් ඇඬීම

▶▶අපි (නබිනායක මුහම්මදු (සල්) තුමාගේ පුත්‍ර) ඉබ්රා හීම්ගේ කිරි පියාවූ අබූ සයිෆුල් කෙනී හමුවට ගියෙමු. එහි නබිනායක තුමා තම පුත්‍රයාව ඔසවා ඔහුවට සිඹීය. පසුව (දිනක්) අපි (නැවතත්) ඔහු වෙතට ගියෙමු. එවිට ඉබ්රාහීම් මරණාසන්නයට පත්ව

සිටිය. (එය දුටු) නබි නායක තුමාගේ දෑසින් කඳුලු හැලෙන්නට විය. එකල අබ්දුල් රහ්මාන් බින් අව්ෆ් (රලි) තුමා 'අල්ලාහ්ගේ දූත යාණෙනි, ඔබතුමාද මෙසේ අඬන්නේ ?' යනුවෙන් විම සීය. එයට නබිතුමා 'සැබවින්ම, ඇස් කඳුලු හලයි. හද වන ශෝකයට පත්වේ. අප ස්වාමියා තෘප්ති නොවන කිසියම් වචනයක් හෝ අපි නොපවසමු. ඉබ්රාහීම්, ඔබ වියෝවෙන් අපි නියතව ශෝකයට පත්ව සිටියෙමු' යැයි පැවැසීය. මෙය අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶ නබි මුහම්මදු (සල්) තුමාගේ දියණිය 'මාගේ පුත්‍රයා මර ණාසන්නයට පත්ව සිටින බැවින් වහාම පැමිණෙන්න' යනුවෙන් නබිතුමාට පණිවිඩයක් යැවීය. එයට එතුමා 'අල්ලාහ් අරගත් දේ සහ ඔහු ලබා දී ඇති දේ ඔහුටම අයත්ය. සෑම දෙයක් සඳහාම ඔහු වෙත කිසියම් කාල සීමාවක් ඇත. එබැවින් ඉවසා සිටින්න. මෙය යහපතක් සඳහා බව සිතා ගන්න' යනුවෙන් තම දියණියට පවසන මෙන්ද, තම සලාමයද ඇයට යොමු කරන මෙන්ද කියා (පණිවිඩකරුවාව) පිටත් කළේය.

පසුව නබිතුමාගේ දියණිය 'ඔබතුමා අනිවාර්යයෙන්ම පැමිණිය යුතු බවට දිවුරා' නබිතුමා වෙත නැවත පණි විඩයක් යැව්වාය. වහාම නබිනායක තුමා පිටත්ව පැමි ණිය. එතුමා සමග සඃද් බින් උබ්බාදා (රලි), මුආද් බින් ජබල් (රලි) උබයි බින් කඃබ් (රලි), සෙයිද් බින් තාබිත් (රලි) හා වෙනත් පිරිසක්ද පැමිණියහ. එහිදි නබිතුමා ගේ අතට දරුවාව දුන්හ. එතුමා දරුවාව තම තුරුලෙහි

තබා ගත්තේය. ඔහුගේ ප්‍රාණය පැද්දමින් පැවතිය. නබි තුමාගේ දෑසින් කඳුලු හැලෙන්නට විය. එකළ සෑද් (රලි) තුමා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙය කුමක්ද ? (ඔබ තුමාද මේ අඬන්නේ?) යනුවෙන් විමසීය. එයට නබිතුමා 'මෙය කරුණාවකි. මෙය අල්ලාහ් තමාගේ දාසයන් අතර තමා කැමැති අයගේ හදවත්තුල (පමණක්) ඇති කරන් නේය. තමාගේ දාසයන් අතර සිටින කරුණා වන්තයන් කෙරෙහි (පමණක්) අල්ලාහ් ආදරය කරන්නේය' යනු වෙන් ප්‍රකාශ කළේය. මෙය උසාමා බින් සෙයිද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : මුස්ලිම් හා තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අල්ලාහ්ගේ තීරණය ගැන අතෘප්ති නොවන පරිදි හෝ අදෝනා බස් නොකියමින් මරණයක් වෙනුවෙන් ඇඬීම අනුමතවේ.

2-නබිනායක මුහම්මදු (සල්) තුමාගේ කරුණාව හා ආදරය ගැන වටහා ගැනීම.

# 90-දරුවන්ගේ මරණය සම්බන්ධව ඉවසීම

▶▶'කවර මුස්ලිම් වරයෙකුගේ වැඩි වියට නොපත් දරුවන් තුන් දෙනෙකු නැසී ගියේද, අල්ලාහ් සිය කරුණාවෙන් ඔහුවද එම දරුවන්ද ස්වර්ගයේ පිවිස කරවයි' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'කවර මුස්ලිම් වරයකුගේ දරුවන් තුන් දෙනෙකු නැසී ගියේද, නරකාදිය අභිබවා ගමන් කරන කළ පොදුවෙන් සැම දෙනා එකී ගිනි රශ්මියට ලක්වන නියමය අනුව එම අවස්ථාව හැර ඔහු නරකාදියෙහි ගිනි ඇවිලීමට නොලක්වේ' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : තිර්මිදි)**

▶▶'කවර ස්ත්‍රියකුගේ දරුවන් තුන් දෙනෙකු නැසී ගියේද, ඇය කෙරෙහි නරකාදියෙහි තිරයක් ලෙස ඔවුහු පත්ව සිටිති' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ විට එක් ස්ත්‍රියක් 'දරුවන් දෙදෙනෙක් නැසී ගියේනම් ? යනුවෙන් විමසීය. එයට නබිතමා 'දරුවන් දෙදෙනෙක් සිටියත් එසේමයි' යනුවෙන් පැවැසීය. මේ බව අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-දරුවන්ගේ වියෝව කෙරෙහි ඉවසා සිටිනන්නාට ඉමහත් කුලිය ලැබේ.

2-දරුවන්ගේ වියෝව කෙරෙහි ඉවසා සිටීම ස්වර්ගයෙහි පිවිසීමට හේතු වේ.

3-අල්ලාහ්ගේ කරුණාව උතුම්ය. ඔහුගේ භාග්‍යය විශාලය.

# 91-මස්ජිදුල් හරාම් හා මස්ජිදුන් නබවි

▶▶'නියතව ප්‍රතික්ෂේප කර, අල්ලාහ්ගේ මගෙහි (විශ්වාස වන්තයින් එහි යැම) කෙරෙන්, (තවද) එහි වෙසෙන් නන්ටද එයට පිටති (නුදුරී)න්

වෙසෙන්නන්ටද, මිනිසුන් සියල්ලන්ටද සමාන ලෙස එය අප කර ඇත්තාවූ එවැනි පුණ්‍ය මස්ජිදය(වූ මස්ජිදුල් හරාමට ඇතුළුවීම) කෙරෙන් බාධා කරන්නන් (පාඩුවුවන්ය.) තවද, එහි (පව් කිරීම නම්) අපරාධය මගින් කවරෙක් (අසත්‍යය කරා) ඇලවීම අපේක්ෂා කරන්නේද ඔහුට පීඩා සහිත වේදනාවන් අප රස විඳීමට සළස්වන්නෙමු' යැයි අල්ලාහ් පවසන්නේය.

**(අල්කුර්ආන් –22:25)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා '(මදීනාවේ පිහිටි මස්ජි දුන් නබවි නම්වූ) මාගේ මෙම මස්ජිදයෙහි සලාතයක් ඉටු කිරීම, (මක්කාවේ පිහිටි) මස්ජිදුල් හරාම් මස්ජිදය හැර අන් මස්ජිද්වල සලාත් දහසක් ඉටු කිරීමට වඩා උතුම්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා '(මදීනාවේ) මෙම මගේ මස්ජිදය, (මක්කාවේ) මස්ජිදුල් හරාම් හා (පලස්තීනයේ) මස්ජිදුල් අක්සා යන මස්ජිද් තුන හැර වෙනත් කිසියම් මස්ජිදයක් කරා හෝ යාඥා කිරීම නොකරේ' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'මාගේ නිවස හා මගේ මිම්බරය (දේශනා කුටිය) අතර ස්වර්ග උයනක් ඇත. මාගේ දේශනා කුටිය මාගේ තටාකය (හවුල්) මතෙහි (පිහිටා) ඇත' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මස්ජිදුල් හරාම් හා මස්ජිදුන් නබවි යන මස්ජිද්වල ඉටු කරන සලාතයෙහි විශේෂත්වය.
2-මෙම මස්ජිද් තුන හැර වෙනත් මස්ජිද් කරා වන්දනා මාන චේතනාවෙන් ගමන් බිමන්හි යෙදීම හරාම්ය.
3-නබි මුහම්මදු (සල්) තුමාගේ කාමරය හා නබිතුමාගේ දේශනා කුටිය අතර ඇති ප්‍රදේශයෙහි විශේෂත්වය.

# 92-මක්කා පිළිබඳ නීතිරීතීන්

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා මක්කාව ජයග්‍රහණය කළ දින 'සැබැවින්ම, අල්ලාහ් මෙම නගරය පවිත්‍රකර ඇත. එහි ඇති ගස් කැපීම හෝ එහි වසන සිව්පාවන් දඩයම් කිරීම හෝ තහනම්ය. එසේම, එහි බිමෙහි වැටී ඇති දේ කෙරෙහි දැනුම් දී එය අයිතිකාරයා වෙත ලබා දීමට අදහස් කරන්නා හැර අන් කිසිවෙකු හෝ ගත නොයුතුයි' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරුන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'හරම් (කඃබා දේවස් ථානය) සීමාව තුල හෝ එයින් පිට හෝ නපුරු සතුන් පස් දෙනෙකු ඝාතනය කළ හැක. ඒවානම් සර්පයා, අළු පැහැති කපුටා, මීයා, වෙරි බල්ලා සහ රාජාලියා යනා දීන්ය' යනුවෙන් පැවැසූ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මක්කාවේ පවිත්‍රභාවය උතුම්ය.
2-එහි ඇති ගස් කැපීම හෝ එම ගොඩ බිමෙහි වසන පක්ෂීන් දඩයම් කිරීම තහනම්ය.
3-එම බිමෙහි වැටී ඇති දේ ගැන දැනුම් දී එය අයිතිකාර යාට භාර කිරීමට අදහස් කරන්නා හැර අන් කිසිවෙක් හෝ ගත නොයුතුයි.
4-මිනිසුන්ට හිරහැර දෙන කපුටා, මීයා, වෙරි බල්ලා, රාජා ලියා යනාදීන් ඝාතනය කිරීම අනුමත වේ.

# 93-විවාහය සඳහා දියණිය බල කිරීම

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'වැන්දඹුවගේ අනවසර යෙන් ඇයට විවාහ කළ නොයුතුයි. කන්‍යාවද ඇගේ අනවසරයෙන් විවාහ කළ නොයුතුයි' යනුවෙන් පැවැසූ කළ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඇගේ අවසරය කෙසේද? යනුවෙන් එතුමාගේ විමසූහ. එකළ එතුමා 'ඇගේ නිශ් ශබ්දය ඇගේ අවසරයකි' යනුවෙන් පැවැසීය. මෙය අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶'වැන්දඹු ස්ත්‍රිය තම භාරකරුවා (වලීවරයා)ට වඩා තමා ගැන තීරණය ගැනීමට වගකීම් ලත්තාය. කන්‍යා ස්ත්‍රිය ගෙන් ඇගේ අවසරය පැතිය යුතුයි. ඇගේ නිශ්ශබ්දතා වය ඇගේ අවසරයකි' යැයි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶අන්සාරි ගෝත්‍රයට අයත් කන්සා බින්ත් කදාම් නැමැති වැන්දඹු ස්ත්‍රියගේ පියා ඇගේ අනවසරයෙන් ඇය විවාහ කර දුන්නේය. ඇය එම විවාහයට සිය අකැමැත්ත පළ කළාය. (පසුව) ඇය නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ මේ පිළිබඳව පැමිණිලි කළවිට එතුමා එම විවාහය අවලංගු කළේය. මේ බව කන්සා බින්ත් කදාම් (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-ස්ත්‍රියකුගේ විවාහය සම්බන්ධව ඇගේ කැමැත්ත ලබා ගැනීම අනිවාර්ය වේ.
2-කන්‍යා ස්ත්‍රියගේ කැමැත්තට නිශ්ශබ්දය ප්‍රමාණවත්වේ.
3-විවාහයක් සිදුවීමට ස්ත්‍රියගේ කැමැත්ත කොන්දේසියකි.

# 94-සමාජ සමගිය

▶▶‘තවද, ඔබලා සියල්ල (එක්වී) අල්ලාහ්ගේ (පුස්තකය වන) කඹය බලවත්ව අල්ලා ගන්න. (ඔබලා භේදවලට ලක්වී) ඔබලා වෙන් නොවන්න’ යනුවෙන් අල්ලාහ් පව සන්නේය. **(අල්කුර්ආන් -3:103)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා ‘මගෙන් පසු කෝලා හල ඇතිවේ. එවිට කවරෙක් මෙම සමාජයෙහි සමගිය බිඳීමට අදහස් කරන්නේද, ඔහු කවරෙකු හෝ වේවා ඔහුව කඩුවෙන් කොටා ඝාතනය කරන්න’ යැයි ප්‍රකාශ කළ බව අර්ෆජා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහ් ඔබලාගෙන් කරුණු තුනක් ගැන සතුටු වන්නේය. කරුණු තුනක් ගැන අසතුටු වන්නේය. අල්ලාහ්ට (පමණක්) වන්දනා මානය කර ඔහුට කිසිවක් ආදේශ නොකිරීම, ඔබ සැම දෙනා අල්ලාහ්ගේ ධර්මය ස්ථිරව ග්‍රහණයකර ගැනීම හා ඔබලාගේ කාර්යයන් සඳහා අල්ලාහ් වගකීම් පවරා ඇති වගකීම් දරන්නන්ට කීකරුවීම යනාදීන් කෙරෙහි අල්ලාහ් ඔබලාගෙන් ප්‍රිය කරයි. එසේම, ඔහු මොහු එසේ මෙසේ කී බව ඔබලා පැවැසීම, අධික ප්‍රශ්න මතු කිරීම හා ධනය නිශ්ඵල ලෙස වියදම් කිරීම යනාදීන් ගැන අල්ලාහ් ඔබලාව අප්‍රිය කරයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

▶▶ නබිනායක මුහම්මදු (සල්) තුමා සිත වෙව්ලන සහ දෑසින් කඳුළු හැලෙන තරමට අපට විශිෂ්ඨ දේශනාවක් කළේය. (එකළ) 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙය සමු ගැනීමේ දේශනාවක් බව පෙණෙන බැවින් අපට තවත් දේශනා කරන්න' යැයි අපි කීමු. එවිට නබිතුමා .......

'අල්ලාහ් කෙරෙහි බිය බැති සිතින් සිටින ලෙසත්, ඔබ ලාට අබිසීනියාවේ වහලෙකු නායක ලෙස සිටියද, ඔහු ගේ අණට කීකරුවී ඔහු අනුගමනය කරන ලෙසත් උප දෙස් කරමි. මින් පසු ජීවත්වන්නන් අධික මත මතාන් තරවලට ලක්වති. එවිට මාගේ මගද, මාගේ මග හකු දත්වලින් අල්ලාගෙන යහමගෙහි සිටි කලීෆා (නායක) වරුන්ගේ මගද අල්ලා ගන්න. (ආගමික) කරුණුවල අන්තර්ගත වන බිද්ආ හෙවත් නවීන අදහස් කෙරෙහි

ඔබලාට අවවාද කරමි. කුමක්නිසාද යත්, සෑම බිද්අත්ම නොමගකි' යැයි ප්‍රකාශ කළ බව ඉර්බාල් බින් සාරියා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

## ප්‍රයෝජන

1-අල්ලාහ්ගේ ධර්ම ග්‍රන්ථය (අල්කුර්ආනය) ස්ථිරව ග්‍රහණය කර ගන්නා ලෙස අණකර ඇත.
2-මතමතාන්තර ඇතිකර බෙදී යාම බලවත් ලෙස තහනම් කර ඇත.
3-මත මතාන්තර ඇතිවන අවස්ථාවල නබිනායක තුමාගේ මග අනුගමනය කරන ලෙස අණකර ඇත.

# 95-විශ්වාසය රැක ගැනීම

▶▶'නියතව, අප භාරය අහස්, පොළොව, කඳු ආදි කෙරෙහි (එය උසුලා ගන්නා ලෙස) ඉදිරිපත් කළෙමු. එකල එය ඉසිලීමෙන් ඒවා ඉවත් විය. තවද එය (ඉසිලීම) කෙරෙහි ඒවා බියට පත්විය. (නමුදු) මිනිසා එය උසුලා ගත්තේය. නියතව ඔහු (භාරය ඉටු කිරීම විෂයෙහි) මහා අපරාධ කාරයා ලෙස (එහි යුතුකම) නොදන්නා ලෙස සිටී. **(අල්කුර්ආන් -33:72)**

▶▶'(විශ්වාසවන්තයෙනි) විශ්වාසය මත තබා ගැනීමට දුන් දේ, ඒවායෙහි අයිති කරුවන් හට ඔබලා භාර දිය යුතු බවද, මිනිසුන් අතර ඔබලා තීරණය දෙන කළ (අපක්ෂ පාතීව) යුක්ති සහගතව තීරණය දෙන ලෙසද නියතව අල්ලාහ් ඔබලා හට අණ කරයි. **(අල්කුර්ආන්-4:58)**

▶▶'ඔබ කුලියට තබාගත් අයගෙන් නියතව (මොහු) වඩාත් හොඳ බලවතාය. විශ්වාස වන්තයාය. යැයි (ඇය) කීවාය' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන් –28:26)**

▶▶'තවද, ඔවුන් කවරෙහුනම්, ඔවුහු තම විශ්වාසනීය වග කීම් හා (තමන් කළ) පොරොන්දුව රැකවලදී ආරක්ෂා කරති' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන්–70:32)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා එක් සභාවක මිනිසුන් අමතමින් සිටියේය. එකළ එක් ගැමියෙක් පැමිණ පර ලොව දිනය කවර දින පැමිණේද ? යනුවෙන් විමසීය. (නමුත්) නබිතුමා තම දේශනය අඛණ්ඩව පවත්වගෙන ගියේය. දේශනය අවසන් කළ පසු නබිතුමා 'පරලොව දිනය ගැන විමසුවේ කවරෙකුද ? යනුවෙන් විමසීය. එවිට එම ගැමියා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මමයි එසේ විමසුවේ' යැයි කීය. එකළ නබිතුමා 'වගකීම් විනාශ කෙරෙන කළ පරලොව දිනය බලාපොරොත්තු වන්න' යැයි පැවැසීය. වහාම ඔහු එය කෙසේ විනාශ කරනු ලබන්නේ ? යැයි විමසූ කළ නබිතුමා 'කරුණක් එයට සුදුසු නොවන්නා වෙත භාර කෙරෙන කළ පරලොව දිනය බලාපොරොත්තු වන්න' යනුවෙන් පැවැසීය. මෙය අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

▶▶'නබිනායක මුහම්මදු (සල්) තුමා අපට දේශනා කරන සෑම අවස්ථාවලම "වගකීම් (අමානා–නම්බුව) නොමැති තැනැත්තාට ඊමානය (විශ්වාසය) නොමැත. පොරොන්දුව රැකවලදී ආරක්ෂා නොකරන්නාට ආගම

නොමැත" යැයි නොපැවැසීම ඉතා අඩුය' යනුවෙන් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ශුන්ථය : අහ්මද්)**

## ප්‍රයෝජන

1-වගකීම ඉතාමත් වැදගත් කරුණකි. එය ආරක්‍ෂා කරන ලෙස අණකර ඇත.
2-වගකීම ආරක්‍ෂා කිරීම ජයග්‍රහානී විශ්වාස වන්තයාගේ ලක්‍ෂණයකි.
3-වගකීමක් ලෙස භාරකරන දේ එකී හිමිකරුවන්ට භාර දෙන ලෙස අණකර ඇත.
4-තම වගකීම රැකවලදී ආරක්‍ෂා නොකරන්නාට ආගම නොමැත.

# 96-අල්ලාහ් දෙස කැඳවීමේ විශේෂත්වය

▶▶'කවරෙක් අල්ලාහ් දෙස (මිනිසුන්ව) අඬගසා (තමාද) යහකම් කර, නියතව, මම (අල්ලාහ්ට සම්පූර්ණයෙන් යටත්වූ) මුස්ලිම්වරුන්ගෙන් ඇත්තෙමි යැයි පවසන්නේද ඔහුට වඩා කියමනෙන් වඩාත් ලක්‍ෂණ වන්තයා කව රෙක්ද ?' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. **(අල්කුර්ආන් -41:33)**

▶▶'(ඕ : නබි) ඔබ (මිනිසුන්ව) බුද්ධිය මගින්, තවද ලක්‍ෂණ උපදේශය මගින්ද ඔබගේ ස්වාමියාගේ මග දෙස අඬ ගසන්න' යනුවෙන් පවසන්නේය.

**(අල්කුර්ආන් -16:125)**

▶▶'(ඕ : නබි,) ඔබ පවසන්න. මෙය මාගේ (සෘජු) මාර්ගය වේ. මම (ඔබලාව) අල්ලාහ් දෙස අඬගසන්නෙමි. පැහැ දිළි සාධක මත මාද, ඔබ පිළිපැදූ අයද සිටිමු' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.
**(අල්කුර්ආන් – 12:108)**

▶▶ක්හයිබර් යුද්ධ කාලයේ නබිනායක මුහම්මදු (සල්) තුමා අලි (රලි) තුමා අමතා 'ඔබ ඔවුන්ගේ ප්‍රදේශය පැමි ණෙන තෙක් සැනසීමෙන් ගමන් කර, ඔවුන්ව ඉස්ලාම් ධර්මය කරා කැඳවන්න. පසුව ඔවුන් අල්ලාහ්ට කළ යුතු අනිවාර්ය කාර්යයන් පිළිබඳව ඔවුන්ට දැනුම් දෙන්න. අල්ලාහ් මත දිවුරා කියමි. අල්ලාහ් ඔබ මාර්ගයෙන් එක් මිනිසෙකුට යහමග පෙන්වීම රතු පැහැති ඔටුවන්ට වඩා ඔබට යහපත්ය' යනුවෙන් පැවැසූ බව සහ්ල් බින් සඃද් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙක් හෝ යහමග දෙස කැඳවන්නේනම්, ඔහුව පිළිපදින්නාට ලැබෙන කුලි යට සමාන කුලියක් ඔහුටද ලැබේ. (මේ හේතුවෙන්) පිළිපදින්නාට ලැබෙන කුලියෙන් කිසිවක් හෝ අඩු නොවන්නේය. (එසේම) කවරෙක් හෝ නොමග කරා කැඳවන්නේනම්, ඔහුව පිළිපදින්නාට ලැබෙන පාපයට සමාන පාපයක් ඔහුටද ලැබේ. (මේ හේතුවෙන්) පිළි පදින්නාට ලැබෙන පාපයෙන් කිසිවක් හෝ අඩු නොවන් නේය' යනුවෙන් පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අල්ලාහ් කරා කැඳවීම විශේෂ කරුණකි.
2-කවරෙකු මගින් අල්ලාහ් කෙනෙකුට යහමග පෙන්වන් නේද, ඔහුට ඉමහත් කුලියක් ලැබේ.
3-කවරෙක් කුසල් ක්‍රියාවන් කරා කැඳවන්නේද, ඔහුව පිළි පදින්නන්ට ලැබෙන කුලියට සමාන කුලියක් ඔහුට ද ලැබේ.

# 97-සීමාව ඉක්මවා ප්‍රසංගා කිරීම

▶▶පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවෙහි කෙනෙකු පිළිබඳව (සීමාව ඉක්මවා) ප්‍රසංශා කළ අවස් ථාවේ එතුමා 'ඔබ විනාශ වේවා, ඔබගේ මිත්‍රයාව ඔබ විනාශ කළේය' යනුවෙන් බොහෝ වතාවන් පැවැසීය. පසුව එතුමා 'ඔබලාගෙන් කවරෙකුට හෝ සිය මිත්‍රයාව ප්‍රසංශා කළ යුතුමනම්, එයට ඔහු සුදුසු බව ඔහු දැන සිටින්නේනම්, 'මා ඔහුව මෙසේ මෙසේ දිටිමි. ඔහු ගැන අධිකව දැන සිටින්නේ අල්ලාහ්මය වේ. අල්ලාහ්ට වඩා කිසියම් කෙනෙක් හෝ පවිත්‍රවන්තයා ලෙස මම නොකි යමි යැයි පවසනු' යනුවෙන් පැවැසු බව අබූබක්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)**

▶▶පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුව සීමා ඉක්මවා ප්‍රසංශා කිරීමට සවන්දුන් නබිනායක මුහමම්දු (සල්) තුමා 'ඔබ ඔහුව විනාශ කළේය' යනුවෙන් පැවැසූ බව අබූ මූසා (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය: මුස්ලිම්)**

▶▶'ප්‍රසංශා කරන්නන්ගේ මුහුණෙහි වැලි ඉසින්න' යනු වෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා අපට අණ කළ බව මික්දාද් (රලි) තුමා වාර්තා කරන්නේය.
**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-සීමාව ඉක්මවා ප්‍රසංශා කිරීම තහනම්.
2-කෙනෙකුව ප්‍රසංශා කිරීමට අදහස් කරන්නා ඔහුගෙන් භාහිරව පෙණෙන කරුණු ගැන (පමණක්) ප්‍රසංශා කළ යුතුයි. එනම්, 'ඔහුව මම මෙසේ මෙසේ සිතමි. ඔහු ගැන වඩාත් හොඳට දැන සිටින්නා අල්ලාහ්මයවේ' යනු වෙන් කිව යුතුයි.
3-ප්‍රසංශා කරන්නන්ගේ මුහුණුවල වැලි ඉසින ලෙස අණ කර ඇත.

# 98-වාදනය කිරීම

▶▶'(මොවුන් හැර) දැනුමෙන් තොරව අල්ලාහ්ගේ මඟෙන් සිට (මිනිසුන්ව) නොමඟ යැවීමට නිශ්ඵල පුවත් මිළදී ගන්නන්ද මිනිසුන්ගෙන් සිටිති' යනුවෙන් අල්ලාහ් පව සන්නේය. **(අල්කුර්ආන් -31:06)**

▶▶නබිනායක මුහම්මදු (සල්) තුමා 'මගේ සමාජයෙහි සම හර මිනිසුන් බිහි වේ. ඔවුහු දුරාචාරය, සේද, මත්පැන් හා සංගීතය යනාදීන් අනුමත කර ගනිති. එසේම, සම හර මිනිසුන් උස් කන්දක් අසලෙහි අසුන්ගෙන සිටිති. ඔවුන්ගේ එඬෙරුවා ඔවුන්ගේ සිව්පාවන් රැගෙන (සවස් වරුවේ) ඔවුන් වෙත

පැමිණේ. එකල ඔහු (හෝ දිළින් දෙක්) ඔවුන් වෙත පැමිණ සිය අවශ්‍යතාවය ගැන පව සයි. එයට ඔවුහු හෙට පැමිණෙන්න යනුවෙන් පවසා (කාලය ගතකර) සිටිති. අල්ලාහ් ඔවුන් සමහරුන් මත එම කන්ද පෙරළා දමා විනාශ කරයි. ඉතිරි අය එලොව දිනය තෙක් රිළවුන් හා ඌරන් ලෙසට පරිවර්තනය කරයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ මාලික් අල්අෂ්අරී (රලි) තුමා වාර්තා කරන්නේය. **(ග්‍රන්ථය : බුහාරි)**

## ප්‍රයෝජන

1-වාදනය කිරීම තහනම්ය. එසේම එය නිශ්ඵල තහනම් ක්‍රියාවකි.

2-වාදනය කිරීම මෙම සමාජයේ සමහරුන් (සිය මතය පරිදි) අනුමතකර ගන්නා කරුණු අතර එකකි.

# 99-දුල්හජ් දින දහයේ විශේෂත්වය

▶▶නබි (සල්) තුමා 'මෙම දින දහයෙහි කුසල් ක්‍රියාවන්හි යෙදීම, අනෙක් දිනවල යෙදීමට වඩා අල්ලාහ් ඉමහත් ප්‍රිය කරයි' යැයි පැවැසූ කළ, එතුමාගේ ශ්‍රාවකරුවන් 'අල්ලාහ්ගේ දූතයාණනි, අල්ලාහ්ගේ මගෙහි ජිහාද් කිරී මට වඩාද?' යනුවෙන් විමසූහ. එයට එතුමා 'අල්ලාහ්ගේ මගෙහි ජිහාද් කිරීමට වඩාත් ප්‍රියතාවයකි. නමුත්, කව රෙක් තම ප්‍රාණය හා තම ධනය සමග පිටත්වී එයින් කිසිවක් හෝ නැවත නොගෙන පැමිණ අය හැර' යැයි පැවැසූ බව ඉබ්නු අබ්බාස් (රලි) වාර්තා කරන්නේය. **(ග්‍රන්ථ : අබූදාවූද් හා තිර්මිදි)**

▶▶'දුල් හජ් දින දහය පැමිණ, එහි ඔබලාගෙන් කවරෙක් හෝ කුර්බානී කැපීම් කිරීමට අදහස් කළේ නම්, ඔහු තම හිසකෙස් හා තම ශරීරයෙහි කිසිවක් හෝ ඉවත් නොකරන්න' යනුවෙන්ද, වෙනත් වාර්තාවක 'ඔහු තම නියපොතු හා හිසකෙස් ඉවත් නොකරන්න' යනුවෙන්ද නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව උම්මු සලමා (රලි) තුමිය වාර්තා කරන්නීය. **(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-මෙම දින දහයට විශේෂත්වයක් ඇත.
2-මෙම දිනවල කුසල් ක්‍රියාවන්හි අධිකව යෙදීම සතුටු දායක කරුණකි.
3-දුල්හජ් මස දින දහය පැමිණි විට කැපීම් කිරීමට අදහස් කරන්නා සිය නියපොතු සහ හිසකෙස් කිසිවක් ඉවක් කළ නොයුතුයි.

# 100-අල්ලාහ්ගේ මහිමය හා ඔහුගේ පාලනයේ විශාලත්වය

▶▶'මාගේ දාසයිනි, අපරාධ කිරීම මම මාහටම තහනම් කළෙමි. එය ඔබලා අතරද තහනම් කරුණක් ලෙස පත් කළෙමි. එහෙයින්, ඔබලාගෙන් කෙනෙක් අනෙකුට අපරාධ නොකරන්න. මාගේ දාසයිනි, මම කවරෙක් යහමගට යොමු කළේද ඔහු හැර ඔබලා සැම දෙනාම නොමගෙහි සිටින්නන්ය. එබැවින්, ඔබලා මගෙන් යහ මග අයදින්න. මම ඔබලාට යහමග පෙන්වන්නම්.

මාගේ දාසයිනි, මා කවරෙකුට ආහාර සැපයුයේද ඔහු හැර ඔබ සැම දෙනාම කුසගින්නෙන් සිටින්නන්ය. එබැවින්, ඔබලා මාගෙන් ආහාර අයදින්න. මම ඔබලාට ආහාර සපයන්නම්. මගේ දාසයිනි, කවරෙකුට මා ඇඳුම් ලබා දුන්නේද, ඔහු හැර ඔබ සැම දෙනාම නිරුවත්ව සිටින්නන්ය. එබැවින්, ඔබලා මගෙන් ඇඳුම් අයදින්න. මම ඔබලාට ඇඳුම් ලබා දෙන්නම්.

මාගේ දාසයිනි, ඔබලා රෑ හා දහවල් පාපයන්හි යෙදෙන් නෙහුය. මා සැම පාපයන් සඳහා සමාව ලබා දෙන්නේය. එබැවින්, ඔබලා මාගෙන් පව් සමාව අයදින්න. මම ඔබ ලාට පව් සමාව ලබා දෙන්නෙමි. මාගේ දාසයිනි, මාහට හානි කිරීමට ඔබලා කුමණ තරම් වෙහෙස දැරුවද, මා හට කිසිඳු හානියක් සිදුකිරීමට හෝ ඔබලාට නොහැක. එසේම, මාහට සෙතක් කිරීමට ඔබලා කුමණ තරම් වෙහෙස දැරුවද, මාහට කිසිඳු සෙතක් කිරීමට හෝ ඔබ ලාට නොහැක.

මාගේ දාසයිනි, ඔබලාට පෙර විසූ පෙරැන්නන්, පසුව වෙසෙන්නන්, ඔබලාගේ මිනිසුන් හා ජින් යන සැම දෙනා (මට කීකරුවීමෙහි) යහපත්ශීල පුද්ගලයෙකුගේ බැතිසිතකින් සිටියත් මගේ පාලනයෙහි කිසිඳු විස්තීර්ණ යක් හෝ නොසිදුවේ. එසේම ඔබලාට පෙර විසූ පෙරැන් නන්, පසුව වෙසෙන්නන්, ඔබලාගේ මිනිසුන් හා ජින් යන සැම දෙනා (මාහට විරුද්ධකම් කිරීමෙහි) නපුරු මිනිසෙකුගේ නපුරු සිතකින් සිටියත්, මාගේ පාලන යෙහි කිසිඳු ඌණතාවයක් හෝ නොසිදුවේ.

මාගේ දාසයිනි, ඔබලාට පෙර විසූ පෙරටුන්නත්, පසුව වෙසෙන්නත්, ඔබලාගේ මිනිසුන් හා ජින් යන සැම දෙනා පිට්ටනියක එක් රැස්ව සිටිමින් (ඔවුන්ට අවශ්‍ය දේ) මාගෙන් අයැදි සිට ඒ සැම දෙනාගේ ඉල්ලීම පිළි ගෙන මා ඔවුන්ට ලබා දුන්නද, ඉඳි කටුවක කොණක් මුහුදේ කිඳාබැස්මෙන් ඇතිවන ප්‍රමාණයක් හෝ මගෙන් නොඅඩුවේ. මගේ දාසයිනී මා ඔබලාගේ ක්‍රියාවන් අනුව ඔබලාව නිගමනය කරමි. පසුව මා ඔබලාට කුලිය ලබා දෙන්නේද ඒ අනුවය. එබැවින්, ඔබලාගෙන් කවරෙකු කුසල් ක්‍රියාවෙහි යෙදෙන්නේද, ඔහු අල්ලාහ්ට ප්‍රසංශා කරත්වා. ඔබලාගෙන් කවරෙකු එයට පටහැනි ක්‍රියා වෙහි යෙදෙන්නේද, ඔහු තමාහට හැර අන් කිසිවෙකුට හෝ දොස් නොකියත්වා' යනුවෙන් අල්ලාහ් පැවැසූ බව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කරන මෙම වදන අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය.

**(ග්‍රන්ථය : මුස්ලිම්)**

## ප්‍රයෝජන

1-අල්ලාහ්ගේ උතුම්භාවය හා ඔහුගේ පාලනයෙහි විශාලත් වය ගැන පැහැදිළිකර ඇත.

2-අල්ලාහ් ශක්තියෙහි සහ හැකියාවන්හි උතුම් වන්තයා බවද, ඔහු ඔහුගේ මැවිලි කෙරෙහි අවශ්‍ය වීමෙන් පරි පූර්ණ අනවශ්‍ය වන්තයා බවද පැහැදිළිකර ඇත.

අල්ලාහ් අප සැමට යහමග පෙන්වනු මැනවි.

وصلى الله على نبينا محمد وآله وصحبه وسلم،

والحمد لله رب العالمين.

# පටුන


1-කාලය ගැන සුපරීක්ෂාකාරී වීම ... 3
2-දාදු කැට පැළදීම ... 4
3-ජ්‍යොතිශ, ශාස්ත්‍රඥයන්. දෛවඥයින් කරා යාම ... 6
4-හූනියම් කිරීම ... 7
5-මැතිරීම ... 9
6-අල්ලාහ් හැර අන් දෙය කෙරෙහි දිවුරීම ... 11
7-නිමිති බැලීම ... 13
8-අල්ලාහ් කෙරෙහි කාර්ය පැවරීම ... 13
9-ප්‍රාර්ථනා පිළිගනු ලබන අවස්ථාවන් ... 15
10-ජමාඅත් සලාතය අනිවාර්ය වීම ... 17
11-ජමාඅත් සලාතයෙහි විශේෂත්වය ... 19
12-මස්ජිදයට පැමිණීමේ විධිය ... 20
13-සලාතයට පෙරාතුරුව ඒම හා රැඳී සිටීම ... 21
14-තහියියතුල් මස්ජිද් සලාතය ... 23
15-ප්‍රථම පේළියෙහි විශේෂත්වය ... 24
16-පේළි පිළියෙළ කිරීම ... 25
17-ෆජ්රය සාමූහිකව ඉටු කිරීම ... 27
18-අස්ර් සලාතයෙහි විශේෂත්වය ... 29
19-රාත්‍රී නැමදුම (1) ... 31
20-රාත්‍රී නැමදුම (2) ... 33
21-කාලීන සලාතයෙහි සමහර නීතිරීතීන් ... 35
22-ජුම්ආ දිනයෙහි විශේෂත්වය ... 37
23-ජුම්ආවට කල්වේලා ඇතිව යාම ... 38
24-ජුම්ආවෙහි සුන්නත් හා පිළිවෙත් ... 40
25-අවුරුදු සලාතය (1) ... 41
26-අවුරුදු සලාතය (2) ... 43
27-අවුරුදු සලාතය (3) ... 44
28-කුර්බානි දීම ... 45
29-ග්‍රහණ සලාතය ... 47
30-වැස්ස අපේක්ෂා කිරීම ... 49
31-වැස්ස අපේක්ෂිත සලාතය ... 50
32-වැස්ස හා සම්බන්ධ සමහර නීතිරීතීන් ... 54

33-ඉස්තිකාරා සලාහය..................... 55
34-අනාථයන් රැක බලා ගැනීම..................... 58
35-අනාථයන්ගේ ධනය අනුභව කිරීම..................... 59
36-ප්‍රිය කරන්නා ඔහු සමගම සිටී..................... 60
37-ජායා රූප හා සම්බන්ධ නීතිරීතීන්..................... 61
38-සිහිනයෙහි විශේෂත්වය..................... 63
39-සිහිනයෙහි සාරධර්ම..................... 64
40-සංග්‍රහ ඇරයුම පිළිගැනීම..................... 66
41-අවසර පැතීම..................... 67
42-සාතාන් කෝළාහළ කිරීම්..................... 69
43-වංචා කිරීම..................... 70
44-රැවටීම..................... 72
45-කෝපවීම..................... 73
46-මිනී පිට්ටනි කරා යෑම..................... 74
47-මත්පැන් පානය කිරීම..................... 76
48-නිශ්චල තර්ක විතර්කවල යෙදීම..................... 78
49-ගස් සිටුවීම හා වගා කිරීම..................... 80
50-වෙළඳාමෙහි නීතිරීතීන්..................... 81
51-අධිකව සිනාසීම..................... 83
52-බොරුවට දිවුරීම..................... 84
53-බොරු සාක්ෂිය..................... 86
54-ශාප කිරීම..................... 87
55-කවි..................... 88
56-තහනම් වචන..................... 89
57-ජිහාද් කිරීමෙහි විශේෂත්වය..................... 91
58-ජිහාද් කරන්නා හා දිවි පුදන්නාගේ කුලිය..................... 93
59-ජිහාදයෙහි නබිතුමාගේ ගුවකරුවන්..................... 95
60-මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම..................... 98
61-සුන්නා හා බිද්ආ..................... 100
62-සලවාත් කීමෙහි විශේෂත්වය..................... 103
63-ණයකරුට අවකාශ ලබා දීම..................... 105
64-පොළිය පිළිබඳ අවවාදය..................... 106
65-අල්කුර්ආනයෙහි විශේෂත්වය..................... 109
66-සූරා බකරා හා ආලඉම්රාන්හි විශේෂත්වය..................... 110

67-අල්ලාහ්ගේ මගෙහි වියදම් කිරීම.......................... 111
68-දානය කිරීමෙහි විශේෂත්වය (1).......................... 113
69-දානය කිරීමෙහි විශේෂත්වය (2).......................... 115
70-විශේෂ දානය.......................... 116
71-රහස්ගතව දානය කිරීම.......................... 118
72-ප්‍රසිද්ධව දානය කිරීම.......................... 119
73-සිඟමන් කර හා නොකර ලබා ගැනීම.......................... 121
74-සමහර තහනම් කියමන්.......................... 122
75-මරණය සිහි කිරීම හා එයට අඟා නොවීම.......................... 123
76-මරණාසන්න මොහොත .......................... 124
77-ක්‍රියාවන් එකී නිමාව අනුව තීන්දු කිරීම.......................... 125
78-ජනාසා සලාතය (1).......................... 126
79-ජනාසා සලාතය (2).......................... 128
80-ජනාසා සලාතය (3).......................... 130
81-ජනාසාවට සහභාගිවීම.......................... 131
82-ජනාසාවෙහි සමහර නීතිරීතීන්.......................... 133
83-ජනාසාව භූමිදානය කිරීම.......................... 134
84-මිනීවළ සමතලා කිරීම.......................... 136
85-මිනීවළෙහි සිදුවීම්.......................... 137
86-ඉවසීමට දිරිගැන්වීම.......................... 139
87-අවසාන කැමැත්ත ප්‍රකාශ කිරීම.......................... 140
88-හිමිකම් පිළිබඳ නීතිරීතීන්.......................... 142
89-නැසිගිය අය වෙනුවෙන් ඇඬීම.......................... 143
90-දරුවන්ගේ මරණය සම්බන්ධව ඉවසීම.......................... 145
91-මස්ජිදුල් හරාම් හා මස්ජිදුන් නබවි.......................... 146
92-මක්කා පිළිබඳ නීතිරීතීන්.......................... 148
93-විවාහය සඳහා දියණිය බල කිරීම.......................... 149
94-සමාජ සමගිය.......................... 150
95-විශ්වාසය රැක ගැනීම.......................... 152
96-අල්ලාහ් දෙස කැඳවීමේ විශේෂත්වය.......................... 154
97-සීමාව ඉක්මවා ප්‍රසංශා කිරීම.......................... 156
98-වාදනය කිරීම.......................... 157
99-දුල්හජ් දින දහයේ විශේෂත්වය.......................... 158
100-අල්ලාහ්ගේ මහිමය හා පාලනයේ විශාලත්වය.......................... 159